# 10 ශ්‍රේණිය

# සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය

## ගුරු මාර්ගෝපදේශය

(2015 වසරේ සිට ක්‍රියාත්මක වේ.)



විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව

**ජාතික අධ්‍යාපන ආයතනය**

මහරගම, ශ්‍රී ලංකාව

**Web**| www.nie.lk **Email**| info@nie.lk

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

(2015 සිට ක්‍රියාත්මක වේ.)


විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

10 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

පළමුවන මුද්‍රණය 2015

ජාතික අධ්‍යාපන ආයතනය

ISBN ....................

©
විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව
විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ගුරු භවතාට තම පාසල තුළ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූලික දෑ සැපයේ. විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් තම කාර්යයන්, දරුවාගේ බුද්ධි වර්ධනය කෙරෙහි මෙන් ම, චර්යාත්මක දියුණුව කෙරෙහි ද දිගු කාලීන බලපෑමක් ඇති කරවන බව නිරන්තරයෙන් ම සිහි තබා ගත යුතු වේ.

ප්‍රජානන සාධන මානය සම්බන්ධයෙන්, අනෙක් කරුණු අතරට, ඉගෙනීම ඉහළ මට්ටමකට ගෙන යෑමට පහත සඳහන් කරුණු කෙරෙහි ද ගුරුවරුන් සැලකිලිමත් විය යුතු වේ.

- ශිෂ්‍යයා තම ජීවිත අරමුණු පිළිබඳ අවදියෙන් සිටීම සහ කළ යුතු කාර්යය, හැකියාවන්ට සහ අරමුණු සාධනයට අදාළ වීම.

- ශිෂ්‍යයා ක්‍රියාකාරී ව ඉගෙනුම් කාර්යාවලියෙහි නිරත වීම. (ඉගෙනීම සිසු කේන්ද්‍රීය ක්‍රියාවලියක් වීම.) කන්ෆියුසියස්ගේ කියමන සිහියට නගා ගන්න; ඇසෙන දේ අමතක වේ. දකින දේ අමතක නොවේ. කළ දේ ඉගෙන ගැනේ.

- ඉගෙනුම් වාතාවරණය, ධනාත්මක ව, අභියෝගාත්මක වී, ඉගෙනුම් මෙවලම්, උපකරණ, විද්‍යාගාර, විවිධ සම්පත් ආකාරවලට පිවිසුම පහසු වීම.

- ශිෂ්‍යයාට ක්ෂණික ධනාත්මක සහ නිර්මාණාත්මක ප්‍රතිචාරයක් ලබා දීම මගින්, ඉගෙනුම ක්‍රමානුකූල ව ඉහළ මට්ටමක අවශෝෂණයකින්, ශිෂ්‍යයාගේ දැනුම, කුසලතා සහ අරමුණු සමග අනුකලනයකට අවකාශ ඇති කිරීම.

අධ්‍යාපනයේ දී, රජයේ අපේක්ෂාව වනුයේ සියලු පාසල්වල සියලු දරුවන්ට, මූලික විෂය කරුණු අවශ්‍ය මට්ටමකට ග්‍රහණය කිරීමෙන්, විභාගයට මුහුණ දීමෙන් පසු ව සාර්ථකත්වයේ සතුට විඳ ගැනීමේ හැකියාව ලබාදීම ය.

දරුවාගේ චර්යාත්මක වර්ධනයට අදාළ මානය සලකා බැලූ විට අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ප්‍රජානන හැකියාවන් වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීම යි. එබැවින් ගුරුවරුන් තමතින් විෂය නිර්දේශ ලබා දීමේ දී වර්ධනය කළ යුතු වන්නේ, පාසලින් බැහැර ලෝකය සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යයාට අවශ්‍ය වන, දක්ෂතා සහ කුසලතා ය. එයින් සමහර වැදගත් ගණයේ හැකියාවන් පහත සඳහන් ක්ෂේත්‍රයන්හි වේ.

- කාර්යශීලී වැඩ ආචාර ධර්ම - සාධනීය ආකල්ප සහ නව නිර්මාණයට, සංරක්ෂණයට ඇති ළැදියාව

- අන්තර් පුද්ගල සම්බන්ධතා - කණ්ඩායම් වැඩ, විනය සහ කාර්යක්ෂම සන්නිවේදනය

- සදාචාරාත්මක හැසිරීම් - විවිධත්වයට ගරු කිරීම වැනි පුරවැසි වටිනාකම්වලින් හෙබි, ඍජු පුද්ගලයෙක්

අවසාන වශයෙන් මම සියලු විදුහල්පතිවරුන්ටත්, ගුරු භවතුන්ටත්, පාසල්වල අනෙක් කාර්ය මණ්ඩල සභිකයන්ටත්, ඉතා ඕනෑකමින් ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය දෙස කළමනාකරණයේ A 4 (Attitude, Analysis, Action, Accountability) වශයෙන් හඳුන්වන පහත සඳහන් කරුණු මගින් තම සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලීමට කැමැත්තෙමි. එනම්, ආකල්පය, විශ්ලේෂණය, ක්‍රියාව සහ වගවීම යි. ඔබ නියුක්ත වන කාර්යයෙහි (පාඩම අදී වශයෙන්) අවසානයත්, මාර්ගයත් පිළිබඳ අදාළ සාධනීය ආකල්පයන්ගෙන් ආරම්භ කරන්න. එය සංවිධානය කර ගැනීම උදෙසා (වරු ඒකක ආදී වශයෙන්) තොරතුරු සොයා බලා ලබාගෙන ඒවා විශ්ලේෂණය කරන්න. විකල්ප සලකා බලා ක්ෂණික ක්‍රියා (ප්‍රකාශ කිරීම, බාරදීම) කාර්යක්ෂම ව ගන්න. ඔබ ප්‍රතිඵල අධීක්ෂණය, ඇගයීම සහ මිණුම සම්බන්ධයෙන් (අයිතිය) වගකීම බාර ගන්න.

මේ හා සම්බන්ධ සියලු ගුරු භවතුන්ට, ඉගැන්වීමේ දීත් ඉගෙනීමේ දීත් සතුට අත්වේවා යයි ප්‍රාර්ථනා කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. අවශ්‍ය වුවහොත් මට ද පිටපතක් සහිත ව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මෙම ගුරු මාර්ගෝපදේශය පිළිබඳ ඔබේ අත්දැකීම් සහ නිරීක්ෂණ ලියා දන්වා එවීමට නොපසුබට වන්න.

මහාචාර්ය ගුණපාල නානායක්කාර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මිනිසා විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට යොමු වූයේ අනාදිමත් කලක සිට ය. අධ්‍යාපන පරමාර්ථ, ඉගෙනුම් ක්‍රමශිල්ප පිළිබඳ එදා මෙදා තුර විවිධ ප්‍රවේශ ඔස්සේ කර ඇති අනාවරණ ද අතිමහත් ය. කෙසේ වුව ද අධ්‍යාපනයේ පොදු අපේක්ෂාව පූර්ණ පෞරුෂයකින් හෙබි පුද්ගලයකු තැනීමයි. මේ සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, සමාජමය දක්ෂතාවන්ගෙන් පිරිපුන් සිය විභව ශක්ති මතු කරගත් පුද්ගලයකු නිර්මාණයට උචිත අධ්‍යාපන පුරෝගාමී මෙහෙවර ඉටු කිරීමට අප ආයතනය දායක වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත ගුරුවරුන් අධ්‍යාපන අරමුණු, ඉගෙනුම් ක්‍රියාවලිය, ඇගයීම යන අවස්ථා ත්‍රිත්වය කෙරෙහි ම එක සේ අවධානය යොමු කළ යුතු ය. ඒ සඳහා අවශ්‍ය මගපෙන්වීම මෙම ගුරු මාර්ගෝපදේශයෙන් සැපයේ. එය ආදර්ශයට ගෙන ඔබට අනන්‍ය සාර්ථක ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීමට ඔබට හැකියාව ඇත.

ශිෂ්‍ය සංවර්ධනය, ගුරු සංවර්ධනය, පද්ධතියට නව දැනුම සම්පාදනය ආදී විවිධ අපේක්ෂණ පෙරදැරි ව ගුරුවරයා පර්යේෂණ කාර්යයට යොමු වීම ද අත්‍යවශ්‍ය වේ. සෑම සාර්ථක ගුරුවරයෙක් ම සාර්ථක පර්යේෂකයෙක් ද වේ. ඔබ දැනටමත් සිදුකරනු ලබන පර්යේෂණ කාර්යය වඩාත් විධිමත් ව සිදු කිරීමට යොමු  වීම කාලීන අවශ්‍යතාවකි. එහි දී අවශ්‍ය මගපෙන්වීම් සඳහා අපගේ දායකත්වය ද ලබාගත හැකි ය.

ගුරුවරයා සෘෂිවරයෙකි. සිසුවා පිළිබඳ තුන්කල් දැක්මක් ගුරුවරයා සතු වේ. ගුරුවරයා විටෙක පෙරගමන්කරුවෙකි. විටෙක පසුගමන්කරුවෙක් වන අතර තවත් විටෙක එක් ව පිය නගන්නෙකි. මේ මනා වැටහීමෙන් හා ආකල්පමය ගුණ වගාවෙන් යුතු ව කටයුතු කරන නිපුණ ගුරුවරයෙකු ලෙස; සිසු විවිධතා සැලකිල්ලට ගෙන සිසු නිපුණතා සංවර්ධනයට අවශ්‍ය උසස් ඉගෙනුම් ක්‍රමශිල්ප භාවිතයට ගනු ලබන, වගකීමෙන් හා වගවීමෙන් කටයුතු කරන ගුරුවරයෙකු වීමට ඔබට තව තවත් ශක්තිය ලැබේවා !

බී. සනත් පූජිත
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(පර්යේෂණ හා සැලසුම් පීඨය)

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය :**

ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය:**

ඒ. නීලමණී මෙනවිය (MPhil), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය විශේෂඥ උපදෙස් :**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ මයා (PhD), ජන සන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
ආචාර්ය උදිත ගයාශාන් ගුණසේකර මයා (PhD), ප්‍රසංග කලා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
සේනානි හරිශ්චන්ද්‍ර මයා (MCMS), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**ලේඛක මණ්ඩලය :**

ඒ. නීලමණී මෙනවිය (MPhil), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
නයනා දීප්ති ගුණරත්න මෙනවිය (MA), සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 07
අරෝෂා මලලසේකර මෙනවිය (BA, PGDE), ගුරු සේවය - 2 II,
විහාර මහාදේවී බා.වි, කිරිබත්ගොඩ
ඉන්දික අමරසිංහ මයා (BA, PGDE), ගුරු සේවය - 2 II, මාර/ කෝන්ගල ම.ම.වි., හක්මන
චන්ද්‍රිකා සුරවීර මිය (MA, PGDE), ගුරු සේවය - 2 II,
බප/ජය/ සමුද්‍රදේවී බා.වි., නුගේගොඩ
එම්.ඒ. තිළිණි උත්පලා සේනාරත්න මිය (BA, PGDE), ගු.සේ.,
බප/ජය/ විද්‍යාකර බා.වි., මහරගම
එස්.ටී. සිරිබ්රෙයින්ද්‍රන් මයා (MA), ගුරු සේවය - 3, කළු/ ජීලන් ම.වි., පානදුර

**භාෂා සංස්කරණය :**

ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

10 ශ්‍රේණිය සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය නිර්දේශය පදනම් කර ගනිමින් විෂයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් ලබා දීම සඳහාත් ඇගයීම හා තක්සේරුකරණය සැලසුම් කර ගැනීම සඳහාත් අවශ්‍ය මූලික මගපෙන්වීම් මෙහි ඉදිරිපත් කර ඇත.

මෙහි සඳහන් මාර්ගෝපදේශ විනාඩි හතලිහක එක් ඉගෙනුම් කාලච්ඡේදයක් ඉලක්ක කර ලබා දෙන ලද පාඩම් සැලසුම් නො වන බව අවධාරණය කළ යුතු ව ඇත.

විෂය නිර්දේශයේ එන ඉගෙනුම් නිපුණතා සලකා විෂය අන්තර්ගතය යටතේ සැලසුම් කළ යුතු ඉගෙනුම් කාර්ය අවස්ථා කීපයක් එක් ඒකකයකට ගොනු කර ඇත.

ගුරුවරයා ශිෂ්‍යයන්ගේ හැකියා මට්ටම, ප්‍රාදේශීය විෂමතා, පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය කෙරෙහි ඇති වන විවිධ බලපෑම් සැලකිල්ලට ගනිමින් ලබා දී ඇති පාඩම් ඒකක ඇසුරින් පාඩම් සැලසුම් කර ගැනීම සිදු කළ යුතු වේ. විශේෂයෙන් ගුරුවරුන්ගේ නිර්මාණාත්මක කුසලතා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමශිල්ප භාවිතයට ඇති විශේෂ කුසලතා භාවිතයට ගනිමින් පාඩම් සැලසුම් සකස් කර ගනු ඇතැයි අපේක්ෂා කරමු. මෙහි දී වඩාත් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සිදු කිරීම අපේක්ෂා කෙරේ.

ශිෂ්‍ය හැකියා මට්ටම සැලකිල්ලට ගැනීම හෝ වඩාත් සක්‍රීයව ප්‍රායෝගික ඉගෙනුම් අත්දැකීම් ලබා දීම අවශ්‍ය පාඩම් සඳහා කාලච්ඡේදයක ඉගෙනුමට සීමා නොවී උචිත අනුමැතිය ලබා ගනිමින් වඩා ප්‍රායෝගික ඉගෙනුම් අවස්ථා සංවිධානය කර ගැනීමට ද ඔබට හැකියාව ඇත.

ලේඛක මණ්ඩලය

# පටුන


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | v |
| විෂයමාලා කමිටුව | vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශය අන්තර්ගතය | ix-xxxv |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-76 |

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## විෂය නිර්දේශය

## 10 ශ්‍රේණිය

**(2015 සිට ක්‍රියාත්මක වේ)**

විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
**www.nie.lk**

# හැඳින්වීම

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය සීඝ්‍රයෙන් වෙනස් වන සුළු වූත්, ලෝකය හා වඩා සමීප සබඳතා පවත්වන්නා වූත් ප්‍රායෝගික මෙන් ම ගතික විෂය ධාරාවක් වේ. විෂය නිර්දේශ අන්තර්ගතයෙහි සන්නිවේදනය හා මාධ්‍ය පිළිබඳ ශාස්ත්‍රීය දැනුවත් භාවයට අදාළ නිපුණතා මට්ටම මෙන්ම සිසුන්ගේ පෞද්ගලික මෙන් ම සමාජීය ජීවිතය හැඩගැස්මට අවශ්‍ය ප්‍රායෝගික සන්නවේදන හා මාධ්‍ය නිපුණතා සංවර්ධනයට උචිත විෂය කොටස් ද ඇතුළත් කර ඇත.

2015 වසර සිට ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම විෂය නිර්දේශයෙහි නිපුණතා හයක් යටතේ නිපුණතා මට්ටම් අනුව විෂය අන්තර්ගතය ගොඩනගා තිබේ. එහි දී ඒ ඒ නිපුණතා, නිපුණතා මට්ටම් යටතේ විෂය අන්තර්ගතයට අදාළ ව විවිධ නිපුණතා සංවර්ධනයේ දී ඉටුවෙතැයි අපේක්ෂිත මූලික ඉගෙනුම් පල හඳුන්වා දීමක් ද සිදුකර ඇත. විවිධ නිපුණතා සංවර්ධනයේ දී විෂය අන්තර්ගතයට අදාළ ව තවත් ඉගෙනුම් පල අත්පත් කර ගැනීමට හැකි වනු ඇත.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබිණ. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය මඟින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතිය ගොඩ නැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යෑමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදී ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය: පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම



(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මල පහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා
ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ළැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් මඟින ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා
ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව 2003)

# විෂය අරමුණු

1. සන්නිවේදනයේ න්‍යායික හා මූලධර්මමය පදනම අවබෝධ කර ගැනීම.
2. තත්කාලීන මාධ්‍ය පරිසරය අවබෝධ කර ගැනීම හා විග්‍රහ කිරීම.
3. සන්නිවේදන හා මාධ්‍ය පරිසරයේ අවශ්‍යතා සඳහා ස්වකීය නිර්මාණාත්මක හැකියාවන් භාවිත කිරීමේ ක්‍රමවේද අත්හදා බැලීම.
4. ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු හා විචාරශීලී ග්‍රාහකයෙකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා සංවර්ධනය කර ගැනීම.
5. අනාගත වෘත්තීය අවකාශ සඳහා ස්වකීය සන්නිවේදන නිපුණතා සංවර්ධනය කර ගැනීම පිළිබඳ ව අවධානයකින් යුතු ව කටයුතු කිරීම.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 විවිධ ආකාරයේ සන්නිවේදන වර්ග සංසන්දනාත්මක ව හඳුනා ගනිමින් ඒවා තම ජීවිතයේ අවස්ථානුකූල ව යොදා ගනියි. | 1.1 සන්නිවේදන ක්‍රියාවලියේ ස්වභාවය සරල අර්ථකථන හා මාදිලියක් ඇසුරින් විස්තර කරයි. | **1.0 සන්නිවේදන වර්ගීකරණය**<br><br>**1.1 සන්නිවේදනය හැඳින්වීම**<br>1. සන්නිවේදනය පිළිබඳ ලැස්වෙල් නිර්වචනය හා මූලිකාංග<br>2. ෂැනන් හා වීවර්ගේ සන්නිවේදන ආකෘතිය (1949)<br>3. සන්නිවේදනයේ මූලික කාර්යයන්<br>4. සංජානනය, සන්නිවේදන බාධක හා දොරටුපාල සංකල්පය | 1. සන්නිවේදනය යන්න විවිධ අර්ථකථන ඔස්සේ විග්‍රහ කරයි.<br>2. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග හඳුන්වා දෙයි.<br>3. සන්නිවේදන ක්‍රියාවලිය ද්විමාර්ගික ක්‍රියාවලියක් බව හේතු සහිත ව පෙන්වා දෙයි.<br>4. සන්නිවේදනයේ මූලික කාර්යයන් විස්තර කරයි.<br>5. සන්නිවේදන ක්‍රියාවලියක් සාර්ථක ව සිදු කිරීම සඳහා සැලකිල්ලට ගත යුතු ක්‍රියාමාර්ග පෙන්වා දෙයි.<br>6. සන්නිවේදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් දොරටුපාල සංකල්පය ක්‍රියාත්මක වන ආකාරය හඳුන්වයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
|  | 1.2 තමාගේ ම සිතුවිලිවල හැසිරීම සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධ වන ආකාරය පිළිබඳ ව විග්‍රහ කරයි. | **1.2 අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය**<br>1. පුද්ගලයාගේ මනෝ භාව හා ප්‍රතික්‍රියා<br>2. උත්තේජන ප්‍රතිචාර ස්වභාව<br>3. සිතුවිලි හසුරුවා ගැනීම<br>4. සන්නිවේදන ක්‍රියාවලියේ ආරම්භය | 1. පුද්ගලයා තුළ අන්තර්වර්තී සන්නිවේදන ක්‍රියාදාමය සිදු වන ආකාරය පිළිබඳ ජීව විද්‍යාත්මක තොරතුරු විශ්ලේෂණය කරයි.<br>2. අන්තර්වර්තී සන්නිවේදන ක්‍රියාදාමය යහපත් ව සිදු වීමේ අගය පහදයි.<br>3. පුද්ගල චර්යා පාලනයට අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය හේතු වන ආකාරය සාකච්ඡා කරයි.<br>4. සන්නිවේදන ක්‍රියාදාමයන්හි ආරම්භක අවස්ථාව ලෙස අන්තර්වර්තී පුද්ගල සන්නිවේදන ක්‍රියාදාමයේ වැදගත්කම සාකච්ඡා කරයි.<br>5. සාර්ථක ජීවිතයක් සඳහා අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය මැනවින් මෙහෙයවා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග සොයා බලයි.<br>6. අන්තර්වර්තී සන්නිවේදනය සිදු වන විවිධ අවස්ථා පෙන්වා දෙයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 වාචික හා අවාචික ක්‍රම උපයෝගි කර ගනිමින්, අන්තර් පුද්ගල සන්නිවේදනයේ නිපුණතා ප්‍රදර්ශනය කරයි. | 1.3 **අන්තර්පුද්ගල සන්නිවේදනය**<br>1. දෙදෙනකු හෝ කිහිප දෙනකු අතර සිදු වන බව<br>2. සමාජීය පැවැත්මේ අත්‍යවශ්‍ය අංගයක් බව<br>3. අන්තර් පුද්ගල සන්නිවේදනයේ විශේෂතා<br>4. අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා තාක්ෂණික මෙවලම්<br>5. ද්විපුද්ගල සන්නිවේදනය | 1. අන්තර් පුද්ගල සන්නිවේදනය යන්න නිවැරදි ව හඳුන්වා දෙයි.<br>2. අන්තර් පුද්ගල සන්නිවේදනයේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>3. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රබලත්වය අගය කරයි.<br>4. අන්තර් පුද්ගල සන්නිවේදනය සාර්ථක ව සිදුකිරීම සඳහා භාවිතයට ගැනෙන විවිධ උපාය මාර්ග අත්හදා බලයි.<br>5. අන්තර් පුද්ගල සන්නිවේදනය සමාජ පැවැත්ම තහවුරු කිරීමට ඉවහල් වන ආකාරය විස්තර කරයි.<br>6. අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා භාවිතයට ගැනෙන තාක්ෂණික මෙවලම් නිවැරදි ලෙස භාවිතයෙන් සන්නිවේදනය සිදු කරයි.<br>7. ජාතික ඒකාබද්ධතාව තහවුරු කෙරෙන සේ අන්තර් පුද්ගල සන්නිවේදනයේ යෙදීමේ අගය පෙන්වා දෙයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.4 වාචික ව හා තාක්ෂණික මෙවලම් ඇති ව හෝ නැති ව හෝ පුද්ගල සමූහයක් සමග සන්නිවේදන නිපුණතා ප්‍රදර්ශනය කරයි. | **1.4 සමූහ සන්නිවේදනය**<br>1. සමූහ සන්නිවේදනයේ ස්වභාවය<br>2. සමූහය හා කථිකයා අතර සම්බන්ධය<br>3. තාක්ෂණික මෙවලම් භාවිතය<br>4. සමූහ සන්නිවේදනයේ විශේෂතා | 1. සමූහ සන්නිවේදනය යන්න නිවැරදි ව අර්ථ දක්වයි.<br>2. සමූහ සන්නිවේදනය සිදු වන ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>3. සමූහ සන්නිවේදනය සිදු වන විවිධ අවස්ථාවන්හි සන්නිවේදන ක්‍රියාදාමය ක්‍රියාත්මක වන ආකාරය විශ්ලේෂණය කරයි.<br>4. සමූහ සන්නිවේදනය සාර්ථක ව සිදු කිරීමට අවශ්‍ය සාධක මොනවා දැයි විග්‍රහ කරයි.<br>5. සාර්ථක ලෙස සමූහ සන්නිවේදනයේ නියැළීමේ උපාය මාර්ග භාවිත කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>6. සමූහ සන්නිවේදනයේ විශේෂතා හඳුන්වා දෙයි.<br>7. සමූහ සන්නිවේදන අවස්ථාව අනුව සන්නිවේදන භූමිකාව වෙනස් වන ආකාරය ප්‍රදර්ශනය කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.5 තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵලයක් වශයෙන් ජන සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය හා එය සමාජගත වී ඇති ආකාරය පිළිබඳ ව විග්‍රහ කරයි. | **1.5 ජන සන්නිවේදනය**<br>1. ජන සන්නිවේදනයේ ස්වභාවය<br>2. ජන සන්නිවේදනය හා ජන මාධ්‍ය අතර සම්බන්ධය<br>3. ජන සන්නිවේදනයේ සමාජීය අවශ්‍යතාව හා බලපෑම<br>4. අභිසාරිත මාධ්‍ය (Convengent Media) | 1. ජන සන්නිවේදනය යනු කුමක් දැයි හඳුන්වා දෙයි.<br>2. සන්නිවේදනය සඳහා ජන සන්නිවේදනයේ වැදගත්කම අගය කරයි.<br>3. ජන සන්නිවේදන මාධ්‍යයන්හි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>4. ජන සන්නිවේදන අරමුණු පැහැදිලි කරයි.<br>5. ජන සන්නිවේදනය සඳහා යොදා ගනු ලබන මාධ්‍ය ආකෘති ප්‍රදර්ශනය කරයි.<br>6. ජන මාධ්‍යවල ප්‍රබලතා හා සීමා පිළිබඳ තොරතුරු හෙළි කරයි.<br>7. ජන මාධ්‍ය භාවිතයේ වැදගත්කම අගය කරමින් අදහස් දක්වයි.<br>8. නව මාධ්‍ය මගින් මාධ්‍ය ඒකරාශී වී ඇති ආකාරය පිළිබඳ ඇගයීමක යෙදෙයි. | 3 |
| | | | | **15** |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **2.0 සන්නිවේදනයේ විවිධ ස්වරූප අදාළ පරිදි යොදා ගෙන ඵලදායී සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.** | 2.1 වාචික හා අවාචික සන්නිවේදනය ප්‍රායෝගික ව එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවන්ට යොදා ගත හැකි ආකාරය ප්‍රදර්ශනය කරයි. | **2.0 සන්නිවේදන ස්වරූප**<br><br>**2.1 වාචික හා අවාචික සන්නිවේදනය**<br>1. වාචික හා අවාචික සන්නිවේදනයේ ස්වභාවය<br>2. වාචික සන්නිවේදනයේ භාෂා කුසලතා (උච්චාරණය, අර්ථ ගැන්වීම හා යෝග්‍යතාව)<br>3. අවාචික සන්නිවේදනයේ සාධක (ශාරීරික, පාරිසරික හා සමාජීය සාධක)<br>4. වාචික හා අවාචික සන්නිවේදන නිපුණතා | 1. වාචික සන්නිවේදනයේ හා අවාචික සන්නිවේදනයේ ස්වභාවය සංසන්දනාත්මක ව හඳුන්වයි.<br>2. අවාචික සන්නිවේදනය සඳහා අතීතයේ සිට මේ දක්වා භාවිතයට ගනු ලබන විවිධ ක්‍රමෝපා විශ්ලේෂණය කර දක්වයි.<br>3. අවාචික සන්නිවේදනය ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් ලෙස අගය කරයි.<br>4. අවාචික සන්නිවේදන සාධක පිළිබඳ විස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කරයි.<br>5. වාචික සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා භාවිත වන විවිධ ක්‍රමෝපා විග්‍රහ කරයි.<br>6. සාර්ථක සන්නිවේදකයකු ලෙස සංවර්ධනය කර ගත යුතු වාචික හා අවාචික සන්නිවේදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 නිවැරදි හා ඵලදායී භාෂා භාවිතය පිළිබඳ පරිචය සංවර්ධනය කර ගනිමින් ඵලදායී ලිඛිත සන්නිවේදනයේ යෙදේ. | **2.2 ලිඛිත සන්නිවේදනය**<br>1. භාෂාව හා ලේඛනය<br>2. ඵලදායී ලේඛනයක ලක්ෂණ<br>3. ලේඛන නිපුණතා (කාර්යාලයීය හා නිර්මාණාත්මක) | 1. මිනිසා ලේඛනයට යොමු වූ ආකාරය සංක්ෂිප්ත ව ඉදිරිපත් කරයි.<br>2. භාෂාවේ ද්විරූපතාව නිදසුන් ආශ්‍රිත ව පැහැදිලි කරයි.<br>3. වාචික භාෂාව හා ලිඛිත භාෂාව අතර පවත්නා සමාන-අසමානතා සංසන්දනය කරයි.<br>4. ඵලදායී ලේඛනයක ලක්ෂණ රූප රාමු ඇසුරෙන් පහදයි.<br>5. විවිධ ආකාරයේ නිර්මාණාත්මක ලේඛන සකසා ප්‍රදර්ශනය කරයි.<br>6. එදිනෙදා ජීවිතයට අවශ්‍ය මූලික ලේඛන වාර්තා නිවැරදි ව සැකසීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි | 3 |
| | 2.3 ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදන මාධ්‍ය ස්වභාවයන් හා එහි ප්‍රභේද හඳුනා ගනිමින්, ඒවා ඵලදායී ලෙස භාවිත කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | **2.3 ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය**<br>1. ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනයන්හි ස්වභාවය<br>2. ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍ය ප්‍රභේද<br>3. ශ්‍රව්‍ය මාධ්‍ය හා දෘශ්‍ය මාධ්‍ය නිපුණතා | 1. ශ්‍රව්‍ය සන්නිවේදනය හා දෘශ්‍ය සන්නිවේදනය යන්න හඳුන්වයි.<br>2. අතීතයේ සිට මේ දක්වා භාවිත වන කැපී පෙනෙන ශ්‍රව්‍ය සන්නිවේදන ක්‍රම හා දෘශ්‍ය සන්නිවේදන ක්‍රම ලැයිස්තු ගත කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | 3. ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදන උපාය මාර්ග යොදා ගැනීමේ අගය පෙන්වා දෙයි.<br>4. ශ්‍රව්‍ය මාධ්‍ය, දෘශ්‍ය මාධ්‍ය සන්නිවේදන ප්‍රභේද සංස්කෘතික අවශ්‍යතා අනුව භාවිත වන ආකාරය ගවේෂණය කරයි.<br>5. සන්නිවේදන කාර්ය සඳහා ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදන ක්‍රම උචිත පරිදි භාවිත කරයි. | |
| | 2.4 සංවිධානයක පැවැත්මට විධිමත් හා අවිධිමත් සන්නිවේදනය ඵලදායී ව යොදා ගත හැකි ආකාරය විග්‍රහ කරයි. | **2.4 විධිමත් හා අවිධිමත් සන්නිවේදනය**<br>1. සංවිධානයක් තුළ විධිමත් හා අවිධිමත් සන්නිවේදනයේ වැදගත්කම, ස්වභාවය සම්බන්ධය හා ක්‍රියාකාරිත්වය<br>2. විධිමත් හා අවිධිමත් සන්නිවේදන ආකෘති<br>3. විධිමත් හා අවිධිමත් සන්නිවේදන නිපුණතා | 1. විධිමත් සන්නිවේදනය හා අවිධිමත් සන්නිවේදනය අතර වෙනස පහදයි.<br>2. විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වීමේ වැදගත්කම පෙන්වා දෙයි.<br>3. විධිමත් සන්නිවේදනය සඳහා භාවිතයට ගැනෙන සන්නිවේදන මූලධර්ම පැහැදිලි කරයි.<br>4. සන්නිවේදන ක්‍රමශිල්පයක් ලෙස අවිධිමත් සන්නිවේදනය අගය කරයි.<br>5. අවිධිමත් සන්නිවේදනය සිදු වන ආකාරය ආකෘති ඇසුරින් විස්තර කරයි. | 3<br><br>12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ දී කාර්යාලයේ දී, තොරතුරු හුවමාරු කිරීමේ දී හා පන්ති කාමරයේ දී යොදා ගන්නා මාධ්‍ය උපකරණ විධිමත් ව පරිහරණය කරයි. | 3.1 පරිගණකය යොදා ගෙන වාර්තාවක් නිම කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | **3.0 කාර්යබද්ධ මාධ්‍ය තාක්ෂණික නිපුණතා**<br><br>**3.1 පරිගණක ආශ්‍රිත ප්‍රකාශන උපකරණ**<br>1. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය හා එහි අවශ්‍යතාව<br>2. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන උපකරණ හඳුනා ගැනීම<br>3. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන උපකරණ භාවිතය | 1. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය හඳුනා ගනී.<br>2. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන යන්ත්‍ර භාවිතයේ අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>3. වර්තමානයේ දී පරිගණක ආශ්‍රිත සන්නිවේදන තාක්ෂණය ලබා ඇති දියුණුව විස්තර කරයි.<br>4. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන යන්ත්‍ර නිවැරදි ව භාවිතයට යොමු වේ. | 3 |
| | 3.2 විවිධ මාධ්‍ය උපකරණ භාවිතයෙන් කාර්යාලය තුළ සන්නිවේදනය ක්‍රියාත්මක කිරීමේ හැකියාව දක්වයි. | **3.2 කාර්යාලයීය මාධ්‍ය උපකරණ**<br>1. කාර්යාලයීය මාධ්‍ය ක්‍රියාවලිය හා එහි අවශ්‍යතාව<br>2. කාර්යාලයීය මාධ්‍ය උපකරණ හඳුනා ගැනීම<br>3. කාර්යාලයීය මාධ්‍ය උපකරණ භාවිතය | 1. කාර්යාලයක භාවිත වන මාධ්‍ය උපකරණ හඳුන්වා දෙයි.<br>2. කාර්යාලයක ක්‍රියාත්මක වන මාධ්‍ය ක්‍රියාවලිය විස්තර කරයි.<br>3. කාර්යාලීය මාධ්‍ය ක්‍රියාවලියක අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>4. කාර්යාල මාධ්‍ය උපකරණ නිවැරදි ව භාවිත කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.3 තොරතුරු හුවමාරු කිරීමේ ක්‍රියාවලිය සඳහා භාවිත වන විවිධ මාධ්‍ය උපකරණ නිවැරදි ව හා විධිමත් ව පරිහරණය කරයි. | **3.3 තොරතුරු හුවමාරු කිරීමේ මාධ්‍ය උපකරණ**<br>1. තොරතුරු හුවමාරු කිරීමේ මාධ්‍ය ක්‍රියාවලිය හා එහි අවශ්‍යතාව<br>2. තොරතුරු හුවමාරු කිරීමේ මාධ්‍ය උපකරණ හඳුනා ගැනීම<br>3. තොරතුරු හුවමාරු කිරීමේ මාධ්‍ය උපකරණ භාවිතය | 1. තාක්ෂණික දියුණුව නිසා ලොව පුරා ශීඝ්‍රයෙන් තොරතුරු හුවමාරු වන ආකාරය විස්තර කරයි.<br>2. ලොව පුරා ශීඝ්‍ර ලෙස තොරතුරු හුවමාරු වීමේ අගය පෙන්වා දෙයි.<br>3. වර්තමානයේ දී භාවිත වන තොරතුරු හුවමාරු කිරීමේ උපකරණ නම් කරයි.<br>4. තොරතුරු හුවමාරු කිරීම සඳහා දූරකථන භාවිතය නිවැරදි ව සිදු කරයි. | 3 |
| | 3.4 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අවශ්‍ය මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | **3.4 පන්ති කාමර මාධ්‍ය උපකරණ (ප්‍රක්ෂේපණය කොවන)**<br>1. පන්ති කාමර මාධ්‍ය උපකරණවල අවශ්‍යතාව<br>2. පන්ති කාමර මාධ්‍ය උපකරණ (ප්‍රක්ෂේපණය නොවන)<br>3. පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිතය (ප්‍රක්ෂේපණය නොවන) | 1. පන්ති කාමර මාධ්‍ය උපකරණවල අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>2. පන්ති කාමරවල සන්නිවේදන ක්‍රියාදාමය පහසු කර ගැනීම සඳහා භාවිත වන මාධ්‍ය උපකරණ හඳුනා ගනී.<br>3. පන්ති කාමර මාධ්‍ය උපකරණ වර්ගීකරණය කර දක්වයි.<br>4. පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.5 ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අවශ්‍ය මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | **3.5 පන්ති කාමර මාධ්‍ය උපකරණ (ප්‍රක්ෂේපණය වන)**<br>1. පන්ති කාමර මාධ්‍ය උපකරණවල අවශ්‍යතාව<br>2. පන්ති කාමර මාධ්‍ය උපකරණ (ප්‍රක්ෂේපණය වන)<br>3. පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිතය (ප්‍රක්ෂේපණය වන) | 1. පන්ති කාමර මාධ්‍ය උපකරණවල අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>2. පන්ති කාමරවල සන්නිවේදන ක්‍රියාදාමය පහසු කර ගැනීම සඳහා භාවිත වන මාධ්‍ය උපකරණ හඳුනා ගනී.<br>3. පන්ති කාමර මාධ්‍ය උපකරණ වර්ගීකරණය කර දක්වයි.<br>4. පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | 3 |
| | | | | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **4.0 ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය ආයතන හිමිකමේ ස්වභාවය ගවේෂණය කරමින්, එය මාධ්‍ය සංස්කෘතිය තුළ නිරූපණය වන ආකාරය යථාර්ථවාදී ලෙස ප්‍රකාශ කරයි.** | 4.1 ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය ආයතන ප්‍රභවය හා හිමිකම පිළිබඳ යථා ස්වභාවය විග්‍රහ කරයි. | **4.0 ජන මාධ්‍ය ආයතනික අධ්‍යයනය**<br><br>**4.1 ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය ආයතන හිමිකම හා ක්‍රියාකාරීත්වය**<br>1. රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය හිමිකම<br>2. පුවත්පත් ආයතනයක අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය<br>3. ගුවන්විදුලි ආයතනයක අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය<br>4. රූපවාහිනී ආයතනයක අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය | 1. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන මාධ්‍ය ආයතන හඳුනා ගනියි.<br>2. ශ්‍රී ලංකාවේ විවිධ මාධ්‍ය ආයතන හිමිකම යටතේ ප්‍රභවය වූ මාධ්‍ය ආයතන පිළිබඳ තොරතුරු අනාවරණය කරයි.<br>3. තෝරාගත් පුවත්පත් ආයතනයක සංවිධාන ව්‍යුහයට අයත් එක් එක් අංශයක ක්‍රියාකාරීත්වය පිළිබඳ මූලික තොරතුරු විශ්ලේෂණය කරයි.<br>4. තෝරාගත් ගුවන්විදුලි ආයතනයක සංවිධාන ව්‍යුහයට අයත් එක් එක් අංශවල ක්‍රියාකාරීත්වය පිළිබඳ සරල ව විග්‍රහ කරයි.<br>5. තෝරාගත් රූපවාහිනී ආයතනයක සංවිධාන ව්‍යුහයට අයත් එක් එක් අංශවල කාර්යභාරය විස්තර කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 4.2 ජන මාධ්‍ය ආයතන හිමිකම මාධ්‍යවේදීන් හා ග්‍රාහකයින් කෙරෙහි බලපාන ආකාරය විග්‍රහ කරයි. | **4.2 ජන මාධ්‍ය ආයතන හිමිකම ග්‍රාහකයා කෙරෙහි බලපෑම**<br>1. මාධ්‍ය ආයතන හිමිකම හා ආයතනික ප්‍රතිපත්ති<br>2. මාධ්‍ය ආයතන හිමිකම හා මාධ්‍යවේදීන්<br>3. මාධ්‍ය ආයතන හිමිකම, මාධ්‍යවේදීන් හා ග්‍රාහකයා<br>4. මාධ්‍ය ආයතන හිමිකම ග්‍රාහකයා කෙරෙහි ඇති කරන බලපෑම | 1. ජන මාධ්‍ය ආයතනවල හිමිකම් ස්වභාවය කෙබඳු දැයි හඳුනා ගනී.<br>2. මාධ්‍ය ආයතන හිමිකම අනුව ආයතනික ප්‍රතිපත්ති වෙනස් වන ආකාරය විස්තර කරයි.<br>3. මාධ්‍ය ආයතනික අරමුණු අනුව එහි කාර්යමණ්ඩලයේ සේවාදායකත්වය සැපයෙන ආකාරය විස්තර කරයි.<br>4. මාධ්‍ය ආයතන හිමිකම, මාධ්‍යවේදීන් ග්‍රාහකයා අතර ඇති වන සබඳතාව කෙබඳු දැයි විස්තර කරයි.<br>5. මාධ්‍ය ආයතන හිමිකම ග්‍රාහකයා කෙරෙහි ඇති කරන බලපෑම සොයා බලයි. | 3 |
| | 4.3 ජන මාධ්‍ය ආයතනයන්හි වාණිජ අරමුණු හා ප්‍රතිපත්ති ද, ජන මාධ්‍ය ආයතන හා රජය අතර පවත්නා විවිධ ස්වරූප සම්බන්ධතා විග්‍රහ කරයි. | **4.3 ජන මාධ්‍ය ආයතන හා රජය**<br>1. ජන මාධ්‍ය ආයතනයන්හි ප්‍රතිපත්ති හා වාණිජ අරමුණු<br>2. ජන මාධ්‍ය ආයතන හා රාජ්‍ය අරමුණු අතර සහසම්බන්ධය | 1. ජන මාධ්‍ය ආයතන ඒවාට ම ආවේණික ප්‍රතිපත්තියමය තීරණ මත ක්‍රියාත්මක වන බව හඳුනා ගනියි.<br>2. ග්‍රාහකයෙකු ලෙස විවිධ මාධ්‍ය ආයතනවල ප්‍රතිපත්ති හඳුනා ගනියි.<br>3. මාධ්‍ය ආයතන වාණිජ අරමුණු ප්‍රකාශයට පත් කරන ආකාරය විග්‍රහ කරයි. | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | 3. ජන මාධ්‍ය ආයතන ක්‍රියාකාරීත්වය කෙරෙහි රජයේ යුතුකම් හා වගකීම්<br>4. මාධ්‍ය ක්‍රියාකාරීත්වය කෙරෙහි රජයේ සෘජු හා වක්‍ර මැදිහත්වීම් | 4. විවිධ මාධ්‍ය ආයතන රාජ්‍ය අරමුණු ප්‍රකාශයට පත්කරන ආකාරය විග්‍රහ කර දක්වයි.<br>5. ජන මාධ්‍ය ආයතන ක්‍රියාකාරිත්වය කෙරෙහි රජයේ මැදිහත් වීමේ ස්වභාවය හඳුනා ගනියි. | 10 |
| **5.0 ජන මාධ්‍යයේ විවිධ ආකාරයේ නියෝජනයන්හි යථාර්ථය හා සමාජීය බලපෑම අර්ථකථනය කර ප්‍රදර්ශනය කරයි.** | 5.1 ජන මාධ්‍යයේ විවිධ ආකාරයේ ප්‍රකාශන තුළ සමාජීය ස්වභාව නියෝජනය වන ආකාරය යථාර්ථවාදී ලෙස අර්ථ දක්වයි. | **5.0 ජන මාධ්‍ය නියෝජන අධ්‍යයනය**<br>**5.1 සමාජීය නියෝජනය අධ්‍යයනය**<br>1. පවුල් සංස්ථාව<br>2. ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය<br>3. වාර්ගිකත්වය<br>4. පුරවැසිභාවය<br>5. මානව හිමිකම් හා වගකීම් | 1. ජන මාධ්‍ය මගින් සාමාජීය නියෝජනය සිදු වන ආකාරය විස්තර කරයි.<br>2. තෝරාගන්නා ලද මාධ්‍යයක එක් වැඩසටහන් ප්‍රභේදයක් ඇසුරින් යහපත් පවුල් වාතාවරණයක් තහවුරු කිරීම සඳහා ලැබෙන දායකත්වය විචාරාත්මක ව අගය කරයි.<br>3. ශ්‍රී ලංකාවට උචිත පරිදි ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය නියෝජනය සඳහා රූපවාහිනිය ලබා දෙන දායකත්වය විචාරාත්මක ව අගයයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | 4. වාර්ගික ඒකාබද්ධතාව සුරැකෙන ලෙස කටයුතු කිරීමට ජනමාධ්‍ය යොමු වන ආකාරය සොයා බලයි.<br>5. ජන මාධ්‍ය, මානව හිමිකම් සුරැකෙන හා මානව වගකීම් ඉටු කරනු ලබන සමාජයක් ගොඩනැගීමට උචිත වන සේ සිය ප්‍රකාශනයන් හසුරුවන ආකාරය සොයා බලයි. | |
| | 5.2 ජනමාධ්‍යයේ විවිධ ආකාරයේ ප්‍රකාශනයන් තුළ ආර්ථික ස්වභාව නියෝජනය වන ආකාරය යථාර්ථවාදී ලෙස අර්ථ දක්වයි. | **5.2 ආර්ථික නියෝජන අධ්‍යයනය**<br>1. වැඩලෝකය<br>2. විවිධ වෘත්තීන්<br>3. වෙළඳ පොළ<br>4. සංවර්ධනාත්මක චින්තනය | 1. ජන මාධ්‍යවල විවිධ ප්‍රකාශන මගින් වැඩලෝකය හා විවිධ වෘත්තීන් හඳුන්වා දෙන ආකාරය විග්‍රහ කරයි.<br>2. ජන මාධ්‍යවල විවිධ ප්‍රකාශන මගින් වෙළඳපොළ පිළිබඳ හඳුන්වා දෙන ආකාරය පිළිබඳ විචාරාත්මක ව අදහස් දක්වයි.<br>3. ජන මාධ්‍යවල විවිධ ප්‍රකාශන මගින් සංවර්ධනාත්මක චින්තනය සඳහා ජනතාව යොමු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග අගය කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 5.3 ජනමාධ්‍යයේ විවිධ ආකාරයේ ප්‍රකාශයන් තුළ ආගමික හා සදාචාරාත්මක ස්වභාව නියෝජනය වන ආකාරය යථාර්ථවාදී ලෙස අර්ථ දක්වයි. | **5.3 ආගමික හා සදාචාරාත්මක නියෝජන අධ්‍යයනය**<br>1. ආගම්<br>2. සදාචාරය හා සාරධර්ම<br>3. සමාජ ප්‍රතිරූප<br>4. ගැටුම් හා සාමය<br>5. මානව ධර්මතා | 1. ජන මාධ්‍ය ප්‍රකාශනයන්ගෙන් රටේ ආගමික සහජීවනය පවත්වා ගැනීම සඳහා ලැබෙන දායකත්වය අගය කරයි.<br>2. ජන මාධ්‍ය මගින් රටේ සදාචාර හා සාරධර්ම, මානව ධර්මතා සංවර්ධනයට සිදු කෙරෙන මෙහෙය කෙබඳු දැයි අනාවරණය කරයි.<br>3. රටක යහපැවැත්මට දායක වන පරිදි සමාජ ප්‍රතිරූප ගොඩනැංවීම සඳහා ජන මාධ්‍ය යොමු වන ආකාරය විස්තර කරයි.<br>4. ගැටුම් වළක්වාලීමටත් සාමය ආරක්ෂා කිරීමටත් උචිත පරිදි ජන මාධ්‍ය සිය ප්‍රකාශන මෙහෙයවන ආකාරය කෙබඳු දැයි තොරතුරු හෙළි කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.4 ජනමාධ්‍යයේ විවිධ ආකාරයේ ප්‍රකාශයන් තුළ සෞන්දර්යාත්මක ස්වභාව නියෝජනය වන ආකාරය යථාර්ථවාදී ලෙස අර්ථ දක්වයි. | **5.4 සෞන්දර්යාත්මක නියෝජන අධ්‍යයනය**<br>1. විනෝදාත්මක කාර්ය<br>2. රසඥතාව<br>3. නිර්මාණාත්මක චින්තනය<br>4. සෞන්දර්ය හා සමාජ විඥාණය | 1. ජන මාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන විනෝදාත්මක වැඩසටහන් වර්ගීකරණය කර දක්වයි.<br>2. ජන මාධ්‍ය විනෝදාස්වාදය සැපයීම සිදු කරන ආකාරයේ ගුණාත්මක බව සොයා බැලීම සිදු කරයි.<br>3. තෝරා ගත් ජන මාධ්‍යයක උසස් රසඥතාවකින් යුතු වැඩසටහනක් තෝරා එහි ගුණාත්මක බව අගය කරයි.<br>4. උසස් රසඥතාවකින් යුතු වැඩසටහන් ඇසුරට යොමු වෙයි.<br>5. ජන මාධ්‍ය අතරින් තෝරා ගත් වැඩසටහනක් පිළිබඳ එහි නිර්මාණාත්මක චින්තනය අගය තරයි.<br>6. ජන මාධ්‍යවලින් තෝරා ගත් වැඩසටහන් කීපයක් ඇසුරින් ඒවායෙන් නිරූපණය වන සමාජ විඥානය විචාරාත්මක ව විස්තර කරයි. | 3<br><br>12 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **6.0 නිශ්චල කැමරාවේ තාක්ෂණය නිවැරදි ව භාවිත කරමින්, නිර්මාණශීලී ව හා සාර්ථක ව නිශ්චල ඡායාරූප නිර්මාණය කිරීමේ නිපුණතාව ප්‍රදර්ශනය කරයි.** | 6.1 විවිධ අරමුණු ඉටු කර ගැනීම සඳහා සන්නිවේදන මාධ්‍ය ක්ෂේත්‍රයේ හා සමාජයේ නිශ්චල ඡායාරූප භාවිත කරන ආකාරය හා ඒ ඒ ඡායාරූපවල විශේෂතා සංසන්දනාත්මක ව විග්‍රහ කරයි. | **6.0 නිශ්චල ඡායාරූප ශිල්පීය නිපුණතා**<br><br>**6.1 නිශ්චල ඡායාරූප හා එහි භාවිතය**<br>1. සිහිවටන වශයෙන් භාවිතය<br>2. මුද්‍රිත මාධ්‍යයෙහි භාවිතය<br>3. සිනමා හා රූපවාහිනී මාධ්‍යයෙහි භාවිතය<br>4. නිශ්චල ඡායාරූපවල ගුණාංග හා විශේෂතා | 1. නිශ්චල ඡායාරූප ශිල්පීය දක්ෂතා කවරේ දැයි සරල ව හඳුන්වයි.<br>2. අවාචික සන්නිවේදන මාධ්‍යයක් ලෙස නිශ්චල ඡායාරූප භාවිතයේ වැදගත්කම අගය කරයි.<br>3. පෞද්ගලික සිහිවටන වශයෙන් නිශ්චල ඡායාරූප භාවිතයෙහි වැදගත්කම විස්තර කරයි.<br>4. මුද්‍රිත මාධ්‍ය සඳහා නිශ්චල ඡායාරූප භාවිතයට ගන්නා ආකාරය විස්තර කරයි.<br>5. සිනමා හා රූපවාහිනී මාධ්‍යයෙහි භාවිතය සඳහා නිශ්චල ඡායාරූප භාවිතයේ අවශ්‍යතාව පෙන්වා දෙයි.<br>6. නිශ්චල ඡායාරූපවල විශේෂතා හඳුනා ගනී. | 4 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 නිශ්චල ඡායාරූප ශිල්පයේ සරල තාක්ෂණික නිපුණතා ප්‍රදර්ශනය කරයි. | **6.2 නිශ්චල කැමරාවේ සරල තාක්ෂණය**<br>1. නිශ්චල කැමරාවේ ක්‍රියාවලිය<br>2. දළ සේයාපටල හා ඩිජිටල් දත්තකරණය<br>3. ඡායාරූප හා විනිවිදක<br>4. ඩිජිටල් ඡායාරූප ශිල්පීය තාක්ෂණය | 1. නිශ්චල කැමරාවේ තාක්ෂණික ක්‍රියාවලිය විස්තර කරයි.<br>2. දළ සේයා පටලයක් පරීක්ෂා කර එහි ස්වභාවය හඳුනා ගනියි.<br>3. ඩිජිටල් දත්ත ගබඩාකරණ මතක පතක් පරීක්ෂා කර එහි ස්වභාවය හඳුනා ගනී.<br>4. ඩිජිටල් තාක්ෂණයේ විශේෂතා පැහැදිලි කරයි.<br>5. ඡායාරූපයක් හා විනිවිදකයක වෙනස පහදයි.<br>6. සරල අංකිත කැමරාවක් මගින් නිවැරදි ලෙස නිශ්චල ඡායාරූප ලබා ගනී. | 4 |
| | 6.3 තාක්ෂණය නිවැරදි ලෙස භාවිත කරමින්, නිර්මාණශීලී ව හා සාර්ථක ව නිශ්චල ඡායාරූප ගැනීමේ හැකියාව පෙන්වයි. | **6.3 තාක්ෂණය හා නිර්මාණශීලීභාවය**<br>1. කැමරාවේ තාක්ෂණික අංග හැසිරවීම<br>2. ආලෝකය පාලනය<br>3. රූප රාමු, කැමරා කෝණ හා ක්ෂේත්‍ර ගැඹුර, පර්යාලෝකනය හා අරමුණ<br>4. තාක්ෂණය හා නිර්මාණශීලී බව | 1. කැමරාවේ අංගෝපාංගවල කාර්යභාරය වෙන් වෙන්ව විස්තර කරයි.<br>2. ඡායාරූපයක් ගැනීම සඳහා කැමරාව යෝග්‍ය දෘෂ්ටිකෝණයක රඳවයි.<br>3. ඡායාරූපයක් සඳහා සාර්ථක ව ආලෝකය මෙහෙයවයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | | 4. නිවැරදි තාක්ෂණික ක්‍රම ශිල්ප අනුගමනය කරමින් රූපගත කිරීමේ නියැලේ.<br>5. වඩා උසස් ප්‍රකාශනයකින් යුතු ඡායාරූප සම්පාදනය කරයි. | |
| | 6.4 නිශ්චල ඡායාරූපකරණයේ නිර්මාණාත්මක ක්‍රම-විධි අත්හදා බලමින් නිර්මාණාත්මක කුසලතා ප්‍රදර්ශනය කරයි. | **6.4 නිර්මාණාත්මක ක්‍රම-විධි**<br>1. වාර්තාමය ඡායාරූප<br>2. නිර්මාණාත්මක ඡායාරූප<br>3. ඡායාරූප ප්‍රදර්ශනය | 1. වාර්තාමය ඡායාරූපයක ලක්ෂණ පෙන්වා දෙයි.<br>2. නිර්මාණාත්මක ඡායාරූපයක් හා වාර්තාමය ඡායාරූපයක වෙනස සසඳයි.<br>3. වාර්තාමය, නිර්මාණාත්මක ඡායාරූපවල ව්‍යවහාරික අගය පැහැදිලි කරයි.<br>4. විවිධ නිර්මාණාත්මක ඡායාරූප එක්රැස් කරයි.<br>6. වාර්තාමය, නිර්මාණාත්මක ඡායාරූපකරණයේ නියැලේ.<br>7. වාර්තාමය, නිර්මාණාත්මක ඡායාරූප ඒකරාශී කර ප්‍රදර්ශනය කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.5 නිශ්චල ඡායාරූප ශිල්පීය වෘත්තීය වැඩ ලෝකයේ ස්වභාව තමන්ට ප්‍රයෝජනයට ගත හැකි ආකාරය හා එයට අදාළ ආචාර ධර්මීය හා නෛතික කරුණු සරල ව විස්තර කරයි. | **6.5 නිශ්චල ඡායාරූප ශිල්පීය වෘත්තිය**<br>1. පුහුණු අවකාශ<br>2. ස්වාධීන ඡායාරූප ශිල්පියා<br>3. ඡායාරූප ශිල්පීය රැකියා<br>4. ඡායාරූප ශාලා<br>5. ඡායාරූපකරණයේ අචාර ධර්ම හා නෛතික කරුණු | 1. නිශ්චල ඡායාරූප ශිල්පීය පුහුණු අවකාශ හඳුනා ගනී.<br>2. නිශ්චල ඡායාරූප ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>3. ඡායාරූපකරණයේ ආචාර ධර්ම හා නෛතික කරුණු හඳුනා ගනී. | 3<br>17 |

**නිපුණතාව 1.0** විවිධාකාරයේ සන්නිවේදන වර්ග සංසන්දනාත්මක ව හඳුනා ගනිමින් ඒවා තම ජීවිතයේ අවස්ථානුකූල ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම 1.1** සන්නිවේදන ක්‍රියාවලියේ ස්වභාවය සරල නිර්වචන හා ආකෘතියක් ඇසුරින් විස්තර කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

## ඉගෙනුම් පල

1. සන්නිවේදනය යන්න සරල ව අර්ථ දක්වයි.
2. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග හඳුන්වා දෙයි.
3. සන්නිවේදනය යන්නට විධිමත් නිර්වචන ලබා දෙයි.
4. සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ ලැස්වෙල් නිර්වචන හඳුනා ගනියි.
5. සන්නිවේදනය පිළිබඳ ෂැනන් හා වීවර් ආකෘතිය හඳුනා ගනියි.
6.. ලැස්වෙල් නිර්වචනයට අනුව විවිධ සන්නිවේදන අවස්ථා විග්‍රහ කරයි.
7. ෂැනොන් හා වීවර් නිර්වචන (සන්නිවේදන අවස්ථා ඔස්සේ) විග්‍රහ කර දක්වයි.
8. සන්නිවේදන ක්‍රියාවලිය ද්විමාර්ගික ක්‍රියාවලියක් බව හේතු සහිත ව පෙන්වා දෙයි.
9. සන්නිවේදනයේ මූලික කාර්යයන් විස්තර කරයි.
10. සන්නිවේදන ක්‍රියාවලියක් සාර්ථක ව සිදු කිරීම සඳහා සැලකිල්ලට ගත යුතු ක්‍රියාමාර්ග පෙන්වා දෙයි.
11. සන්නිවේදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් දොරටුපාලක සංකල්පය ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගනී.

## පාඩම සැලසුම සඳහා උපදෙස්

- සන්නිවේදනය යනු කුමක් දැයි අදහස මතු වන පරිදි භූමිකා රංගනයක සිසුන් නිරත කරවිය හැකිය. මෙහි දී සන්නිවේදනය යන්න අර්ථ දක්වා ගැනීමට යම් අය යොමු වීම දක්වන භූමිකා රංගන යොදා ගැනීමට ද හැකියාව ඇත.
- ඉහත රංගන අවස්ථාව ඔස්සේ අදහස් මතු කර ගනිමින් සන්නිවේදනය යනු කුමක් දැයි හඳුනා ගැනීම සඳහා සිසුන් හා අදහස් විමසීමකට යොමු වන්න. සිසුන්ගේ වටිනා අදහස් කළු ලෑල්ලේ ලියා දක්වන්න.
  සිසු අදහස් ඇසුරෙන් සන්නිවේදනය හැඳින්වීමට සරල අර්ථ දැක්වීමක් ගොඩ නගන්න. සන්නිවේදනය ක්‍රියාවලියක් බව පෙන්වා එහි මූලික අංග පිළිබඳ අවබෝධය ලබා දෙන්න.
  සන්නිවේදකයා → පණිවුඩය → නාලිකාව → ග්‍රාහකයා → ප්‍රතිපෝෂණය → බාධක → අත්දැකීම්/ පසුතලය → සන්දර්භය → බලපෑම්

- සන්නිවේදන අර්ථ දැක්වීම සඳහා සන්නිවේදන විද්වතුන් නිර්වචන ඉදිරිපත් කර ඇති බව පෙන්වා දෙමින් පහත නිර්වචනය ඉදිරිපත් කරන්න.
- හැරල්ඩ් ඩී ලැස්වෙල් නිර්වචනය (1948) පෙන්වා දෙන්න.

**ලැස්වෙල් නිර්වචනය**

**"කිසිවෙක්, යම් කිසිවක්, කිසියම් නාලියකින්, යමෙකුට, යම් බලපෑමක් ඇති කිරීම සඳහා ප්‍රකාශ කරන ලද්දේ ද, එය සන්නිවේදනයයි "**

| | | |
|---|---|---|
| 1. Who | කිසියම් කෙනෙක් | සන්නිවේදකයා |
| 2. Says What | යම් කිසිවක් | පණිවිඩය/ සංදේශය |
| 3. In which channel | කිසියම් මාධ්‍යයකින් | මාධ්‍යය |
| 4. To whom | යමෙකුට | ග්‍රාහකයා |
| 5. With what effect | යම් බලපෑමක් සඳහා | බලපෑම |

සන්නිවේදකයා Communicator → සන්දේශය Message → මාධ්‍ය Media → ග්‍රාහකයා Receiver → බලපෑම Effect


ඉහත ආකෘති දෙක ම එක ම දිශාවකට පෙළ ගැසී ඇති බවත් සන්නිවේදකයාට වැඩි වැදගත්කමක් හිමි බවත් අවධානයට යොමු කරමින් ආකෘතිය අධ්‍යයනයට අවස්ථා සලසන්න.

- සිසුන්ගේ සැබෑ ජීවිතයේ සන්නිවේදන අවස්ථා කිහිපයක් ගෙන සන්නිවේදන ක්‍රියාවලිය ලැස්වෙල් ආකෘතිය හා ගැළපීමට යොමු කරන්න.
- සන්නිවේදනය පිළිබඳ ෂැනොන් හා වීවර්ගේ නිර්වචනය සිසුන් වෙත ඉදිරිපත් කරන්න.

**ෂැනොන් හා වීවර් නිර්වචනය**

- සන්නිවේදනය යනු යම් තැනෙක නිර්මාණය වූ යම් තෝරා ගත් පණිවිඩයක් ඒ ආකාරයෙන් ම හෝ සමාන ලෙස වෙනත් තැනෙක දී ප්‍රතිනිර්මාණය කිරීම ය.

**ෂැනොන් හා වීවර්ගේ සන්නිවේදන ආකෘතිය**



- ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් යන ගණිතය හා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්වතුන්

දෙදෙනා විසින් 1949 දී මේ සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කරන ලද බවත් මේ ආකෘතියේ අවධානය යොමු කර ඇත්තේ, දුරකථනය මගින් සන්නිවේදන ක්‍රියාවලිය සිදු වන ආකාරය බවත් පෙන්වා දෙන්න. මේ පිළිබඳ තවදුරටත් සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

- මේ ආකෘතිය අනුව ද සන්නිවේදන ක්‍රියාදාමය එක ම දිශාවකට ගමන් කරන බවත් සන්නිවේදන ක්‍රියාවලියේ ආරම්භකයා තොරතුරු මූලාශ්‍රය බවත්
  සන්නිවේදන ක්‍රියාදාමය අතරතුර සන්නිවේදන බාධා (ඝෝෂා - Noise) ඇති විය හැකි බවත් අවධානයට යොමු කරන්න.
- සන්නිවේදන බාධා
  - අර්ථ බාධක : භාෂාව ආශ්‍රිත බාධක
  - මාධ්‍ය බාධක : තාක්ෂණික බාධක
- සැබෑ ජීවිතයේ සන්නිවේදන අවස්ථා කීපයක් තෝරා ගනිමින් එම අවස්ථාවන් ෂැනොන් හා වීවර්ගේ ආකෘතිය අනුව ගැළපීමට සිසුන් යොමු කරන්න.
  අදාළ තොරතුරු උචිත වගු, රූප සටහන් ඇසුරින් නිරූපණය කිරීමට යොමු කරන්න.
- සන්නිවේදනය යන්න ද්විමාර්ගික ක්‍රියාවලියක් බව අධ්‍යයනය කිරීමට යොමු කරන්න.
- සන්නිවේදන ක්‍රියාවලියේ දී සන්නිවේදක ග්‍රාහක භූමිකා හුවමාරු වන බව පෙන්වා දෙන්න.
- සන්නිවේදන ක්‍රියාවලියේ සාර්ථකත්වය කෙරෙහි ප්‍රතිපෝෂණය ඇති කරන බලපෑම අගය කිරීමට සිසුන් වෙත උචිත මගපෙන්වීම් සිදු කරන්න.
- අප සන්නිවේදනයේ යෙදෙන විවිධ අවස්ථා සිසුන් හා සාකච්ඡා කර එම අවස්ථා හා ඒ ඒ අවස්ථාවල දී සන්නිවේදනයේ කාර්යයන් සිසුනට ප්‍රදර්ශනය වන සේ ලියා දක්වන්න.
  උදා: පන්ති කාමරයක උගන්වන අවස්ථාවක්
  වේදිකා නාට්‍යයක් නරඹන අවස්ථා
- සන්නිවේදන කාර්ය සාර්ථක කර ගැනීම සඳහා සැලකිය යුතු කරුණු පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරන්න.
- සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක වීම කෙරෙහි බලපානු ලබන සාධක; උචිත ආකෘති/ සටහන්/ ප්‍රදර්ශන පුවරු මගින් පන්තියේ ප්‍රදර්ශනය කරවන්න.
- දොරටුපාල සංකල්පය සරල ව හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.
- දොරටුපාල සංකල්පය ක්‍රියාත්මක වන අවස්ථා සඳහා නිදසුන් සාකච්ඡා කරන්න.
  උදා: යුද්ධ අවස්ථාවක සියලු සිදුවීම් එලෙස ම මාධ්‍යයෙන් වාර්තා නොකිරීම.
  නිවසේ දී සිදු කෙරෙන සන්නිවේදනයේ දී දොරටුපාල සංකල්පය සාකච්ඡා කරන්න. (නිවසේ දී සිදු වන සියලු දේ බාහිර සමාජයේ දී ප්‍රකාශයට පත් නොකෙරෙන බව)

## මූලික වදන්

- සන්නිවේදන නිර්වචන - Definitions of Communication
- ද්විමාර්ගික සන්නිවේදනය - Two way Communication
- ප්‍රතිපෝෂණය - Feedback
- සන්නිවේදන කාර්යයන් - Functions of Communication
- දොරටුපාල සංකල්පය - Gate Keeper/ Gate keeping Concept

## ගුණාත්මක යෙදවුම්

- නිපුණතා මට්ටමට අදාළ වීඩියෝ දර්ශන, අදාළ ඡායාරූප සටහන් ඇතුළත් ලිපි ලේඛන.
- ශිෂ්‍ය නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය.

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

මෙහි දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු විය යුතු ය.

- සන්නිවේදනය හඳුනා ගැනීම.
- සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංග හඳුනා ගැනීම.
- ලැස්වෙල්, ෂැනොන්, වීවර් ආකෘති හඳුනා ගැනීම.
- සන්නිවේදනයේ මූලික කාර්යයන් හැඳින්වීම.
- සන්නිවේදන ක්‍රියාවලියක සාර්ථකත්වය කෙරෙහි බලපාන සාධක ඉදිරිපත් කිරීම.

**නිපුණතාව 1.0** විවිධාකාරයේ සන්නිවේදන ප්‍රභේද සංසන්දනාත්මක ව හඳුනා ගනිමින් ඒවා තම ජීවිතයේ අවස්ථානුකූල ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම 1.2** තමාගේ ම සිතිවිලිවල හැසිරීම සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධ වන ආකාරය පිළිබඳව විග්‍රහ කරයි.


**කාලච්ඡේද සංඛ්‍යාව** 03

## ඉගෙනුම් පල

1. පුද්ගලයා තුළ අන්තර්වර්ති සන්නිවේදන ක්‍රියාදාමය සිදුවන ආකාරය පිළිබඳ ජීව විද්‍යාත්මක තොරතුරු විශ්ලේෂණය කරයි.
2. අන්තර්වර්ති සන්නිවේදන ක්‍රියාදාමය යහපත් ව සිදු වීමේ අගය පහදයි.
3. පුද්ගල චර්යා පාලනයට අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය හේතු වන ආකාරය සාකච්ඡා කරයි.
4. සන්නිවේදන ක්‍රියාදාමයන්හි ආරම්භක අවස්ථාව ලෙස අන්තර්වර්ති පුද්ගල සන්නිවේදන ක්‍රියාදාමයේ වැදගත්කම සාකච්ඡා කරයි.
5. සාර්ථක ජීවිතයක් සඳහා අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය මැනවින් මෙහෙයවා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග සොයා බලයි.
6. අන්තර්වර්ති සන්නිවේදනය සිදු වන විවිධ අවස්ථා හඳුනා ගනියි.


## පාඩම සැලසුම සඳහා උපදෙස්

- මිනිස් සිරුරේ පසිඳුරන් මගින් ග්‍රහණය කර ගන්නා දේ මනසින් වටහා ගනිමින් ඒවාට ප්‍රතිචාර දක්වන ආකාරය උචිත රූප සටහන් මගින් ප්‍රදර්ශනය කරන්න.




| | | | | |
|---|---|---|---|---|
| 1. රෝස මල | ඇස | රූප සංඥා | සතුට, ආශාව | මල සිඹීම |
| 2. සර්පයෙකු | ඇස | රූප සංඥා | බිය, පිළිකුල | ඉවතට පැනීම |
| 3. මිහිර ගීයක් | කන | ශබ්ද සංඥා | සතුට | නැටීම, ගැයීම |

- ඉහත සටහන් භාවිත කරමින් පසිඳුරන්ගෙන් ග්‍රහණය කරගන්නා දේ සන්නිවේදනය කර ගන්නා ආකාරය උත්තේජන ප්‍රතිචාර ක්‍රියාවලිය ඔස්සේ පහදා දෙන්න.




- පුද්ගලයා හා අවස්ථාව අනුව එක ම දේ විවිධ ලෙස සන්නිවේදනය කර ගන්නා බව පෙන්වා දෙන්න.

  උදා:

    - තමා තදබල සේ නිදිමතින් නින්දකට සූදානම් වන විට මිතුරෙකු පැමිණ කථාවට සූදානම් වීම - මිතුරා දකින විට ම කරදරයක් සේ සිතීම.
    - තමා පාළුවෙන් තනිකමින් සිටින විටක මිතුරෙකු පැමිණීම - මිතුරා දකින විට සතුටක් ඇති වීම.

- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදන ක්‍රියාවලිය යහපත් වීමේ අගය සාකච්ඡා කරන්න.

  උදා: 1. සියලු සන්නිවේදන ක්‍රියාවලීන් අන්තර්වර්තී සන්නිවේදනයෙන් ඇරඹෙන නිසා ආරම්භක සන්නිවේදන ක්‍රියාවලියක් ලෙස ඇති වටිනාකම.

- තමාගේ අන්තර්වර්තී සන්නිවේදන ක්‍රියාදාමය යහපත් කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

  උදා:
    - චින්තනයේ යෙදීමේ අභ්‍යාස කිරීම.
    - සිතුවිලි පාලනය කර ගැනීම.
    - ස්මරණ ශක්තිය දියුණු කර ගැනීම.

- තමාගේ අන්තර්වර්තී සන්නිවේදනය තමාට ම පාලනය කර ගත හැකි බව පෙන්වා දෙන්න.
- ඒ සඳහා විවිධ උපායමාර්ග පවතින බවත්, ඉන් සිසුවෙකුට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් සාකච්ඡා කරන්න.
  - මනසින් යමක් නිවැරදි ව හඳුනා ගැනීමේ අවශ්‍යතාව.
  - ක්ෂණික ව සිතට එන සියලු දේ සිතා බලා ක්‍රියාත්මක කළ යුතු බව.
  - නිතර පොත පත කියවීම, දැනුවත් බව ලැබීම, යහපත් අත්දැකීම්, හිත සාමකාමී වන අභ්‍යාස නිසා සිතුවිලි යහපත් කර ගත හැකි බව.
  - අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය නිර්මාණකරණයට පාදක වන බව.

- අන්තර්වර්තී සන්නිවේදනය සිදුවන විවිධ අවස්ථා පිළිබඳ සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

උදා: තමා තනි ව සිටින අවස්ථා
පිරිසක් අතර සිටින අවස්ථා
සැලසුම්කරණයේ දී, තීරණ ගැනීමේ අවස්ථාවල දී

- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය සාර්ථක ව සිදු කිරීමේ හැකියාව ලැබීමෙන් සැලසෙන මෙහෙය අගය කිරීමට සිසුන් යොමු කරන්න. එහි දී පහත කරුණු කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
  - නිවැරදි තීරණ ගැනීම හා සැලසුම් කිරීම් සිදු කිරීමට
  - ස්වයං පාලනය සඳහා
  - ස්වයං කථනය වැඩිදියුණු කර ගැනීම සඳහා
  - පෞරුෂ වර්ධනය සඳහා
  - වැරදි සිදුවීම්වලින් වැළකීම සඳහා
  - තමාට වැරදුණු තැන් සොයා බැලීම සඳහා

## මූලික වදන්

- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය - Inter personal communication
- ස්වයං පාලනය - Self control
- ස්මරණය - Memory

## ගුණාත්මක යෙදවුම්

- අදාළ රූප සටහන්/ වීඩියෝ දර්ශන
- නිපුණතාවට අදාළ අවස්ථා සිද්ධි රංගනය

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය යන්න හැඳින්වීම.
- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය.
- වත්මන් සමාජ බලවේග හමුවේ අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය තමාට පාලනය කළ හැකි බව පෙන්වා දෙමින් එසේ කිරීමේ අවශ්‍යතාව තහවුරු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

**නිපුණතාව 1.0** විවිධාකාරයේ සන්නිවේදන වර්ග සංසන්දනාත්මක ව හඳුනා ගනිමින් ඒවා තම ජීවිතයේ අවස්ථානුකූල ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම 1.3** වාචික හා අවාචික සන්නිවේදනය ප්‍රායෝගික ව තමන්ගේ ජීවිතයේ විවිධ අවස්ථාවන්ට යොදා ගත හැකි ආකාරය ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

1. අන්තර් පුද්ගල සන්නිවේදනය යන්න නිවැරදි ව හඳුන්වා දෙයි.
2. අන්තර් පුද්ගල සන්නිවේදනය සිදු වන විවිධ අවස්ථා පෙන්වා දෙයි.
3. අන්තර් පුද්ගල සන්නිවේදනයේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
4. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රබලත්වය අගය කරයි.
5. අන්තර් පුද්ගල සන්නිවේදනය සාර්ථක ව සිදු කිරීම සඳහා භාවිතයට ගැනෙන විවිධ උපාය මාර්ග අත්හදා බලයි.
6. අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා භාවිතයට ගැනෙන තාක්ෂණික මෙවලම් හඳුනා ගනී.
7. අන්තර් පුද්ගල සන්නිවේදනය සමාජ පැවැත්ම තහවුරු කිරීමට ඉවහල් වන ආකාරය විස්තර කරයි.
8. අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා භාවිතයට ගැනෙන තාක්ෂණික මෙවලම් නිවැරදි ලෙස භාවිතයේ යෙදෙමින් අන්තර් පුද්ගල සන්නිවේදනය සිදු කරයි.
9. ජාතික ඒකාබද්ධතාව තහවුරු කෙරෙන සේ අන්තර් පුද්ගල සන්නිවේදනයේ යෙදීමේ අගය පෙන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- පුද්ගලයන් දෙදෙනකු අතර ඇති වන සංවාද මතු කර පෙන්වන භූමිකා රංගන ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කිරීම හෝ වීඩියෝ දර්ශන රූප රාමු ප්‍රදර්ශනය ආදි උචිත ප්‍රවේශයක් යොදා ගන්න.
- අන්තර් පුද්ගල සන්නිවේදනය යන්න අර්ථකථනය කිරීමට සිසුන් යොමු කරන්න. මෙහි දී පහත තොරතුරු අධ්‍යයනයට යොමු කරන්න.
  - අන්තර් පුද්ගල සන්නිවේදනය යනු මුහුණට මුහුණලා දෙදෙනෙකු අතර ඇති වන සන්නිවේදනය බව.
  - අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ග්‍රාහක සන්නිවේදක භූමිකා වරින් වර වෙනස් වන බව

- අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී සෑම විට ම ප්‍රතිචාර/ ප්‍රතිපෝෂණ නො ලැබෙන බව පැහැදිලි කොට නිරීක්ෂණ මගින් එය වටහා ගන්නට අවස්ථාව ලබා දෙන්න.
- අන්තර් පුද්ගල සන්නිවේදනය යන්ත්‍ර සහයෙන් ද සිදු වන බව.
  - දුරකථන මගින්
  - Skype මගින්
  - E mail මගින්
  - fax මගින්

- යන්ත්‍ර මගින් අන්තර් පුද්ගල සන්නිවේදනයේ යෙදීමේ දී පවතින සීමා, සැලකිය යුතු කරුණු පිළිබඳ ව ද මූලික තොරතුරු අධ්‍යයනයට යොමු කරන්න.
- අන්තර් පුද්ගල සන්නිවේදනයේ වැදගත්කම පිළිබඳ තොරතුරු සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

  උදා: ප්‍රතිපෝෂණය ඉක්මනින් ලබා ගත හැකි වීම.
  පොදු එකඟතාව ලබා ගනිමින් තීරණ ගැනීමේ පහසුව.

- අන්තර් පුද්ගල සන්නිවේදනයේ යෙදෙන අවස්ථා ආශ්‍රිත රූප රාමු, එක් කිරීමට යොමු කරන්න.
- අන්තර් පුද්ගල සන්නිවේදනය පිළිබඳ තොරතුරු ඇතුළත් කර පොත් පිංචක් නිර්මාණයට යොමු කරන්න.
- අන්තර් පුද්ගල සන්නිවේදනය අසාර්ථක වන අවස්ථා සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

  උදා: එකිනෙකාට හොඳින් සවන් නොදීම
  එකිනෙකාගේ අදහස සිතුම් පැතුම්වලට ගරු නො කිරීම

- අන්තර් පුද්ගල සන්නිවේදනය සාර්ථක ව සිදු කිරීමට අවශ්‍ය උපාය මාර්ග හඳුන්වන්න.
  - සුහද ආචාර ධර්ම
  - අනෙකාට හොඳින් සවන්දීම
  - සංග්‍රහ කිරීම
  - ප්‍රියමනාප උණුසුම් පිළිගැනීම
  - සහකම්පනයෙන් යුතු ව කථා කිරීම
  - එකිනෙකා අගය කිරීම

- අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා භාවිතයට ගැනෙන තාක්ෂණික මෙවලම් නිවැරදි ව භාවිත කිරීමේ දැනුවත් බව ලැබීමේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
  - නිවැරදි ව දුරකථනය භාවිතය
  - නිවැරදි ව මුහුණුපොත (Facebook) භාවිතය
  - නිවැරදි ව විද්‍යුත් ලිපි (E-mail) භාවිතය

  මෙහි දී උපකරණය භාවිතය හා භාවිතයේ දී අනුගමනය කළ යුතු ආචාරධර්ම කෙරෙහි අවධානය යොමු කරන්න.

- අන්තර් පුද්ගල සන්නිවේදනය සාමාජීය පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය බවට ආකල්ප තහවුරු වන දැනුම්වත් කිරීම් සඳහා යොමු කරන්න.
  මෙය ප්‍රවීණ දේශකයෙකු ලවා කෙරෙන දේශන මගින් ද සිදු කළ හැකි ය.

## මූලික වදන්

- අන්තර් පුද්ගල සන්නිවේදනය - Inter personal communication .

## ගුණාත්මක යෙදවුම්

- නිපුණතා මට්ටමට අදාළ රූප රාමු
- වීඩියෝ දර්ශන, පොත් පත්

## ඇගයීම හා තක්සේරුකරණය

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

- අන්තර් පුද්ගල සන්නිවේදනය යන්න හැඳින්වීම.
- අන්තර් පුද්ගල සන්නිවේදනයේ විශේෂතා අගය කිරීම.
- අන්තර් පුද්ගල සන්නිවේදනය සාර්ථක ව සිදු කිරීමේ උපාය මාර්ග පෙන්වා දීම.
- දෙන ලද අවස්ථාවල දී අන්තර් පුද්ගල සන්නිවේදන සාර්ථකව සිදුකිරීමේ කුසලතා ප්‍රදර්ශනය.
- අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා තාක්ෂණික මෙවලම් භාවිත කුසලතා ප්‍රදර්ශනය.

**නිපුණතාව 1.0** විවිධාකාරයේ සන්නිවේදන වර්ග සංසන්දනාත්මක ව හඳුනා ගනිමින් ඒවා තම ජීවිතයේ අවස්ථානුකූල ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම 1.4** වාචික ව හා තාක්ෂණික මෙවලම් ඇති ව හෝ නැති ව හෝ පුද්ගල සමූහයක් සමග සන්නිවේදනයේ නිපුණතා ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

## ඉගෙනුම් පල

1. සමූහ සන්නිවේදනය යන්න නිවැරදි ව අර්ථ දක්වයි.
2. සමූහ සන්නිවේදනය සිදු වන ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
3. සමූහ සන්නිවේදනය සිදු වන විවිධ අවස්ථාවන්හි සන්නිවේදන ක්‍රියාදාමය ක්‍රියාත්මක වන ආකාරය විශ්ලේෂණය කරයි.
4. සමූහ සන්නිවේදනය සාර්ථක ව සිදු කිරීම අවශ්‍ය සාධක මොනවා දැයි විග්‍රහ කරයි.
5. සාර්ථක ලෙස සමූහ සන්නිවේදනයේ නියැලීමේ උපාය මාර්ග භාවිතයට ගනියි.
6. සමූහ සන්නිවේදනයේ විශේෂතා හඳුන්වා දෙයි.
7. සමූහ සන්නිවේදන අවස්ථාව අනුව සන්නිවේදන භූමිකාව වෙනස් වන ආකාරය සොයා බලයි.

## පාඩම සැලසුම සඳහා උපදෙස්

- සමූහ සන්නිවේදනය සිදු වන විවිධ අවස්ථා කිහිපයක් රූප රාමුවලින් වීඩියෝ දර්ශනවලින් නැරඹීමට සැලසීමෙන් පසු ඒ පිළිබඳ විමසීමෙන් පාඩමට ප්‍රවේශ විය හැකි ය.
  නැතිනම්
  අතීතයේ විවිධ සමාජ ශෝධකයන්, දාර්ශනිකයින් පොදු ජනතාව වෙත තම අදහස් දැන්වූ අයුරු පිළිබඳ සාකච්ඡාවකින් පාඩමට පිවිසිය හැකියි.
  උදා: දේශකයා නගරයේ උස් තැනකට නැගී කථා පැවැත්වීම

- සමූහ සන්නිවේදනය යන්නට සිසු අදහස් ද ලබා ගනිමින් සරල අර්ථකථනයක් ගොඩනගන්න.
  මෙහි දී,
  - එකම අරමුණක් උදෙසා එකිනෙකාට ආසන්නයේ මුහුණට මුහුණලා සිටිමින් සිදු කෙරෙන සන්නිවේදනය සමූහ සන්නිවේදනය ලෙස අර්ථකථනය විය යුතු ය. සමූහ සන්නිවේදනය - කණ්ඩායම් ගණනාවක් ඇති බවත් අරමුණ විවිධ බවත් පෙන්වා දෙන්න.

තවදුරටත් පහත කරුණු පිළිබඳව ද සාකච්ඡා කරන්න.

- විවිධ රූප රාමු මගින් ඉහත අර්ථකථනය තහවුරු කරන්න.
- මළ ගෙදරක/ මගුල් ගෙදරක සමූහය එක්ව කීපදෙනා ලෙස කථනයේ යෙදීම.
- මළ ගෙදරක/ මගුල් ගෙදරක කථාවක් පවත්වන විට සියල්ල අසා සිටින අයුරු.

- සමූහ සන්නිවේදනය කුඩා කණ්ඩායම් සන්නිවේදනය, විශාල කණ්ඩායම් සන්නිවේදනය ලෙස වර්ග කළ හැකි බව පිළිබඳ සිසුන් හා සාකච්ඡා කරන්න.
- සමූහ සන්නිවේදන ක්‍රියාවලිය ක්‍රියාත්මක වන ආකාරය උචිත ආකෘති ඇසුරින් ගොඩනගන්න.
- සමූහ සන්නිවේදනය විධිමත් ලෙස මෙන් ම අවිධිමත් ලෙස ද සිදු විය හැකි බව පෙන්වා දෙන්න.
    - විධිමත් සන්නිවේදනය උදා: අ.පො.ස. (සා.පෙළ) සම්මන්ත්‍රණ

    - අවිධිමත් සන්නිවේදනය උදා: බස් නැවතුමක පිරිසක්

- සමූහ සන්නිවේදනයේ ප්‍රබලතා දුබලතා පිළිබඳ සොයා බැලීම සඳහා සිසුන් මෙහෙයවන්න.

  උදා: - කණ්ඩායම් එක ම අරමුණකට යොමු වී කටයුතු කිරීමේ හැකියාව ලැබීම.
  - කණ්ඩායම තුළ කටයුතු කිරීමෙන් පෞරුෂය වර්ධනය වේ.

- සමූහ සන්නිවේදනය සාර්ථක කර ගැනීමට යොදා ගත හැකි උපාය මාර්ග පිළිබඳ තොරතුරු ගවේෂණයට සිසුන් යොමු කරන්න.

  උදා: - තාක්ෂණික උපාය මාර්ග - ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය

  - තාක්ෂණික නො වන උපාය මාර්ග - නායකත්වයට ගරු කිරීම

  මෙය කණ්ඩායම් ක්‍රියාකාරකම් පැවරුම් භාවිතය මගින් ඉටු කිරීම වඩා උචිත ය.

- දෙන ලද අවස්ථා සම්බන්ධයෙන් භාවිත කළ හැකි සමූහ සන්නිවේදන ක්‍රම ශිල්ප හඳුනා ගැනීමටත් ඒවා අත්හදා බැලීමටත් යොමු කරන්න.
    - ඩෙංගු මර්දන වැඩපිළිවෙළක් පිළිබඳ පාසල් ප්‍රජාව දැනුම්වත් කිරීම.
    - පාසල් ළමා පොළ පිළිබඳ පාසල් ප්‍රජාව දැනුම්වත් කිරීම.
    - උදය රැස්වීමක කථාවක් පැවැත්වීම.

## මූලික වදන්

- සමූහ සන්නිවේදනය (Group Communication)
- කුඩා කණ්ඩායම් සන්නිවේදනය (Small Group Communication)

## ගුණාත්මක යෙදවුම්

- කුඩා කණ්ඩායම් සන්නිවේදනය, විශාල කණ්ඩායම් සන්නිවේදනය සිදුවන අවස්ථා ආශ්‍රිත රූප සටහන්, වීඩියෝ දර්ශන
- තේමාවට අදාළ පොත් පත්, ලිපි ලේඛන
- සමූහ සන්නිවේදනය සාර්ථක කර ගැනීමට යොදා ගත හැකි තාක්ෂණික මෙවලම්වල රූප සටහන්

## ඇගයීම හා තක්සේරුකරණය

පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

- සමූහ සන්නිවේදනය යනු කුමක් දැයි හඳුන්වා දීමේ හැකියාව.
- සමූහ සන්නිවේදනය සිදුවන ආකාරය අනුව වර්ග කර දැක්වීමේ හැකියාව.
- සමූහ සන්නිවේදනයේ පවත්නා ප්‍රබලතා පිළිබඳ ඇගයීමක යෙදීම.
- සමූහ සන්නිවේදන උපාය මාර්ග හඳුන්වා දීම.
- සාර්ථක ලෙස සමූහ සන්නිවේදනයේ යෙදීමේ හැකියා ඇගයීම.

**නිපුණතාව 1.0** විවිධාකාරයේ සන්නිවේදන වර්ග සංසන්දනාත්මක ව හඳුනා ගනිමින් ඒවා තම ජීවිතයේ අවස්ථානුකූල ව යොදා ගනියි.

**නිපුණතා මට්ටම 1.5** තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵලයක් වශයෙන් ජන සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය හා එය සමාජගත වී ඇති ආකාරය පිළිබඳ ව විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ භාවිත වන ජන සන්නිවේදනය යනු කුමක් දැයි හඳුන්වා දෙයි.
2. ජන මාධ්‍ය වර්ගීකරණය කරයි.
3. සන්නිවේදනය සඳහා ජන සන්නිවේදනයේ වැදගත්කම අගය කරයි.
4. ජන සන්නිවේදන මාධ්‍යයන්හි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනී.
5. ජන සන්නිවේදන අරමුණු හඳුනා ගනියි.
6. ජන සන්නිවේදනය සඳහා යොදා ගනු ලබන මාධ්‍ය නම් කරයි.
7. ජන මාධ්‍යවල ප්‍රබලතා හා සීමා පිළිබඳ තොරතුරු හෙළි කරයි.
8. ජන මාධ්‍ය භාවිතයේ වැදගත්කම අගය කරයි.
9. නව මාධ්‍ය මගින් මාධ්‍ය ඒකරාශී වී ඇති ආකාරය පිළිබඳ ඇගයීමක යෙදේ.


**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- සන්නිවේදන වර්ගීකරණයේ එන විවිධ සන්නිවේදන ක්‍රම පිළිබඳ සිසු අවධානය නැවත යොමු කරවන්න.
  මේ සඳහා රූපසටහන්/ වීඩියෝ දර්ශන භාවිතයට ගත හැකිය.
  අතීතයේ සිට සමාජීය වශයෙන් දියුණුව ඇතිවීමේ දී (සමාජ පරිණාම ක්‍රියාවලිය තුළ ලබා ඇති තාක්ෂණික දියුණුව හමුවේ සමාජ ඒකකවල නිම්වළලු පුළුල් වී ඇති බව පෙන්වා දෙන්න.) මේ නිසා සන්නිවේදන වර්ගීකරණයේ ඉහත දක්වන ලද සන්නිවේදන ක්‍රමෝපායන්ට වඩා පුළුල් වූ සන්නිවේදන ක්‍රමෝපායක අවශ්‍යතාව ඇති වූ බවත් සාකච්ඡා කරන්න.
- එම අවශ්‍යතාව සපුරාලීම සඳහා ජන සන්නිවේදනය බිහිවූ බව පෙන්වා දෙන්න.
- ජන සන්නිවේදනය යනු කුමක් දැයි අර්ථ දැක්වීමට සිසුන් යොමු කරන්න.
- ජන සන්නිවේදනය අනෙකුත් සන්නිවේදනයන්ගෙන් වෙනස් වන ආකාරය පිළිබඳ සංසන්දනාත්මක ව තොරතුරු හෙළි කිරීමට සිසුන් යොමු කරන්න.
- ජන සන්නිවේදනය සඳහා යොදා ගනු ලබන ජන මාධ්‍ය නම් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- මේ ජනමාධ්‍ය
    - i. විද්‍යුත් මාධ්‍ය
    - ii. මුද්‍රිත මාධ්‍ය ලෙස වර්ග කර දැක්වීම උචිත ය.

- ජනමාධ්‍ය ලෙස පහත මාධ්‍ය නම් කිරීමට යොමු වීම සෑහේ.
    - පුවත්පත් - සඟරා
    - ගුවන්විදුලිය - නව මාධ්‍ය (අන්තර්ජාලය)
    - රූපවාහිනිය - ජංගම දුරකථනය

- මේ මාධ්‍ය එක් එක් වර්ගීකරණය යටතේ තවදුරටත් සුවිශේෂ ව වර්ග කර දැක්වීමට සිසුන්ට මගපෙන්වන්න.




- ඉහත එක් එක් ජනමාධ්‍යයන්හි ප්‍රබලතා සහ ඒවායේ සීමා පිළිබඳ තොරතුරු සොයා බැලීම සඳහා සිසු කණ්ඩායම් වෙත පවරන්න.
- මේ සඳහා බිත්ති පුවත්පත්වලට ලිපි ලිවීම, සංවාද, බුද්ධිමය සාකච්ඡා, විවාද ආදි උචිත ක්‍රම ශිල්පයක් යොදා ගත හැකිය.
- ජන සන්නිවේදනයේ කැපී පෙනෙන ලක්ෂණ ලියා දැක්වීමට සිසුන් වෙත පවරන්න.

  උදා: ජන සන්නිවේදන ක්‍රියාවලිය තුළ විධිමත් ආයතන ව්‍යුහයක් පවතී.
  වෘත්තීය සන්නිවේදකයන් සිටී.
  ග්‍රාහකයා සන්නිවේදකයා අතර සබඳතා දුරස් වේ.
- ජන සන්නිවේදන අරමුණු මොනවා දැයි සිසුන්ට පෙන්වා දෙන්න.
- තෝරාගත් සන්නිවේදන මාධ්‍යයකින් මේ අරමුණ ඉටු වන ආකාරය පිළිබඳ සරල සමීක්ෂණයක් කිරීමට සිසුන් යොමු කරන්න.
- මෙහිදී ඇතැම් මාධ්‍ය පිළිබඳ පැවති සීමාවන් වර්තමාන තාක්ෂණික දියුණුව හමුවේ අවම වී ඇති බව ද සිහිපත් කරන්න.
    - පුවත්පත කියවීමට නොදන්නා පුද්ගලයන්ට විද්‍යුත් මාධ්‍යයෙන් පුවත්පත් ලිපි පිළිබඳ තොරතුරු දැනගත හැකිය.

- රූපවාහිනියේ වරක් විකාශනය කළ වැඩසටහන නැවත පසුව නැරඹිය හැකි වීම.
- පුවත්පත දවසේ වාර කීපයක් මුද්‍රණය වීම

- 'ජන සන්නිවේදනය සමාජයට කෙතරම් වැදගත් වේද' යන්න පිළිබඳ තොරතුරු අධ්‍යයනයට උචිත ඉගෙනුම් ක්‍රමශිල්පයක් භාවිතයෙන් සිසුන් මෙහෙයවන්න.

## මූලික වදන්

- ජනසන්නිවේදනය - Mass Communication
- ජනමාධ්‍ය - Mass Media
- ජනමාධ්‍ය අරමුණු - Objectives of Mass Media

### ගුණාත්මක යෙදවුම්

- සන්නිවේදන වර්ගීකරණයේ විවිධ අවස්ථා දැක්වෙන රූප සටහන් වීඩියෝ දර්ශන.
- මාධ්‍ය ආයතනවල නම්, ලාංඡන දැක්වෙන රූප සටහන්.
- ජනසන්නිවේදනය පිළිබඳ ලියවුණු පොත්පත්, ලිපි ලේඛන

### ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- ජනසන්නිවේදනය යන්න හැඳින්වීමේ කුසලතාව ලබා තිබීම.
- ජනමාධ්‍ය වර්ග කිරීම.
- එක් එක් ජනමාධ්‍ය වර්ගවල ප්‍රබලතා හා සීමා සැසඳීම.
- ජනමාධ්‍ය භාවිතයේ වැදගත්කම ඇගයීම.
- ජනමාධ්‍ය අරමුණු හා ඉන් සමාජීය වශයෙන් සැලසෙන සෙත ඇගයීමට ලක් කිරීමේ කුසලතා තක්සේරු කිරීම.
- නූතනයේ අන්තර්ජාල භාවිතය සමග සියලු මාධ්‍ය ඒකරාශී වී ඇති ආකාරය පිළිබඳ ඇගයීමක යෙදීම.

**නිපුණතාව 2.0** සන්නිවේදනයේ විවිධ ස්වරූප අදාළ පරිදි යොදා ගනිමින් ඵලදායී සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.1** වාචික හා අවාචික සන්නිවේදනය ප්‍රායෝගික ව තමන්ගේ ජීවිතයේ විවිධ අවස්ථාවන්ට යොදා ගත හැකි ආකාරය ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

1. මිනිසා විවිධ ස්වරූපයෙන් සන්නිවේදනයේ යෙදෙන බව පෙන්වා දෙයි.
2. වාචික සන්නිවේදනයේ හා අවාචික සන්නිවේදනයේ ස්වභාවය සංසන්දනාත්මක ව හඳුන්වයි.
3. අවාචික සන්නිවේදනය සඳහා අතීතයේ සිට මේ දක්වා භාවිතයට ගනු ලබන විවිධ ක්‍රමෝපායන් විශ්ලේෂණය කරයි.
4. අවාචික සන්නිවේදනය ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් ලෙස අගය කරයි.
5. අවාචික සන්නිවේදන සාධක පිළිබඳ විස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කරයි.
6. වාචික සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා භාවිත විවිධ ක්‍රමෝපායන් විග්‍රහ කරයි.
7. සාර්ථක සන්නිවේදකයකු ලෙස සංවර්ධනය කර ගත යුතු වාචික හා අවාචික සන්නිවේදන හැකියා හඳුනා ගනියි.
8. වාචික හා අවාචික සන්නිවේදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

- මිනිසුන් විවිධ ස්වරූපයෙන් සන්නිවේදනයේ යෙදෙන ආකාරය ප්‍රදර්ශනය වන වීඩියෝ දර්ශන/ රූප රාමු ඉදිරිපත් කිරීමෙන් හෝ අභිනය රංගන ඉදිරිපත් කරවීමට සැලැස්වීමෙන් පාඩමට ප්‍රවේශ විය හැකිය. වචන භාවිතයෙන් කෙරෙන සන්නිවේදනය, වචන භාවිතයෙන් තොරව කෙරෙන සන්නිවේදනය ඇතුළත් විය යුතු ය.
- ඉහත ප්‍රවේශය මගින් මිනිසා විවිධ ස්වරූපයෙන් සන්නිවේදනයේ යෙදෙන බව සාකච්ඡා කරන්න.
- සන්නිවේදනයේ ප්‍රධාන ස්වරූප දෙකක් ලෙස පහත සන්නිවේදන අවස්ථා හඳුන්වා දෙන්න.
  - අවාචික සන්නිවේදනය
  - වාචික සන්නිවේදනය
- පොදුවේ ඉහත සන්නිවේදන ස්වරූප දෙක හඳුනා ගැනීමට යොමු කරන්න.

- වාචික සන්නිවේදනය වචන භාවිතයෙන් සිදු කරනු ලබන සන්නිවේදනය බව පහදා දෙන්න.
- එය කථන හා ලිඛිත සන්නිවේදනයේ අන්තර්ගත වන බව නිදර්ශන ඇසුරින් හඳුන්වා දෙන්න.
- අවාචික සන්නිවේදනය යනු වචන භාවිතයෙන් තොර ව සිදු වන සන්නිවේදනය බව පෙන්වා දෙන්න.
- අවාචික සන්නිවේදනය ද කථන හා ලිඛිත සන්නිවේදනයන්හි ඇතුළත් බවත්, වාචික සන්නිවේදනය ශක්තිමත් කිරීමට අවාචික සන්නිවේදනය යොදා ගත හැකි බවත් පෙන්වා දෙන්න.
- අතීතයේ භාවිත කළ සංඥා, සංකේත හා වර්තමාන සංඥා, සංකේත, ඉඟි සෙවීමට යොමු කරන්න.
- අවාචික සන්නිවේදන සංඥා, සංකේත, සන්නිවේදනයේ යෙදෙන අවස්ථාව, සංස්කෘතිය, පරිසරය ආදිය මත වෙනස් වන බව නිදර්ශන සහිතව පැහැදිලි කරන්න.
- අවාචික සන්නිවේදනය සඳහා නිදසුන් සාකච්ඡා කරන්න.
- වාචික සන්නිවේදනය තුළ අවාචික සන්නිවේදනය භාවිත වන බව සජීව ක්‍රියාකාරකම් මගින් අත්දැකීමට අවස්ථාව සලසන්න.

  උදාඃ 1. කථනයේ දී කායික ඉඟි භාවිතය
  2. වාචික සන්නිවේදනයේ දී හඬ උච්චාරණය, රිද්මය, විවිධ ශබ්ද, නිශ්ශබ්දතාව
  3. ලේඛනයේ දී විරාම ලක්ෂණ භාවිතය, ව්‍යාකරණානුකූලව ලිවීම

- සිසුන් කණ්ඩායම් ඉගෙනුමට යොමු කරමින් වාචික සන්නිවේදනය හා අවාචික සන්නිවේදනය පිළිබඳ තවදුරටත් අධ්‍යයනය සඳහා යොමු කරන්න.
  මෙහි දී, පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වන්න.
  - මිනිසා භාෂාවක් බිහි කර ගැනීමට පෙර අවාචික ව සන්නිවේදනයේ යෙදුණු ආකාරය පිළිබඳ තොරතුරු ගවේෂණය.

    උදාඃ චිත්‍ර මගින් අදහස් ප්‍රකාශනය
    අභිනය මගින් අදහස් ප්‍රකාශනය

  - සාම්ප්‍රදායික සමාජයේ අවාචික සන්නිවේදන ක්‍රම භාවිතය.

    උදාඃ බෝවන රෝග වැළඳුනු නිවසක කඩුල්ලෙහි ගොක් කොළ රැහැනක් ඇදීම.
    සමීපතයෙකුගේ අවමඟුලක් නිසා සුදු ඇඳුම් ඇඳීම හා කාන්තාවන් ආභරණ පැළඳීමෙන් වැළකීම.

  - වර්තමානයේ අවාචික සන්නිවේදනය භාවිත වන අවස්ථා.

    උදාඃ මාර්ග සංඥා
    හඬ සංඥා

- විවිධ සංස්කෘතික, ආගමික උත්සව හා බැඳුණු අවාචික සන්නිවේදන විධි ක්‍රම

  උදා: මංගල අවස්ථා

  අවමංගල අවස්ථා

  තවදුරටත් පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.
- භාෂාව නිර්මාණය කර ගැනීමෙන් පසු වාචික සන්නිවේදනය වැඩි දියුණු වූ බව පැහැදිලි කරන්න.
- භාෂාව නිර්මාණය කර ගත් පසු ලිඛිත සන්නිවේදනයට යොමු වූ බව පෙන්වා දෙන්න.

- වාචික හා අවාචික සන්නිවේදන ක්‍රම භාවිතයෙන් සැලසෙන සන්නිවේදන මෙහෙය අගය කිරීමට යොමු කරන්න. මෙහි දී වාචික, අවාචික සන්නිවේදනයේ යෙදීමේ සමාජීය වටිනාකම පෙන්වා දෙන්න.
  1. සුහදත්වය පළ කිරීම
  2. උපකාර කිරීම
  3. සහාය පළ කිරිම
- සන්නිවේදනයේ කාර්ය භාරය වෙන් වෙන් ලෙස හඳුනා ගැනීමට යොමු කරන්න.

  උදා: සුහදත්වය, උපකාර කිරීම

- වාචික සන්නිවේදනයේ සාර්ථකත්වයට ඉවහල් වන භාෂා කුසලතා පිළිබඳ තොරතුරු සොයා බැලීමට යොමු කරන්න.
- වාචික හා අවාචික සන්නිවේදන නිපුණතා සංවර්ධනය කර ගැනීමේ ප්‍රායෝගික අභ්‍යාස සඳහා සිසුන් යොමු කරන්න.
- මෙහි දී ප්‍රථමයෙන්,

  අවාචික සන්නිවේදන හැකියා සංවර්ධනය කර ගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ සිසුන් හා එක් ව සොයා බලන්න.
- අවාචික සන්නිවේදන හැකියා සංවර්ධනය කෙරෙන විවිධ විෂය බාහිර වැඩසටහන්, දේශන, පුහුණු අවස්ථා සංවිධානය කළ හැකිය.

  උදා : කාය භාෂා (Body language) භාවිතය සංවර්ධනය කිරීමේ වැඩසටහන්

- ඵලදායී ලෙස කථනයේ යෙදීමට බලපාන සාධක සොයා බැලීමට සිසුන් යොමු කරන්න.
- ඵලදායී කථනය මහජන ඇමතුම් අවස්ථා ඇසුරින් තේරුම් ගැනීමට අවස්ථා ලබා දෙන්න.
- ඵලදායී කථනය හා සම්බන්ධ සුවිශේෂතා පහත කරුණු ඇසුරින් තේරුම් ගැනීමට සලසන්න.
  1. කථකයාගේ පෙනුම ආකර්ෂණීය බව

     ඉරියව් මුහුණේ ප්‍රසන්න බව
  2. කථකයාගේ යහපත් ඇවතුම් පැවතුම්

3. කථකයාගේ හඬ හා උච්චාරණය
4. කාර්යයට පෙර සූදානම
5. කථාවක් පැවැත්වීමේ දී සැලසුම්සහගත බව
   - කථාවේ අරමුණ
   - කථාකරන්නේ කවරෙකුට ද
   - විෂය අන්තර්ගතය
   - කරුණු පෙළ ගැස්ම
6. ආකර්ෂණීය කථනය

- අවාචික සන්නිවේදනයේ අතීතයේ හා වර්තමානයේ භාවිත කළ සංඥා, සංකේත, ඉඟි සෙවීමට යොමු කරන්න.
- අවස්ථාව පරිසරය හා සංස්කෘතිය අනුව සංඥා සංකේත වෙනස් වන බව
- කථාවක් පවත්වන අවස්ථාවේ දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

  මෙහි දී පහත කරුණුවල වැදගත්කම පෙන්වා දෙන්න.
  1. හඬ පාලනය
  2. අක්ෂි සබඳතා පවත්වා ගැනීම
  3. සංවාදාත්මක ස්වරයක් යොදා ගැනීම
  4. අනවශ්‍ය ක්‍රියාවලින් වැළකීම
  5. ග්‍රාහක ප්‍රතිචාර නිරීක්ෂණය
  6. කාලය පිළිබඳ සැලකීම
- තවදුරටත් කථා පැවැත්වීමේ දී පෙරහුරු අභ්‍යාස කිරීම්, තම වාංමාලා පෝෂණය කර ගැනීම, වෙනත් කථන රටා අධ්‍යයනය ආදි ලෙස වැදගත් වන කරුණු සොයා බැලීමට යොමු කරන්න.
- සිසුන්ට ප්‍රායෝගික කථන පුහුණුවීම් ලබා දීම සඳහා විවිධ කථන අවස්ථාවන්ට යොමු කරන්න.

  උදා: සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීම,
  සම්භාව්‍ය අමුත්තෙක් සමග සංවාදය
  ආදි ලෙස වාචික සන්නිවේදනය සිදු වන අවස්ථාවන්හි දී සාර්ථක ව වාචික සන්නිවේදනය භාවිත කළ හැකි ආකාරය පිළිබඳ ප්‍රායෝගික පුහුණු අවස්ථා ලබා දිය හැකිය.

## මූලික වදන්

- වාචික සන්නිවේදනය - Verbal Communication
- අවාචික සන්නිවේදනය - Non Verbal Communication
- සන්නිවේදන ස්වරූප - Variety of Communication
- මහජන ඇමතීම් - Public Addressing

## ගුණාත්මක යෙදවුම්

- නිපුණතාවට අදාළ ව වීඩියෝ දර්ශන, රූප රාමු
- නිපුණතාවට අදාළ පොත්පත් ලිපි ලේඛන

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- සන්නිවේදන ස්වරූප නම් කිරීම.
- සන්නිවේදන ස්වරූප එකිනෙක පිළිබඳ විස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීම.
- වාචික සන්නිවේදනය තුළ අවාචික සන්නිවේදනය භාවිත වන ආකාරය.
- මිනිසා භාෂාවක් භාවිතයට පෙර අවාචික සන්නිවේදනය භාවිතයට ගත් ආකාරය.
- වර්තමානයේ භාවිත වන අවාචික සන්නිවේදන විධි ක්‍රම.
- විවිධ ජන වර්ගවලට ආවේණික අවාචික සන්නිවේදන විධි.
- වාචික සන්නිවේදනයේ හා අවාචික සන්නිවේදනයේ කාර්යභාරය හැඳින්වීම.
- වාචික සන්නිවේදනයේ භාෂා කුසලතා හැඳින්වීම.
- වාචික සන්නිවේදන, අවාචික සන්නිවේදනය ප්‍රායෝගික කුසලතා ඇගයීම.
- ඵලදායී කථන සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ඇගයීම.
- එදිනෙදා ජීවිතයේ අවස්ථාවන්ට උචිත ව වාචික හා අවාචික සන්නිවේදන විධි ක්‍රම භාවිතයෙන් සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ඇගයීම.

**නිපුණතාව 2.0** සන්නිවේදනයේ විවිධ ස්වරූප අදාළ පරිදි යොදා ගනිමින් ඵලදායී සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.2** නිවැරදි හා ඵලදායී භාෂා භාවිතය පිළිබඳ පරිචය සංවර්ධනය කර ගනිමින් ඵලදායී ලිඛිත සන්නිවේදනයේ යෙදේ.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

1. මිනිසා ලේඛනයට යොමු වූ ආකාරය කෙටියෙන් පහදයි.
2. භාෂාවේ ද්විරූපතාවක් ඇති බව හඳුනා ගනී.
3. වාචික භාෂාව හා ලිඛිත භාෂාව අතර පවත්නා සමානකම්, වෙනස්කම් සසඳයි.
4. ඵලදායී ලේඛනයක ලක්ෂණ හඳුනා ගනී.
5. විවිධ ආකාරයේ නිර්මාණාත්මක ලේඛන සකසා ප්‍රදර්ශනය කරයි.
6. එදිනෙදා ජීවිතයට අවශ්‍ය මූලික ලේඛන වාර්තා නිවැරදි ව සැකසීමේ හැකියාව ලබයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- අතීතයේ සිට මේ දක්වා භාවිතයට ගන්නා ලද විවිධ ලේඛනවල රූප රාමු/ වීඩියෝ දර්ශන පෙන්වීමෙන් පාඩමට ප්‍රවේශ වන්න.
  මෙහි දී,
  අතීතයේ භාවිත කළ රූපාක්ෂර මගින් ලිවීම
  ශිලා ලිපි, පුස්කොළ පොත්වල ලිවීම
  ආශ්‍රිත දර්ශන භාවිතයට ගත හැකිය.
- වර්තමානයේ දියුණු ලේඛන ක්‍රම පිළිබඳ ඉහත ප්‍රවේශය ඇසුරින් සාකච්ඡා කරන්න.
- අතීතයේ ලිඛිත සන්නිවේදනය සීමිත ව සිදු වූ බව පෙන්වා දෙමින් වර්තමානයේ නූතන තාක්ෂණික දියුණුව සමග ලිඛිත සන්නිවේදනය ලබා ඇති ශීඝ්‍ර වර්ධනය පිළිබඳ ගුරු සිසු අදහස් හුවමාරු කර ගන්න. මේ සඳහා ඉවහල් වී ඇති තාක්ෂණික ක්‍රමෝපා හඳුන්වන්න.
  උදා: පරිගණකයෙන් ලිවීම.

- ආරම්භයේ දී වාචික බස වැඩි දියුණු වූ බවත්, පසු ව ලිඛිත බස ආරම්භ වූ බවත් පෙන්වා දෙමින් භාෂාවේ ද්විරූපතාව පිළිබඳ සාකච්ඡාවට යොමු වන්න.
- වාචික බසට වඩා ලිඛිත භාෂාවක පවත්නා වෙනස්කම් හඳුනා ගැනීමට උපදෙස් දෙන්න.

- ඵලදායී ලේඛනයක පැවතිය යුතු ලක්ෂණ පැහැදිලි කිරීම් සහිත ව ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  සිසුන් කණ්ඩායම් කර නිතර ඇස ගැටෙන ලේඛන ආදර්ශ සපයා දී ඒවායේ දුබලතා හඳුනා ගැනීමටත්, පැවතිය යුතු ගුණාත්මක ලක්ෂණ ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබා දිය හැකිය.
  උදා: බිත්ති පුවත්පතේ ඇති ලිපියක්, පන්ති කාමරයේ ඇති පෝස්ටරයක්, සටහන් පොතක පිටුවක්

- ඵලදායී ලේඛන සම්පාදනය පිණිස ප්‍රයෝගික අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
  නිර්මාණාත්මක ලේඛනයට යොමු වීමේ අමතර පැවරුම් ලබා දීම ද කළ හැකි ය.
  - රාජකාරි ලිපි ලිවීම - වාර්තා ලිවීම - ජීව දත්ත පත්‍රිකා සැකසීම
  - නිවැරදි ව සිදු කිරීම සඳහා උපදෙස් ලබා දෙමින් කාර්යයේ නිරත කරවන්න.
    මේ සඳහා විශේෂ වැඩමුළු දින යොදා ගැනීම ද උචිත ය.

## මූලික වදන්

- රූපාක්ෂර - Pictopraph
- ශිලා ලිපි - Inscription
- ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය - Digital Printing Technology
- රාජකාරි ලිපි - Official Letters
- වාර්තා - Report
- ජීව දත්ත පත්‍රිකා - Bio data

## ගුණාත්මක යෙදවුම්

- නිපුණතාවට අදාළ ව වීඩියෝ දර්ශන, රූප රාමු
- අධ්‍යයනයට ලක් කළ යුතු ලිපි ලේඛන, පෝස්ටර්, බිත්ති පුවත්පත් ලිපි

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

මෙහි දී පහත කරුණු කෙරෙහි මූලික අවධානය යොමු විය යුතු ය.

- ලිඛිත සන්නිවේදනය සඳහා අතීතයේ දී භාවිත කළ ක්‍රමෝපා නම් කරන්න.
- භාෂාවේ ද්විරූපතාව යන්න පැහැදිලි කිරීම.
- ලිඛිත භාෂාව භාවිතයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු.
- දෛනික අවශ්‍යතා සඳහා ලියනු ලබන ලිපි ලේඛන නිවැරදි ව ලිවීමේ දක්ෂතාව ඇගයීම.
- නිර්මාණාත්මක ලේඛන කුසලතා ඇගයීම.

**නිපුණතාව 2.0** සන්නිවේදනයේ විවිධ ස්වරූප අදාළ පරිදි යොදා ගනිමින් ඵලදායී සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.3** ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදන මාධ්‍ය ස්වභාවය හා එහි ප්‍රභේද හඳුනා ගනිමින් ඒවා ඵලදායී ලෙස භාවිත කිරීමේ හැකියාව ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

1. ශ්‍රව්‍ය සන්නිවේදනය හා දෘශ්‍ය සන්නිවේදනය යන්න හඳුන්වයි.
2. ශ්‍රව්‍ය සන්නිවේදනය හා දෘශ්‍ය සන්නිවේදනය සඳහා නිදසුන් ලබා දෙයි.
3. ශ්‍රව්‍ය සන්නිවේදනය හා දෘශ්‍ය සන්නිවේදනය ප්‍රභේද කර දක්වයි.
4. අතීතයේ සිට මේ දක්වා භාවිත වන කැපී පෙනෙන ශ්‍රව්‍ය සන්නිවේදන ක්‍රම හා දෘශ්‍ය සන්නිවේදන ක්‍රම ලැයිස්තු ගත කරයි.
5. ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය සඳහා යොදා ගැනීමේ අගය පෙන්වා දෙයි.
6. ශ්‍රව්‍ය මාධ්‍ය හා දෘශ්‍ය මාධ්‍ය ප්‍රභේද ආගමික හා සංස්කෘතික වටිනාකම් සඳහා භාවිත වන ආකාරය ගවේෂණය කරයි.
7. ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදන ක්‍රම උචිත පරිදි සාර්ථක ව සන්නිවේදන කාර්ය සඳහා භාවිතයට ගනී.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- සිසුන්ට ඉතා පහසුවෙන් හඳුනාගත හැකි හඬවල් කීපයක් ශ්‍රවණයට අවස්ථාව සලසන්න. මෙම හඬ ඇසූ සැනින් හඬින් සිදු වන සන්නිවේදනය නම් කිරීමට හැකි ඒවා විය යුතු ය.

  උදා :

  ශ්‍රව්‍යඃ මගුල් බෙර හඬ, අණ බෙර හඬ, දුරකථන නාදය, ගිලන් රථ නලා හඬ, දුම්රිය හඬ, කාවඩි හඬ, සණ්ඨාර හඬ

  දෘශ්‍යඃ මාර්ග සංඥා, නිශ්ශබ්ද වන ලෙස ඇඟිල්ල කටට තබා සංඥා කිරීම, වැසිකිළි සංකේතය

- ඉහත හඬවල් හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න. එක ම හඬ විවිධ ලෙස සන්නිවේදන අර්ථ ගැන්වීමට භාවිත කරනු ලබන බව පෙන්වා දෙන්න.
- දෙවනුව 'හූ' හඬ සඳහා බහු අර්ථ ඇති බව පෙන්වා දෙන්න.
- මෙලෙසට විවිධ ශ්‍රව්‍ය මාධ්‍ය, විවිධ දෘශ්‍ය මාධ්‍ය සන්නිවේදනය සඳහා භාවිත කෙරෙන බව පෙන්වා දෙන්න.

- විවිධ හඬ පාදක කර ගනිමින් සිදු කරනු ලබන සන්නිවේදනය ශ්‍රව්‍ය සන්නිවේදනය ලෙසත්
  දෘශ්‍ය සංඥා හා සංකේත භාවිතයෙන් සිදු වන සන්නිවේදනය දෘශ්‍ය සන්නිවේදනය ලෙසත් පෙන්වා දෙන්න.
- ශ්‍රව්‍ය සන්නිවේදනය හා දෘශ්‍ය සන්නිවේදනය සඳහා නිදසුන් දැක්වීමට සිසුන් යොමු කරන්න.
- මානව පරිණාමයේ මුල් අවධිවල දී සන්නිවේදනය සඳහා දෘශ්‍ය සන්නිවේදනය භාවිත කළ අයුරු පිළිබඳ තොරතුරු ගවේෂණයට සිසුන් යොමු කරන්න.
- එකල භාවිතයට ගත් ශ්‍රව්‍ය සන්නිවේදන හඳුනා ගැනීමට යොමු කරන්න.
- වර්තමානයේ සමාජ අවශ්‍යතා මත ශ්‍රව්‍ය සන්නිවේදනය දෘශ්‍ය සන්නිවේදනය භාවිත වන අවස්ථා සඳහා තොරතුරු ගවේෂණයට සිසුන් යොමු කරන්න.

  දෘශ්‍ය සන්නිවේදනය - නිදසුන්
  මාර්ග සංඥා
  යම් ස්ථාන හෝ සේවාවන් දැක්වීමට යොදන සංඥා
  වෙළඳ ලාංඡන

  ශ්‍රව්‍ය සන්නිවේදනය - නිදසුන්
  ගිලන් රථ, ගිනි නිවීම් රථ, ජංගම වෙළෙඳුන්ගේ විවිධ හඬ

- දෘශ්‍ය සන්නිවේදන ප්‍රභේද කර දැක්වීමට සිසුන් යොමු කරන්න.
  - සාම්ප්‍රදායික දෘශ්‍ය සන්නිවේදනය
  - නූතන දෘශ්‍ය සන්නිවේදනය

  ඉහත එක් එක් සන්නිවේදනය ප්‍රභේද සඳහා නිදසුන් සොයා බැලීමට යොමු කරන්න. වීඩියෝ දර්ශන රූප රාමු භාවිතයෙන් සිසුන් අධ්‍යයන කාර්යයට යොමු කළ හැකි වේ.
- විවිධ ආගමික සංස්කෘතික අවස්ථාවන්හි දී භාවිතයට ගැනෙන ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය සංකේත හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  නිදසුන් :
  - අවමංගල අවස්ථා
  - මංගල අවස්ථා
  - දීපවාලි උළෙල
  - වෙසක් උත්සවය
  - නත්තල
- සිසුන්ගේ ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදන හැකියා සංවර්ධනයට උචිත ක්‍රියාමාර්ග සඳහා යොමුවන්න.
  ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය සඳහා යොදා ගැනෙන සංකේත සඳහා පොදුවේ ලැබී ඇති පිළිගැනීම අනුගමනය කළ යුතු බව පෙන්වා දෙන්න.
  උදා: මාර්ග සංඥා පිළිපැදිය යුතු බව
  එසේ කිරීමේ වැදගත් කම පෙන්වා දෙන්න.

එදිනෙදා ජීවිතයේ දී ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය භාවිතයට ගන්නා අවස්ථා සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

උදාඃ මළ ගෙදරක සුදු කොඩි දැමීම ප්‍රවෘත්ති වාදන හඬ

ටෙලි නාට්‍ය තේමා හඬ කාර්යාලයක සීනු හඬ

මේ සඳහා,

සමාජයේ බහුල ලෙස භාවිත වන සිසුන් විසින් දැනගත යුතු පොදු සංඥා සංකේත හඳුනා ගැනීමට යොමු කරන්න.

මහා මාර්ග දෘශ්‍ය සංකේත සෞඛ්‍ය සේවාව ආශ්‍රිත දෘශ්‍ය සංකේත හදිසි විපත්වලට අදාළ ශ්‍රව්‍ය සංකේත පෙන්වා දෙන්න.

- ශ්‍රව්‍ය සන්නිවේදන හැකියා සංවර්ධනයට පහත ක්‍රියාමාර්ග සඳහා යොමු වන්න.
- සවන්දීමේ ක්‍රියාවලිය සරල ව විග්‍රහ කරන්න.
  1. ඇසීම
  2. තේරුම් ගැනීම
  3. අවබෝධ කර ගැනීම
  4. මතක තබා ගැනීම
  5. ප්‍රතිචාර දැක්වීම

- සවන්දීම සිදු කරන ආකාරය අනුව සවන්දීමේ ප්‍රභේද කීපයක් පවතින බව පෙන්වා දෙන්න.
  1. අක්‍රීය සවන්දීම
  2. වරණීය සවන්දීම
  3. සක්‍රීය සවන්දීම
- ඉහත එක් එක් සවන්දීමේ සිදුවන අවස්ථා පිළිබඳ නිදසුන් සෙවීමට සිසුන් යොමු කරන්න.
- සවන්දීම කෙරෙහි බලපාන බාධා පහත කරුණු ඔස්සේ පෙන්වා දෙන්න.
  - භෞතික බාධා

    උදා : අවම ශබ්ද ඇති වීම, ප්‍රකාශ කරන දෙය අපැහැදිලි වීම
  - පුද්ගල බාධා

    උදා : ශාරීරික බාධා, මානසික බාධා
- ඵලදායී සවන්දෙන්නෙකු පිළිපැදිය යුතු පිළිවෙත් පිළිබඳ සොයා බැලීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පිළිබඳ මූලික අවධානය ඇති ව කරුණු ගවේෂණයට සිසුන් යොමු කරන්න.
  1. මුලින් තමා කථා කර නැවැත්වීම.
  2. කථකයා සැහැල්ලුවෙන් තැබීම.
  3. සිත එකඟ කර ගැනීම.
  4. ඉවසිලිවන්ත බව.

5. වාද කිරීම් විවේචනවලින් වැළකීම.

6. උචිත අවස්ථාවේ ප්‍රශ්න නැගීම. දිගින් දිගට ම ප්‍රශ්න නොකිරීම.

- සවන්දීමේ අවස්ථාවලට සිසුන් වඩාත් සම්බන්ධ කර ඵලදායී සවන්දීමට යොමු කරන්න.

  උදා : දේශන/ සංවාදවලට සවන්දීමට සැලසීම

## මූලික වදන්

- ශ්‍රව්‍ය මාධ්‍ය - Audio Media
- දෘශ්‍ය මාධ්‍ය - Video Media
- සම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍ය - Traditional Visual Media
- නූතන දෘශ්‍ය මාධ්‍ය - Modern Visual Media
- ලිඛිත සන්නිවේදනය - Written Communication
- ශ්‍රව්‍ය සන්නිවේදනය - Audio Communication
- දෘශ්‍ය සන්නිවේදනය - Video Communication

## ගුණාත්මක යෙදවුම්

- නිපුණතාවට අදාළ ව වීඩියෝ දර්ශන, රූප රාමු, ලිපි ලේඛන, පොත්පත්

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- ශ්‍රව්‍ය මාධ්‍ය සන්නිවේදනය දෘශ්‍ය මාධ්‍ය සන්නිවේදනය හැඳින්වීම.
- ශ්‍රව්‍ය මාධ්‍ය සන්නිවේදනය ප්‍රභේද කර දැක්වීම.
- අතීතයේ දී භාවිත වූ ශ්‍රව්‍ය මාධ්‍ය හා දෘශ්‍ය මාධ්‍ය සන්නිවේදන සංකේත.
- ශ්‍රව්‍ය මාධ්‍ය සන්නිවේදනය හා දෘශ්‍ය මාධ්‍ය සන්නිවේදන ක්‍රම ශිල්ප භාවිතයේ වටිනාකම දැක්වීම.
- ශ්‍රව්‍ය මාධ්‍ය හා දෘශ්‍ය මාධ්‍ය සන්නිවේදන ක්‍රම සාර්ථක ලෙස භාවිත කිරීමේ හැකියාව.

**නිපුණතාව 2.0** සන්නිවේදනයේ විවිධ ස්වරූප අදාළ පරිදි යොදා ගනිමින් ඵලදායී සන්නිවේදනයේ යෙදීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 2.4** සංවිධානයක පැවැත්මට විධිමත් හා අවිධිමත් සන්නිවේදනය ඵලදායී ව යොදා ගත හැකි අකාරය විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

## ඉගෙනුම් පල

1. විධිමත් සන්නිවේදනය හා අවිධිමත් සන්නිවේදනය හඳුන්වයි.
2. විධිමත් සන්නිවේදනය හා අවිධිමත් සන්නිවේදනය අතර වෙනස පහදයි.
3. විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
4. විධිමත් සන්නිවේදනය සඳහා භාවිතයට ගැනෙන සන්නිවේදන මූලධර්ම හඳුන්වයි.
5. අවිධිමත් සන්නිවේදනය සන්නිවේදන ක්‍රමශිල්පයක් ලෙස අගය කරයි.
6. අවිධිමත් සන්නිවේදනය සිදු වන ආකාරය ආකෘති ඇසුරින් විස්තර කරයි.
7. අවිධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ තොරතුරු නිදසුන් ඇසුරින් ඉදිරිපත් කරයි.

## පාඩම සැලසුම සඳහා උපදෙස්


- විධිමත් සන්නිවේදනය හා අවිධිමත් සන්නිවේදනය යන්නට සිසුන් හා එක්ව සරල ව අදහස් ගොඩනගන්න. ක්‍රම දෙකෙහි වෙනස සසඳන්න.
  - විධිමත් සන්නිවේදනය
  - අවිධිමත් සන්නිවේදනය
- විධිමත් හා අවිධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක කිරීමේ අගය සිසුන් හා සාකච්ඡා කරන්න.
- විධිමත් සන්නිවේදනයට වඩා අවිධිමත් සන්නිවේදනය ප්‍රබල වේ/ නො වේ.
- මෙවැනි සරල තේමාවක් ඔස්සේ (විනාඩි 15ක්/ 20ක් පමණ) විවාද කිරීමට අවස්ථාව ලබා දීමෙන් බුද්ධි කලම්බනය සඳහා යොමු කළ හැකිය.
- අවසානයේ දී සන්නිවේදන ක්‍රම ලෙස ඉහත ක්‍රම දෙකෙහි ම යෝග්‍යතාව සාකච්ඡා කරන්න.
- විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන මූලධර්ම පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කරවන්න.
  1. ඉහළ සිට පහළට සන්නිවේදනය
  2. පහළ සිට ඉහළට සන්නිවේදනය
  3. හරස් සන්නිවේදනය

  ඉහත සන්නිවේදන අවස්ථා සඳහා නිදසුන් ඉදිරිපත් කිරීමට යොමු කරන්න.


- සන්නිවේදනය සඳහා භාවිතයට ගැනෙන සන්නිවේදන ආකෘති කීපයක් රූපසටහන් ඇසුරින් හඳුන්වා දෙන්න.

  උදා:

  1. මෙම ආකෘති පිළිබඳ අවබෝධය ලබා දීම සඳහා සිසුන් ලවා කුඩා කණ්ඩායම් ලෙස ආකෘති භූමිකා රංගනයෙන් ඉදිරිපත් කිරීමට සැලසිය හැකිය.
  2. සිසුන් කීපදෙනෙකු පෙළගස්වා එක් අයෙකුගෙන් තව අයෙකුට පණිවිඩය ගමන් කරවන අයුරු භූමිකා නිරූපණ ඔස්සේ ඉදිරිපත් කිරීමට සැලසීම.



  3. සිසුන් වට රවුමට සිටවා පණිවිඩය යැවීම - පණිවිඩය සන්නිවේදකයා වෙත නැවත සම්බන්ධ වේ.



- අවිධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන අවස්ථා සඳහා නිදසුන් ලබා දීමට සිසුන් යොමු කරන්න.
- විධිමත් හා අවිධිමත් සන්නිවේදන හැකියා අත් කර ගැනීමට උචිත ක්‍රියාමාර්ග පිළිබඳ සිසුන් දැනුම්වත් කරන්න.

  උදා :

  1. තමා වෙත ඉහළින් කෙරෙන සන්නිවේදන කාර්යයන් සඳහා අවධානයෙන් යුතු ව සිට ලැබෙන උපදෙස් පරිදි කලට වේලාවට කටයුතු කිරීම.
     ගුරුවරයා/ විදුහල්පති දෙන උපදෙසට අනුව කටයුතු කිරීම.
  2. තමා විසින් ඉහළට සන්නිවේදනය කළ යුතු දේ පවතින විට නොපිරිහෙලා තම වගකීම නිසි කලට ඉටු කිරීම.
     මවට පියාට දැන්විය යුතු තොරතුරු දැන්වීම.

## මූලික වදන්

- විධිමත් සන්නිවේදනය - Formal Communication
- අවිධිමත් සන්නිවේදනය - Informal Communication
- සන්නිවේදන ආකෘති - Communication Models

## ගුණාත්මක යෙදවුම්

- පාසලේ ආයතනික පරිපාලන ව්‍යුහය දැක්වෙන සටහන්
- සන්නිවේදන ආකෘති පිළිබඳ දැක්වෙන ගුරු නිර්මාණ

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- විධිමත් සන්නිවේදනය, අවිධිමත් සන්නිවේදනය යන්න හැඳින්වීම.
- විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වීමේ අගය.
- අවිධිමත් සන්නිවේදන ක්‍රම ශිල්පය භාවිත වන අවස්ථා.
- විධිමත් සන්නිවේදනය සඳහා භාවිතයට ගැනෙන සන්නිවේදන මූලධර්ම.
- විධිමත් සන්නිවේදන ආකෘති.
- විධිමත් සන්නිවේදන ක්‍රම, අවිධිමත් සන්නිවේදන ක්‍රම සාර්ථක ව භාවිත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.

**නිපුණතාව 3.0** පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ දී කාර්යාලයේ දී, තොරතුරු හුවමාරු කිරීමේ දී හා පන්ති කාමරයේ දී යොදා ගන්නා මාධ්‍ය උපකරණ විධිමත් ව පරිහරණය කරයි.

**නිපුණතා මට්ටම 3.1** පරිගණකය යොදා ගෙන වාර්තාවක් නිම කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

1. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය සඳහා භාවිත වන උපකරණ හඳුනා ගනී.
2. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය හඳුනා ගනී.
3. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන යන්ත්‍ර භාවිතයේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
4. වර්තමානයේ දී පරිගණක ආශ්‍රිත සන්නිවේදන තාක්ෂණය ලබා ඇති දියුණුව විස්තර කරයි.
5. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන යන්ත්‍ර නිවැරදි ව භාවිතයට යොමු වේ.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- මාධ්‍ය තාක්ෂණික දියුණුවේ ඉතිහාසය සරල ව සිහිපත් කරන්න.
- මාධ්‍ය තාක්ෂණික දියුණුවේ ඇති වූ ප්‍රගතිය පියවර කීපයක් යටතේ සිහිපත් කරන්න.
  - මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීම.
  - ගුවන්විදුලිය සොයා ගැනීම.
  - රූපවාහිනිය සොයා ගැනීම.
  - චලන රූප නිර්මාණය.
  - දුරකථනය සොයා ගැනීම.
  - පරිගණකය සොයා ගැනීම.

- සන්නිවේදනය තාක්ෂණයේ ලැබූ විප්ලවීය වෙනසක් ලෙස තොරතුරු තාක්ෂණය හා ඩිජිටල් තාක්ෂණය සොයා ගැනීම සඳහන් කරන්න.
- තොරතුරු තාක්ෂණයේ දියුණුව සමග ඇති වූ සන්නිවේදන තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුව සිසුන් හා සාකච්ඡා කරන්න.
  ඒ යටතේ අන්තර්ජාලය මගින් ශීඝ්‍ර ලෙස ලොව පුරා තොරතුරු හුවමාරුව, ජංගම දුරකථන මගින් ශීඝ්‍ර ලෙස තොරතුරු හුවමාරුව සිදු වන බව පෙන්වා දෙන්න.
- ඩිජිටල් තාක්ෂණ දියුණුව නිසා ලබා ගත හැකි සේවාවන් සාකච්ඡා කරන්න. (මෙම කොටස සඳහා වීඩියෝ දර්ශන රූප රාමු භාවිතයෙන් වඩා සාර්ථක ඉගෙනුමකට යොමු විය හැකි ය.)

- පරිගණක ආශ්‍රිත ප්‍රකාශන උපකරණ හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.
  මේ යටතේ,
  - පරිගණක ආශ්‍රිත ප්‍රකාශනය Desk Top Publishing (DTP) හඳුන්වා දෙන්න.
  - අතීතයේ යම් මුද්‍රිත පිටපතක් ලබා ගැනීමට පැවති ඉඩකඩ සීමිත බව.
  - පිටපත් ලබා ගැනීම සඳහා අධික කාලයක් වැය වන බව.

  පෙන්වා දෙන්න.
- වර්තමානයේ පරිගණක ආශ්‍රිත ප්‍රකාශනය නිසා සැලසී ඇති වාසි අගය කිරීමට යොමු කරන්න.
- ඇඩෝබ් පේජ් මේකර් - Adobe Page Maker
  ඇඩෝබ් ඉන්ඩිසයින් - Adobe In design
  ක්වැක් එක්ස්ප්‍රස් - Quack express
  ඇඩෝබ් ෆොටෝෂොප් - Adobe Photoshop
  ඕපන්සෝස් (Open source) සංකල්ප පිළිබඳ අවධානය යොමු කරන්න.
- පරිගණකයෙන් අත් පිටපත් සැකසීම, අකුරු සංයෝජනය, පිටු සැලසුම් කිරීම, මුද්‍රණය පිටපත්කරණය සිදු කරන අයුරු පිළිබඳ මූලික අවබෝධය සඳහා යොමු කරන්න.
- මේ සඳහා ප්‍රායෝගික ඉගෙනුම් අත්දැකීම් ලැබීමට අවස්ථා සලසන්න.
- පරිගණක මුද්‍රණ යන්ත්‍ර වර්ග හඳුනා ගැනීමටත්, ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය සඳහාත් සිසුන් යොමු කරන්න.
  මේ යටතේ
  ඩොට් මුද්‍රණ යන්ත්‍ර - Dot Matrix Printer
  ලේසර් මුද්‍රණ යන්ත්‍ර - Laser Printer

- පිටපත් නිමි කටයුතු සඳහා භාවිත වන උපකරණ හා කටයුතු හඳුනා ගැනීමට අවස්ථාව සලසන්න.
  ලැමිනේට් කිරීම
  බැඳුම් උපකරණ භාවිතය
  කැපුම් යන්ත්‍රයක ක්‍රියාකාරිත්වය
- සිසුන් වෙත සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය යන විෂයයට අදාළ යම් තේමාවක් ලබා දී ඉහත ක්‍රමවේද ඇසුරින් ඒ යටතේ පොත් පිංචක් සැකසීමට යොමු කරන්න.
  උදා: සන්නිවේදන ක්‍රියාවලියේ ඓතිහාසික විකාශය
  පරිගණක ආශ්‍රිත සන්නිවේදන තාක්ෂණික මෙහෙය
- සිසුන් සකසන ලද පොත් පිංච අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීම පිළිබඳ අවධානයෙන් යුතු ව මුද්‍රිත පොතක් ලෙස සැකසීමට අවශ්‍ය යොමු කිරීම් කළ හැකිය.

මෙහි දී,

පොත සැකසීමට අදාළ උචිත ආකෘතියක් ගුරුවරයා විසින් සකසා ඉදිරිපත් කළ යුතු වේ.

උදා: කඩදාසියේ දිග පළල
යොදා ගන්නා අකුරු වර්ගය
පොතේ අන්තර්ගතය

## මූලික වදන්

- පිටු සැකසුම් - Page Layout
- ලේසර් මුද්‍රණය - Laser Printing

## ගුණාත්මක යෙදවුම්

- නිපුණතාවට අදාළ උපකරණ (දැකගැනීමට සැලසීම සඳහා)
- එක් එක් උපකරණවලින් සිදු වන කාර්ය දැක්වීමට අදාළ ඉදිරිපත් කිරීම්.

  උදා: ලැමිනේට් (Laminate) කළ ලියවිල්ලක්
  බඳින ලද පොතක්

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය හඳුනා ගැනීම.
- පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ අවශ්‍යතාව තහවුරු කිරීම.
- පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය සඳහා භාවිතයට ගැනෙන උපකරණ නම් කිරීම.
- පරිගණක ආශ්‍රිත ප්‍රකාශන යන්ත්‍රය භාවිත කුසලතා ප්‍රදර්ශනය.

**නිපුණතාව 3.0** පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ දී කාර්යාලයේ දී, තොරතුරු හුවමාරු කිරීමේ දී හා පන්ති කාමරයේ දී යොදා ගන්නා මාධ්‍ය උපකරණ විධිමත් ව පරිහරණය කරයි.

**නිපුණතා මට්ටම 3.2** විවිධ මාධ්‍ය උපකරණ භාවිතයෙන් කාර්යාලය තුළ සන්නිවේදනය ක්‍රියාත්මක කිරීමේ හැකියාව දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

1. කාර්යාලයක භාවිත වන මාධ්‍ය උපකරණ හඳුනා ගනියි.
2. කාර්යාලයක ක්‍රියාත්මක වන මාධ්‍ය ක්‍රියාවලිය විස්තර කරයි.
3. කාර්යාලීය මාධ්‍ය ක්‍රියාවලියක අවශ්‍යතාව හේතු සාධක සහිතව සනාථ කරයි.
4. කාර්යාල මාධ්‍ය උපකරණ නිවැරදි ව භාවිත කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- විධිමත් ව පවත්වාගෙන යන කාර්යාලයක් නැරඹීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. මෙහි දී පළමුව පාසලක කාර්යාලය නිරීක්ෂණයට අවස්ථාව සැලසිය හැකිය. වඩා විධිමත් කාර්යාලයක් තෝරා ගන්න. කාර්යාලයේ විධිමත් බව නිසා කටයුතු කාර්යක්ෂම ව සිදු වන අයුරු පෙන්වා දෙන්න.
- දෙවනුව මාධ්‍ය උපකරණ වඩාත් භාවිත වන වෙනත් කාර්යාලයක් නිරීක්ෂණයට අවස්ථාව සැලසිය හැකිය.
- කාර්යාල කටයුතු අතර මාධ්‍ය ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බව පෙන්වා දෙන්න. එහි දී,
    1. කාර්යාලය වෙත විධිමත් ව තොරතුරු ලබා ගැනීම
    2. තොරතුරු විධිමත් ව රැස් කිරීම
    3. තොරතුරු විධිමත් ව පිළියෙල කිරීම
    4. තොරතුරු විධිමත් ව නිකුත් කිරීම

  සිදු වන අයුරු අධ්‍යයනයට යොමු කරන්න.

  උදා: ලැබෙන ලිපිවලට පිළිතුරු යැවීම.
  ගුරු ශිෂ්‍ය පැමිණීම දෛනික පුවරුවල සටහන් කර ප්‍රදර්ශනය කිරීම.
  පරිගණක ගත කිරීම.

ඉහත අවස්ථා අධ්‍යයනයට යොමු කිරීමෙන් පසු නැවතත් එම එක් එක් අවස්ථා සඳහා භාවිතයට ගනු ලබන කාර්යාල මාධ්‍ය උපකරණ හඳුනා ගැනීමට සුවිශේෂ ව යොමු කරන්න. අවශ්‍ය වාර්තා තබා ගැනීමට උපදෙස් දෙන්න. පහත පරිදි සටහනක් පිරවීමට යොමු කළ හැකි ය.

- නිරීක්ෂණය කරන ලද කාර්යාලයේ මාධ්‍ය උපකරණ භාවිතය පිළිබඳ තොරතුරු අධ්‍යයනය සඳහා පහත වගුව භාවිතයට ගන්න.

**කාර්යාල මාධ්‍ය උපකරණ භාවිතය**

| කාර්යාල මාධ්‍ය උපකරණය | සිදුවන සන්නිවේදන කාර්යය | තවදුරටත් භාවිතයට අවශ්‍ය උපකරණ | කාර්යාල මාධ්‍ය උපකරණය |
|---|---|---|---|
| 1. නිල මුද්‍රාව<br>2. දින මුද්‍රාව<br>3. පරිගණක | තොරතුරු නිකුත් කිරීම.<br>තොරතුරු පිළියෙල කිරීම.<br>තොරතුරු නිකුත් කිරීම.<br>ගබඩා කිරීම. | | |

- කාර්යාලය වෙත විධිමත් ව ලැබෙන තොරතුරු කවරේ දැයි සොයා බැලීමට යොමු කරන්න.

  උදා: ලිපි ලැබීම

  ගුරු ශිෂ්‍ය පැමිණීම පිළිබඳ තොරතුරු

  දුරකථන ඇමතුම්

  වාචික දැනුම් දීම්
- ලැබෙන තොරතුරු විධිමත් ව පිළියෙල කර රැස් කර තබන අයුරු නිරීක්ෂණයට සලසන්න.
- ලැබෙන ලිපි දින මුද්‍රා තබා වර්ග කර අදාළ අය වෙත යොමු කිරීම.
- නාම ලේඛනවල තොරතුරු ඇසුරින් පාසලේ දෛනික පැමිණීම ගණනය කිරීම.
- කාර්යාලීය මාධ්‍ය ක්‍රියාවලිය විධිමත් ව සිදු කිරීමේ අවශ්‍යතාව සිසුන් හා සාකච්ඡා කරන්න.

  උදා: ලිපි ලැබීම

  ලැබෙන ලිපි නිසි අයුරින් ලබා ගත යුතුයි. ඒවාට නිසි පරිදි පිළිතුරු සැපයිය යුතුයි.

  ලැබෙන දුරකථන ඇමතුම්වලට නිසි පරිදි ප්‍රතිචාර දැක්විය යුතුයි.
- කළ යුතු කාර්යයන් විධිමත් ව නො කිරීමෙන් වන හානි පෙන්වා දෙන්න.

  උදා:

  ඉහළ පරිපාලනයට යැවෙන ලිපියක් නම් පිළිතුරු නොයැවීමෙන් වන හානි දක්වන්න.

  කාර්යාලයේ දී භාවිතයට ගැනෙන මාධ්‍ය උපකරණ හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.

  දින මුද්‍රණ යන්ත්‍ර

  නිල මුද්‍රා යන්ත්‍ර

  ගණක යන්ත්‍ර

  පරිගණක යන්ත්‍ර

  දුරකථනය

ආදි වශයෙන් භාවිතයට ගනු ලබන කාර්යාල මාධ්‍ය උපකරණ ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනයට යොමු කරන්න.

- දෛනික ගුරු සිසු පැමිණීම පිළිබඳ සටහන් තබා නො ගතහොත් වන හානි පෙන්වා දෙන්න. ඒවා කාටත් පෙනෙන සේ ප්‍රදර්ශනය කිරීමේ අගය සාකච්ඡා කරන්න.
- මේ අයුරින් කාර්යාලයක මාධ්‍ය ක්‍රියාවලියක අවශ්‍යතාව තහවුරු කර පෙන්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

## මූලික වදන් (Key Words)

- කාර්යාල මාධ්‍ය උපකරණ - Office Accessories
- නිල මුද්‍රා යන්ත්‍රය - Official Stamp
- දින මුද්‍රා යන්ත්‍රය - Day Stamp

## ගුණාත්මක යෙදවුම්

- කාර්යාල මාධ්‍ය උපකරණ, මාධ්‍ය උපකරණවල ඡායාරූප, මාධ්‍ය උපකරණ පිළිබඳ තොරතුරු, ඒවායේ ක්‍රියාකාරීත්වය දැක්වීමට වීඩියෝ දර්ශන.

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- කාර්යාල මාධ්‍ය උපකරණ හඳුනා ගැනීම.
- කාර්යාල මාධ්‍ය උපකරණවල භාවිතය පිළිබඳ හැකියා ප්‍රදර්ශනය
- කාර්යාලයක ක්‍රියාත්මක මාධ්‍ය ක්‍රියාවලිය විස්තර කිරීම.
- කාර්යාල මාධ්‍ය ක්‍රියාවලියක අවශ්‍යතාව තහවුරු කිරීම.

**නිපුණතාව 3.0** පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ දී කාර්යාලයේ දී, තොරතුරු හුවමාරු කිරීමේ දී හා පන්ති කාමරයේ දී යොදා ගන්නා මාධ්‍ය උපකරණ විධිමත් ව පරිහරණය කරයි.

**නිපුණතා මට්ටම 3.3** තොරතුරු හුවමාරු කිරීමේ ක්‍රියාවලිය සඳහා භාවිත වන විවිධ මාධ්‍ය උපකරණ නිවැරදි ව හා විධිමත් ව පරිහරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 06

## ඉගෙනුම් පල

1. තාක්ෂණික දියුණුව නිසා ලොව පුරා ශීඝ්‍රයෙන් තොරතුරු හුවමාරු වන ආකාරය විස්තර කරයි.
2. ලොව පුරා ශීඝ්‍ර ලෙස තොරතුරු හුවමාරු වීමේ අගය පෙන්වා දෙයි.
3. වර්තමානයේ දී භාවිත වන තොරතුරු හුවමාරු කිරීමේ උපකරණ නම් කරයි.
4. තොරතුරු හුවමාරු කිරීම සඳහා දුරකථන භාවිතය නිවැරදි ව සිදු කරයි.

## පාඩම සැලසුම සඳහා උපදෙස්

- අතීතයේ පැවති පණිවිඩ හුවමාරු කිරීමේ ක්‍රම කීපයක් රූප රාමු ඇසුරෙන් සිසු අවධානයට යොමු කරන්න.
- එදා පණිවිඩ යැවීම අද පණිවිඩ යැවීම අතර පවත්නා වෙනස්කම් සාකච්ඡා කරන්න.
- වර්තමානයේ දී ඉතා ශීඝ්‍රයෙන් ලොව විවිධ ප්‍රදේශවලට පණිවිඩ යැවීමේ හැකියාව සාකච්ඡාවට ලක් කරන්න.
- වර්තමානයේ පණිවිඩ යැවීම; තොරතුරු හුවමාරුව තෙක් වඩා සංකීර්ණ වී ඇති බවත් කාර්යක්ෂම වී ඇති බවත් සාකච්ඡා කරන්න.
- තොරතුරු හුවමාරුව සඳහා භාවිතයට ගැනෙන විවිධ උපකරණ පිළිබඳ හඳුන්වා දෙන්න.

  ඒ යටතේ,

  - දුරකථන හැඳින්වීම.
  - දුරකථනය භාවිතයට ගැනීම.
  - දුරකථන භාවිතයේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම.
  - දුරකථන භාවිතයෙන් සන්නිවේදනයේ යෙදීමේ නිවැරදි හුරුව ලබා දීම සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යොදවන්න.
  - දුරකථන සංවාද නිවැරදි ව සිදු කිරීමේ දැනුවත් බව ලබා දී භාවිතය පිළිබඳ භූමිකා රංගනවල නිරත කරවිය හැකිය.

මෙහි දී,

දුරකථන සංවාදවල පැවතිය යුතු සීමා

දුරකථන සංවාදවලට අදාළ නෛතික තත්වයන්

දුරකථන භාවිතයෙන් ඇති විය හැකි හානි අවම කර ගැනීමේ උපාය මාර්ග

පැවතිය යුතු සමාජ ආචාර ධර්ම පෙන්වා දිය යුතුය.

- යම් ස්ථානයක සිට තවත් ස්ථානයක් වෙත තොරතුරක් ලිඛිත ව සන්නිවේදනය කළ හැකි විවිධ ක්‍රම පිළිබඳ සිසු අදහස් ලබා ගන්න.

  මේ සඳහා,

  ෆැක්ස් යන්ත්‍රය භාවිතය

  විද්‍යුත් තැපෑල භාවිතය

  ජංගම දුරකථන භාවිතයෙන් SMS යැවීම

  පිළිබඳ සිසු අවධානය යොමු කරමින් ඉහත ක්‍රම භාවිතයෙන් ලිඛිත තොරතුරු සන්නිවේදනය සඳහා සිසුන් යොමු කරන්න. ක්‍රියාකාරී අත්දැකීම් පාදකව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරන්න.

  - ඉහත උපකරණ භාවිතයේ දී පැවතිය යුතු සීමා.
  - පිළිපැදිය යුතු විශේෂ උපදෙස් පිළිබඳ සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

- අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු හුවමාරු කර ගැනීමේ කාර්යය සඳහා සිසුන් මෙහෙයවන්න.

  මෙහි දී,

  පුද්ගලයෙකු/ සංවිධානයක්/ ආයතනයක් තමන් පිළිබඳ අන් අය වෙත තොරතුරු සන්නිවේදනය සඳහා වෙබ් අඩවි භාවිතයට ගන්නා අයුරු අධ්‍යයනයට යොමු කරන්න.

  වෙබ් අඩවියක අන්තර්ගතය පිළිබඳ සාකච්ඡා කරන්න.

  වෙබ් අඩවියක් පවත්වා ගැනීමේ අරමුණ/ වාසිය/ වැදගත්කම සාකච්ඡා කරන්න.

  ඉතා ප්‍රකට රාජ්‍ය ආයතන කීපයක වෙබ් අඩවි වෙත පිවිසීමට සිසුන් යොමු කරන්න.

- ඔබේ පාසල සඳහා තවමත් වෙබ් අඩවියක් නිර්මාණය කර නොමැති නම් එය නිර්මාණය කිරීම සඳහා සිසුන් ද සහභාගි කර ගන්න.
- තොරතුරු අතිවිශාල ප්‍රමාණයක් හුවමාරු කිරීමේ පද්ධතියක් ලෙස අන්තර්ජාලය හඳුන්වා දෙන්න.
- යම් පරීක්ෂා කිරීම් සඳහා භාවිත වන විද්‍යුත් උපකරණ පවතින බව පෙන්වා දෙමින් පහත උපකරණ හඳුන්වා දෙන්න.

  විද්‍යුත් පිරික්සුම් උපකරණය

  සංවෘත රූපවාහිනී

## මූලික වදන් (Key Words)

- සංවෘත රූපවාහිනී - Close circuits television
- භූමිකා රංගන - Role play

## ගුණාත්මක යෙදවුම්

- නිපුණතාවට අදාළ උපකරණ/උපකරණවල රූපරාමු

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- පණිවිඩ යැවීම සඳහා භාවිත කළ හැකි විවිධ ක්‍රම පිළිබඳ අවබෝධය
- වර්තමානයේ දී තොරතුරු හුවමාරුව සීඝ්‍රයෙන් සිදුවන ආකාරය පිළිබඳ අවබෝධය
- ලොව පුරා ශීඝ්‍ර ලෙස තොරතුරු හුවමාරුවෙන් ඇති වන බලපෑම් පිළිබඳ දැනුවත් බව
- නිවැරදි ව දුරකථන භාවිතයේ හැකියා ඇගයීම
- තොරතුරු හුවමාරුව සඳහා අන්තර්ජාලය භාවිතය පිළිබඳ මූලික අවබෝධය

**නිපුණතාව 3.0** පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ දී කාර්යාලයේ දී, තොරතුරු හුවමාරු කිරීමේ දී හා පන්ති කාමරයේ දී යොදා ගන්නා මාධ්‍ය උපකරණ විධිමත් ව පරිහරණය කරයි.

**නිපුණතා මට්ටම 3.4** ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අවශ්‍ය මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව**

**ඉගෙනුම් පල**

1. පන්ති කාමර මාධ්‍ය උපකරණවල අවශ්‍යතාව පෙන්වා දෙයි.
2. පන්ති කාමරවල සන්නිවේදන ක්‍රියාදාමය පහසු කර ගැනීම සඳහා භාවිත වන මාධ්‍ය උපකරණ හඳුනා ගනී.
3. පන්ති කාමර මාධ්‍ය උපකරණ වර්ගීකරණය කර දක්වයි.
4. පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- වීඩියෝ දර්ශන ඇසුරින් ගුරුවරයෙකු, දේශකයෙකු තම ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා විවිධ මාධ්‍ය උපකරණ භාවිතයට ගන්නා අයුරු රූප රාමු ප්‍රදර්ශනය කරන්න. නැතිනම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා ගුරුවරු/ දේශකයින් භාවිත කරන සන්නිවේදන උපකරණ දැක ගැනීමට සැලසීමෙන් පාඩමට ප්‍රවේශ වන්න.
- පාඩමට ඉහත පරිදි උචිත ක්‍රමවේදයකින් ප්‍රවේශ වූ පසු මෙම උපකරණ භාවිතයෙන් සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක ව සිදු කිරීමට ලැබෙන මෙහෙය සිසුන් දන්නා කරුණු ඇසුරින් ඇගයීමට සිසුන් මෙහෙයවන්න.
- එක් එක් පන්ති කාමර මාධ්‍ය උපකරණ සැබැවට දැක ගැනීමටත් ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධය ලැබීමටත් යොමු කරන්න.
- මෙහි දී එක් එක් උපකරණ භාවිතයේ දී සැලකිය යුතු කරුණු, තාක්ෂණික උපක්‍රම පෙන්වා දෙමින් අදාළ උපකරණ භාවිතයට අවස්ථා සැලසීම වැදගත් වේ.
  උදා: සුදු ලෑල්ලේ ලිවීමේ දී සැලකිය යුතු ශිල්පීය ක්‍රම
  එම ශිල්පීය ක්‍රම භාවිතයෙන් සුදු ලෑල්ලේ ලිවීමට යොමු කිරීම.
- සිසුන් හොඳින් දන්නා ප්‍රක්ෂේපනය නොවන මාධ්‍ය උපකරණ පිළිබඳ හඳුනා ගත් පසු ක්‍රමයෙන් වඩාත් සංකීර්ණ උපකරණ ව ප්‍රක්ෂේපනය වන පන්ති කාමර මාධ්‍ය උපකරණ හඳුන්වා දෙන්න.
- මේ යටතේ අදාළ වන උපකරණ පෙළ පොත ඇසුරින් ලබා ගන්න.

## මූලික වදන්

- සුදු ලෑල්ල - White board
- කාන්දම් ලෑල්ල - Magnatic board / Magic Board
- ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපන යන්ත්‍රය - Overhead projector (OHP)
- කදා ප්‍රක්ෂේපන යන්ත්‍රය - Slide projector
- බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය - Multimedia projector

## ගුණාත්මක යෙදවුම්

- පන්ති කාමර මාධ්‍ය උපකරණ

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිතයේ අගය පෙන්වා දීම.
- පන්ති කාමරවල භාවිත වන මාධ්‍ය උපකරණ හඳුනා ගැනීම.
- පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය.

**නිපුණතාව 4.0** ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය ආයතන හිමිකමේ ස්වභාවය ගවේෂණය කරමින්, එය මාධ්‍ය සංස්කෘතිය තුළ නිරූපණය වන ආකාරය යථාර්ථවාදී ලෙස ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම 4.1** ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය ආයතන ප්‍රභවය හා හිමිකම පිළිබඳ යථා ස්වභාවය විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

1. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනමාධ්‍ය ආයතන හඳුනා ගනියි.
2. ශ්‍රී ලංකාවේ වර්තමාන ජනමාධ්‍ය ආයතන හිමිකාරිත්වය වර්ග කර දක්වයි.
3. ශ්‍රී ලංකාවේ විවිධ මාධ්‍ය ආයතන හිමිකම යටතේ ප්‍රභවය වූ මාධ්‍ය ආයතන පිළිබඳ තොරතුරු අනාවරණය කරයි.
4. තෝරාගත් පුවත්පත් ආයතනයක සංවිධාන ව්‍යූහයට අයත් එක් එක් අංශයක ක්‍රියාකාරීත්වය පිළිබඳ මූලික තොරතුරු විශ්ලේෂණය කරයි.
5. තෝරාගත් ගුවන්විදුලි ආයතනයක සංවිධාන ව්‍යුහයට අයත් එක් එක් අංශවල ක්‍රියාකාරීත්වය පිළිබඳ සරල ව විග්‍රහ කරයි.
6. තෝරාගත් රූපවාහිනී ආයතනයක සංවිධාන ව්‍යුහයට අයත් එක් එක් අංශවල කාර්යභාරය විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- විවිධ මාධ්‍ය ආයතනවල අනන්‍යතාව හඳුනා ගැනීමට උචිත රූප රාමු, නිල ලාංඡන දක්වමින් සිසුන් දන්නා මාධ්‍ය ආයතන පිළිබඳ විමසීමක යෙදෙන්න.
  ඔවුන් ඉදිරිපත් කරනු ලබන මාධ්‍ය ආයතනවල නම් කළුලෑල්ලේ පහළට අනුපිළිවෙළට ලියන්න.
- මෙම ආයතන කිසියම් පිළිවෙළකට වර්ග කිරීමට සිසුන් යොමු කරන්න.
  මෙහි දී,
  පුවත්පත් ගුවන්විදුලිය රූපවාහිනිය
  යන බෙදීම් මතු කර ගැනීම පළමුව සිදු කරන්න.
- තවදුරටත් මේ ආයතන වර්ග කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
  වැඩසටහන්වල සමස්ත ස්වභාවය සලකා මෙම බෙදීම සිදු කිරීමට සිසුන් උනන්දු කරවන්න.
  උදා: සරල, විනෝදය මුල් කරගත් වැඩසටහන්
  බහුලව නිෂ්පාදනය වන
  විශ්වසනීය බව වගකීම පිළිබඳ තැකීම් නො කරන

සමාජ සම්ප්‍රදායන්, සම්මතයන් පිළිබඳ සැලකිලිමත් නො වන
ආයතනික පැවැත්ම තවමත් එතරම් විධිමත් නො වන
වාණිජ අරමුණු මුල් කරගත්
ශාස්ත්‍රීය වැඩසටහන් නිෂ්පාදනයට ද අවධානය යොමු කරන
විශ්වාසනීය බව වගකීම පිළිබඳ සැලකිලිමත් වන
සම්ප්‍රදාය සංස්කෘතිය අගයන වැඩසටහන් නිෂ්පාදනයට සැලකිලිමත් වන
වඩා විධිමත් ව ආයතනික කටයුතු පවත්වාගෙන යන
වාණිජ අරමුණු මෙන් ම සමාජ සුබසාධනය අරමුණු කරගත්

- මේ වෙනස්කම් කෙරෙහි මාධ්‍ය ආයතනවල හිමිකම බලපෑම් කරන බවට අදහස් මතු කර ගනිමින් පාඩමට පිවිසෙන්න.
- ශ්‍රී ලංකාවේ පවතින මාධ්‍ය ආයතනවල හිමිකම පහත ප්‍රධාන අංශ දෙක යටතේ මූලික ව හඳුන්වන්න.
  - රාජ්‍ය මාධ්‍ය ආයතන
  - පෞද්ගලික මාධ්‍ය ආයතන
- ශ්‍රී ලංකාවේ පවතින මාධ්‍ය ආයතන පිළිබඳ මූලික තොරතුරු රැස් කිරීමට සිසුන් යොමු කරන්න. (ආයතනයේ නම, නිල ලාංඡනය, සැබෑ ලාංඡන ආකෘති සපයා ගන්න. ආයතනයේ තේමා පාඨ සපයා ගන්න)

  නිදසුන්:

  ආයතනයේ නම
  ලිපිනය
  ලාංඡනය
  ආරම්භක වර්ෂය
  ජනප්‍රිය වැඩසටහන්/ ලිපි
  හිමිකම
- සිසුන් රැස් කරගත් තොරතුරු ඇසුරෙන් උචිත සැලසුම් ගොඩනගා පන්තියේ ප්‍රදර්ශනයට යොමු කරන්න.

**සැලකිය යුතුයි.**

- තවදුරටත් මාධ්‍ය ආයතන වර්ග අනුව වෙන වෙන ම ඉහත තොරතුරු ගොඩ නැගීම, අදාළ තොරතුරු වෙනත් උචිත වගුගත කිරීම් ආදී සැලසුම් මගින් ප්‍රදර්ශනය කිරීමට ද සිසුන් යොමු කළ හැකි ය.
- සපයා ගත් තොරතුරු ප්‍රදර්ශනයේ දී ඉතා ජනප්‍රිය මාධ්‍ය ආයතනවල තොරතුරු පමණක් සුවිශේෂ ලෙස දැක්වීම සෑහේ.
- සිසු කැමැත්ත අනුව මේ තොරතුරු ඇතුළත් පොත්පිංචක් නිර්මාණයට යොමු කළ හැකියි.

- සිසුන් මාධ්‍ය ආයතනවල හිමිකම පිළිබඳ මූලික තොරතුරු හඳුනාගත් පසු රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය හිමිකම, හිමිකමේ ස්වභාවය අනුව තවදුරටත් තොරතුරු ඇතුළත් වාර්තා සැකසීමට යොමු කළ හැකි ය.
- මේ තොරතුරු අධ්‍යයනයේ දී පෙළ පොත ද පදනම් කර ගනිමින් තොරතුරු ගවේෂණය සඳහා සිසුන් යොමු කළ හැකි ය.
- උචිත සැලසුම් ආශ්‍රිත ව අනෙකුත් මාධ්‍ය ආයතන පිළිබඳ තොරතුරු අධ්‍යයනයට යොමු කළ හැකිය.
- මාධ්‍ය ආයතනවල අභ්‍යන්තර ක්‍රියාකාරිත්වය පිළිබඳ තොරතුරු ගවේෂණයට සිසුන් යොමු කරන්න.
  මෙහි දී,
  පුවත්පත්, ගුවන්විදුලි රූපවාහිනී යන මාධ්‍ය ආයතනවල අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු අධ්‍යයනය සඳහා උචිත ඉගෙනුම් ක්‍රමවේද භාවිතයෙන් යොමු වන්න.
  මේ සඳහා මාධ්‍ය ආයතනවල අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් වීඩියෝ දර්ශන නැරඹීමට යොමු කිරීම ද සෑහේ.
- අවස්ථා සිද්ධි භූමිකා රංගන මගින් නිරූපණය කිරීම යන විවිධ ක්‍රමශිල්ප භාවිතයට ගත හැකි ය.
- උචිත ඉගෙනුම් ක්‍රමශිල්ප භාවිතයෙන් විවිධ මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් (පුවත්පත් ආයතන, ගුවන්විදුලි ආයතන හා රූපවාහිනී ආයතන) පහත තොරතුරු අධ්‍යයනයට යොමු කරන්න.
  - මාධ්‍ය ආයතනයක කාර්ය මණ්ඩලය
  - ඔවුන්ට අයත් කාර්යභාරයන්
  - මාධ්‍ය ආයතනයක සංවිධාන ව්‍යුහය පිළිබඳ දළ අවබෝධයක් ලබා දීම.
  - මාධ්‍ය ආයතනයක විවිධ අංශ හා ඒවායෙන් සිදුවන කටයුතු පිළිබඳ මූලික අදහසක් ලබා දීම සෑහේ.

## මූලික වදන්

- නිල ලාංඡනය - Official Logo
- තේමා පාඨය - Motto
- ආයතනයක සංවිධාන ව්‍යූහය - Organizational Structure of an Institution

## ගුණාත්මක යෙදවුම්

- ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතනවප අනන්‍යතාවය දැක්වෙන රූපසටහන්, රූපරාමු හෝ වෙනත් අදාළ ඉගෙනුම් ආධාරක.
- එක් එක් මාධ්‍ය ආයතනවල සංවිධාන ව්‍යූහය හඳුනා ගැනීමට උචිත ඉගෙනුම් ආධාරක

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ආයතන හඳුනා ගැනීමේ හැකියාව.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනමාධ්‍ය ආයතනවල හිමිකම හඳුනා ගැනීම.
- පුවත්පත්, ගුවන්විදුලිය, රූපවාහිනී ආයතනවල සංවිධාන ව්‍යූහය පිළිබඳ මූලික අවබෝධය.
- මාධ්‍ය ආයතනවල විවිධ වෘත්තීන් හා කාර්යභාරයන් පිළිබඳ මූලික අවබෝධය

**නිපුණතාව 4.0** ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය ආයතන හිමිකමේ ස්වභාවය ගවේෂණය කරමින්, එය මාධ්‍ය සංස්කෘතිය තුළ නිරූපණය වන ආකාරය යථාර්ථවාදී ලෙස ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම 4.2** ජන මාධ්‍ය ආයතන හිමිකම මාධ්‍යවේදීන් හා ග්‍රාහකයින් කෙරෙහි බලපාන ආකාරය විග්‍රහ කරයි.


**කාලච්ඡේද සංඛ්‍යාව** 03

## ඉගෙනුම් පල

1. ජන මාධ්‍ය ආයතනවල හිමිකම් ස්වභාවය කෙබඳු දැයි හඳුනා ගනී.
2. මාධ්‍ය ආයතන හිමිකම අනුව ආයතනික ප්‍රතිපත්ති වෙනස් වන ආකාරය විස්තර කරයි.
3. මාධ්‍ය ආයතනික අරමුණු අනුව එහි කාර්යමණ්ඩලයේ සේවාදායකත්වය සැපයෙන ආකාරය විස්තර කරයි.
4. මාධ්‍ය ආයතන හිමිකම, මාධ්‍යවේදීන් ග්‍රාහකයා අතර ඇති වන සබඳතාව කෙබඳු දැයි විස්තර කරයි.
5. මාධ්‍ය ආයතන හිමිකම ග්‍රාහකයා කෙරෙහි ඇති කරන බලපෑම සොයා බලයි.

## පාඩම් සැලසුම සඳහා උපදෙස්

- ජන මාධ්‍ය ආයතනවල හිමිකම විවිධ බවට පෙර උගත් කරුණු නැවත සිහිපත් කිරීමට අවස්ථාව සලසන්න.
  පහත පරිදි සකසා ගත් ගැලීම් සටහනක් කාර්යය වඩා පහසු කරවනු ඇත




- යම් මාධ්‍ය ආයතනයක හිමිකම අනුව මාධ්‍ය ආයතනයේ කටයුතු සිදු වන ආකාරය, මාධ්‍ය ආයතනයේ ප්‍රතිපත්ති වෙනස් වන අයුරු සාකච්ඡා කරන්න.
- ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන ඉහත සටහනට අනුව ගළපන්න.

පුද්ගලික අයිතිය යටතේ ඇති මාධ්‍ය ආයතනයක් තෝරාගෙන එහි

- පුද්ගලික ප්‍රතිපත්තිවල සිට පුද්ගලික අරමුණු ඉටු කර ගැනීමට යොමු වේ.
- බොහෝ විට අරමුණු සීමිතයි.
- ආයතනික ව්‍යුහය පුළුල් නොවේ. මානව සම්පත් සීමිත වන අතර අපේක්ෂිත පල පුළුල් ය.

  තවත් තොරතුරු ඇතුළත් කරන්න.

- අධ්‍යාපනික පුවත්පතක් සකසන පුද්ගලික හිමිකම සහිත පුවත්පතක් නිදසුනට ගෙන ඉහත තොරතුරු හා ගළපන්න.
- මේ අයුරින් ම කිසියම් සංවිධානයකට අයත් මාධ්‍ය ආයතන ඒවායේ ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා කරන්න.

  උදා:

  ආගමික සංවිධානයක් විසින් මෙහෙයවන ගුවන්විදුලි නාලිකාවක්

  - සංවිධානයේ පොදු ප්‍රතිපත්තිවල සිට සංවිධානයේ පොදු අරමුණු ඉටු කර ගැනීමට යොමු වේ.
  - සංවිධානයේ පොදු ඉලක්ක ඉටු කර ගැනීම අපේක්ෂා කෙරේ.
  - අරමුණු සීමිත වේ.
  - ආයතනික ව්‍යුහය පුළුල් නොවේ.

  පෞද්ගලික ව්‍යාපාර හිමිකම යටතේ ඇති මාධ්‍ය ආයතන

  - ව්‍යාපාර හිමිකරුවන්ගේ ප්‍රතිපත්තිමය තීරණ මත ක්‍රියාත්මක වේ.
  - ව්‍යාපාරික අරමුණු ඉටු කර ගැනීමට බහුල ලෙස යොමු වේ.
  - නවීකරණය බෙහෙවින් අගයයි.
  - ප්‍රබුද්ධ වින්දනයට වඩා ජනප්‍රිය වින්දනය සඳහා නිෂ්පාදනයන් කරයි.
  - විවිධ වූ වාණිජ අරමුණු යටතේ ක්‍රියාත්මක විය හැකිය.
  - ආගමික ව්‍යුහය පුළුල් සංකීර්ණ විය හැකියි.

- මෙලෙස පෞද්ගලික මාධ්‍ය ආයතනවල ප්‍රතිපත්ති පිළිබඳ තවදුරටත් තොරතුරු ගවේෂණයට යොමු කරන්න.
- රාජ්‍ය මාධ්‍ය ආයතන පිළිබඳව ද ඉහත පරිදි ම තොරතුරු රැස් කිරීමට සිසුන් යොමු කරවන්න.

  මෙහි දී,

  බුද්ධි කලම්බන සාකච්ඡා, සංවාද, කණ්ඩායම් ගවේෂණ වැනි උචිත ක්‍රමවේදයක් භාවිතයට ගත හැකිය.

**සාකච්ඡාවට ලක් කළ යුතු කරුණු**

- රාජ්‍ය මාධ්‍ය ආයතනවල

  විනයගරුක බව, සංස්කෘතිය, සාරධර්ම සංරක්ෂණය, දේශීයත්වය අගය කිරීම ආදී ලෙස ඒවාට ම අනන්‍ය වූ දේශීය මුහුණුවරකින් යුතු අනන්‍යතාවක් පවත්වා ගෙන

යාමට උත්සාහ ගන්නා බව.

උදා: ප්‍රවෘත්ති නිවේදන ශෛලිය
නිවේදක ඇඳුම පැළඳුම
කථන විලාසය

- පොදු මහජන ශුභසිද්ධිය සඳහා සේවය සැලසීමට යොමු වන බව නිදසුන් සාකච්ඡා කරන්න.

  උදා: හදිසි විපත් අවස්ථාවල දී විපතට පත් වූවන් වෙනුවෙන් සෙත සැලසීම.

- ලාභයට ම මුල් තැන නොදෙමින් විවිධ විෂය තේමා කර ගත් වැඩසටහන් විකාශනය වීම.
- කෙසේ වුව ද සියලු මාධ්‍ය ආයතන තම පැවැත්ම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන තමා විසින් උපයා ගත යුතු තත්වය හමුවේ රාජ්‍ය මාධ්‍ය ආයතන ද මුදල් ඉපයීම, ලාභය ලැබීම පදනම් කොට කටයුතු කිරීම ද සිදු වන බව
- මාධ්‍ය ආයතනවල හිමිකරුවන් තම මාධ්‍ය ආයතනයේ දැක්ම, මෙහෙවර, තේමා පාඨය තීරණය කරනු ලබන බව.
- තම ආයතනයේ අනන්‍යතාව කෙබඳු විය යුතු දැයි තීරණය කරනු ලබන බව.
- මාධ්‍ය ආයතන හිමිකරුවන් ගනු ලබන තීරණ මත මාධ්‍යය මෙහෙයවනු ලබන බව.

  උදා:

  - තම අනන්‍යතාව දේශීය මුහුණුවරක් ගත යුතු ද? නොවේ ද?
  - තම ආයතනය කොතරම් දුරට වාණිජ පරමාර්ථ කරා ගමන් කරන්නේ ද?
  - නවීකරණයන් වැළඳගන්නේ කවර ප්‍රමාණයෙන් ද?
  - තම ආයතනය දරන දේශපාලන මතවාද කවරේ ද?

    ආදි වශයෙන් මාධ්‍ය ආයතනයක හිමිකාරීත්වය තම ආයතනය මෙහෙයවන අයුරු පෙන්වා දෙන්න.

- එම මෙහෙයවීම යටතේ සංවිධාන ව්‍යුහය තුළ අවශේෂ මාධ්‍යවේදීන් කටයුතු සිදුකරන අයුරු අවබෝධය සඳහා යොමු කරන්න.

  උදා:

  - ඒ අනුව මාධ්‍යවේදියකු තම ආයතනයේ දැක්ම, මෙහෙවර, තේමා පාඨය පෙරටු කොට තම කටයුතු සිදු කරනු ලබන බව.
  - තම ආයතන ප්‍රතිපත්ති, තීරණ ක්‍රියාත්මක කිරීමට වගකීමෙන් බැඳී සිටින බව

- මාධ්‍යවේදියෙකු තම ආයතනික ප්‍රතිපත්ති මෙහෙයවීම්වලට අනුගත වෙමින් නිර්මාණශීලී ව තම ප්‍රකාශන ඉදිරිපත් කරන ආකාරය සාකච්ඡා කරන්න.

  උදා:

  - රාජ්‍ය මාධ්‍ය ආයතනයකට දේශීය සංස්කෘතිය ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිමය තීරණ පවතී නම් මාධ්‍යවේදියා කරනු ලබන ඉදිරිපත් කිරීම තුළ ඒ සඳහා ද ඉඩක් වෙන් කෙරේ.
  - පෞද්ගලික මාධ්‍ය ආයතනයක් නවීකරණය වූ සිරිත් විරිත් අගය කරයි නම්, ඉදිරිපත් කරන ප්‍රකාශය තුළ ඒ සඳහා යොමු වීමක් පැවතිය හැකිය.

- මාධ්‍ය ආයතන තුළ කුමන ආකාරයේ ප්‍රතිපත්තිමය තීරණ පැවතිය ද සෑම මාධ්‍ය ආයතනයක ම අරමුණ ග්‍රාහක පිරිස වැඩි කර ගැනීම බව පෙන්වා දෙන්න.
- මාධ්‍ය ආයතනයක පැවැත්ම රඳා පවතින්නේ ඒ වටා ඒකරාශී වන ග්‍රාහක පිරිස වටා බව හේතු සහිත ව සාකච්ඡා කරන්න.
- එහි දී මාධ්‍ය ආයතනයක් තම ග්‍රාහකයන් කවුරුන් දැයි හඳුනා ගනිමින් වැඩසටහන් ඉදිරිපත් කරනු ලබන බව පෙන්වා දෙන්න.

  මේ යටතේ සිසුන් හා මාධ්‍ය ආයතන කීපයක් තෝරා ගෙන සිසුන් හා ඒ වටා එක්වන ග්‍රාහක පිරිස විශ්ලේෂණය කරන්න. එහි දී විවිධ වයස් කාණ්ඩ ලෙස වර්ග කිරීම, වෘත්තීන් අනුව වර්ග කිරීම, අධ්‍යාපනික මට්ටම් අනුව වර්ග කිරීම, ස්ත්‍රී පුරුෂ ලෙස වර්ග කිරීම පිළිබඳ සිතීමට සිසුන් යොමු කරවන්න.
- එම මාධ්‍ය ආයතන තම ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ කවර ග්‍රාහකයන් වෙත ද යන්න මූලික හඳුනා ගැනීමක් කරන්න.

  උදාඃ බෞද්ධ නාලිකාවක් - ඉලක්ක ජනගහනය කවුරුන් ද යන්න සොයා බැලීම

  ජාතික නාලිකාවක් - විවිධ වූ ජන කණ්ඩායම් සඳහා කොතෙක් වැඩසටහන් ඉදිරිපත් කරන්නේ ද සොයා බැලීම

  ළමා වැඩසටහන්, කාන්තා වැඩසටහන්, නව යෞවනයන් සඳහා වැඩසටහන්

- මෙහි දී ද මාධ්‍ය ආයතන ප්‍රතිපත්තිමය තීරණ අනුව වාණිජ අරමුණු අනුව ඉලක්ක වන ජන කණ්ඩායම තීරණය වන බව පෙන්වා දෙන්න.

  උදාඃ වැඩිපුර මූල්‍ය ප්‍රතිලාභ ලැබීම අපේක්ෂිත ආයතනයක් එම අරමුණ ඉටු කර ගැනීමට උචිත ජනගහණයක් තෝරා ගන්නා බව.

  එලෙස ම ග්‍රාහකයින්ගේ රුචිකත්වය, ප්‍රතිපත්තිමය තීරණ, විශේෂ අවශ්‍යතා අනුව ග්‍රාහකයා තෝරා ගනු ලබන වැඩසටහන් විවිධ වන බව සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

  උදාඃ රූපලාවනය කටයුතු පිළිබඳ උනන්දු වූවන් එම වැඩසටහන් තෝරා ගැනීම.
  දේශීය සංස්කෘතිය අගයන ග්‍රාහකයන් එයට උචිත වැඩසටහන් තේරීම.
  සිසුන් දරුවන් අධ්‍යාපන වැඩසටහන් තේරීම.

- පහත කරුණු කෙරෙහි ද සිසු අවධානය යොමු කරවන්න.

  සමාජයක විවිධ වෙනස්කම් සහිත ග්‍රාහක පිරිසක් සිටින බව (රුචි අරුචිකම්, වයස, මතවාද, ආකල්ප)
- මාධ්‍ය ආයතනයක් මෙම විවිධ විෂමතා සැලකිල්ලට ගෙන විවිධ ග්‍රාහකයින්ට උචිත සේ වැඩසටහන් ප්‍රකාශන ඉදිරිපත් කිරීම සංකීර්ණ කාර්යයක් බව පැහැදිලි කරන්න.
- එහෙත් වගකීමෙන් කටයුතු කරනු ලබන බහුජන මාධ්‍ය ආයතන මෙම විවිධ ග්‍රාහක පිරිස් සලකා සිය ප්‍රකාශන ඉදිරිපත් කරනු බව පෙන්වා දෙන්න.

- එලෙස ම විවිධ ග්‍රාහක පිරිස් ඉලක්ක කර ඉදිරිපත් කෙරෙන ප්‍රකාශන කෙරෙහි ව්‍යාපාරික අනුග්‍රාහකයන් අතරමැදි ව සිට බලපෑම් එල්ල කිරීම අඩු වැඩි ලෙස සිදු වන ආකාරය සරල ව සාකච්ඡා කරන්න.

## මූලික වදන්

- මාධ්‍ය සංස්කෘතිය - Media Culture
- ආයතන හිමිකම - Ownership of institution

## ගුණාත්මක යෙදවුම්

- එක් එක් මාධ්‍ය ආයතනවල අනන්‍යතාවය වඩාත් තහවුරු කෙරෙන ප්‍රකාශන (වැඩසටහන්, ලිපිවල ආදාර්ශ)

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- ජන මාධ්‍ය ආයතනවල හිමිකම්වල ස්වභාවය හැඳින්වීම.
- ජන මාධ්‍ය ආයතනවල හිමිකම අනුව ආයතනික ප්‍රතිපත්ති වෙනස් වන ආකාරය විශ්ලේෂණය කිරීම.
- ජන මාධ්‍ය ආයතනික ප්‍රතිපත්ති අනුව එම මාධ්‍ය ආයතනික ප්‍රකාශන විවිධ වන ආකාරය හඳුනා ගැනීම.
- මාධ්‍ය ආයතනික අරමුණු අනුව මාධ්‍යවේදීන් කාර්යයෙහි නියුක්ත වන ආකාරය පිළිබඳ තොරතුරු හෙළි කිරීම.
- විවිධ මාධ්‍ය ආයතන තම ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන ඉලක්කගත ග්‍රාහකයන් හඳුනා ගැනීම.
- මාධ්‍ය ආයතන හිමිකම මාධ්‍යවේදීන් ග්‍රාහකයා අතර පවත්නා සබඳතාව විස්තර කිරීම.

**නිපුණතාව 4.0** ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය ආයතන හිමිකමේ ස්වභාවය ගවේෂණය කරමින්, එය මාධ්‍ය සංස්කෘතිය තුළ නිරූපණය වන ආකාරය යථාර්ථවාදී ලෙස ප්‍රකාශ කරයි.

**නිපුණතා මට්ටම 4.3** ජන මාධ්‍ය ආයතනයන්හි වාණිජ අරමුණු හා ප්‍රතිපත්ති ද, ජන මාධ්‍ය ආයතන හා රජය අතර පවත්නා විවිධ ස්වරූප සම්බන්ධතා ද විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 04

**ඉගෙනුම් පල**

1. ජන මාධ්‍ය ආයතන ඒවාට ම ආවේණික ප්‍රතිපත්තියමය තීරණ මත ක්‍රියාත්මක වන බව හඳුනා ගනියි.
2. ග්‍රාහකයෙකු ලෙස විවිධ මාධ්‍ය ආයතනවල ප්‍රතිපත්ති හඳුනා ගනියි.
3. මාධ්‍ය ආයතන වාණිජ අරමුණු ප්‍රකාශයට පත් කරන ආකාරය විග්‍රහ කරයි.
4. විවිධ මාධ්‍ය ආයතන රාජ්‍ය අරමුණු ප්‍රකාශයට පත්කරන ආකාරය විග්‍රහ කර දක්වයි.
5. ජන මාධ්‍ය ආයතන ක්‍රියාකාරීත්වය කෙරෙහි රජයේ මැදිහත් වීමේ ස්වභාවය හඳුනා ගනියි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

- ජනමාධ්‍ය ආයතන හා රජය අතර පවත්නා සම්බන්ධතාව අධ්‍යයනයට යොමු කරන්න.
- මෙහි දී රජය තම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම සඳහා රාජ්‍ය මාධ්‍ය භාවිතයට යොමු වන බවත්, රාජ්‍ය මාධ්‍ය ආයතන ඒ සඳහා පූර්ණ සහාය පල කරන බවත් සාකච්ඡා කරන්න.
- විකල්ප මාධ්‍ය ආයතන තමා පිළිගත් දේශපාලන මතවාද සඳහා සේවය කිරීමට යොමු වීම ද සුලබ ව සිදු වන බව පෙන්වා දෙන්න.
- බොහෝ මාධ්‍ය ඇසුරට පත්වන ග්‍රාහකයා විවිධ මාධ්‍ය ආයතනවලින් ඉදිරිපත් වන තොරතුරු තුලනය කර දැක්මක් ලබා ගන්නා බව තවදුරටත් සඳහන් කරන්න.
- මෙහි දී ග්‍රාහකයෙකු තොරතුරු දැනගැනීමේ දී විවිධ මාධ්‍ය ඇසුරු කිරීමේ අගය තහවුරු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එක් එක් මාධ්‍ය ආයතනවලට සුවිශේෂ ව එම ආයතනවල පවත්නා ප්‍රතිපත්තිමය වෙනස්කම් සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

  උදා: දේශීයත්වය අගය කිරීමේ ප්‍රතිපත්තිය.
  නවීකරණය වන ලෝකය හා ඉදිරියට යමින් දේශීය සම්ප්‍රදායන් අත්හැරීම.
  ප්‍රධාන මාධ්‍ය ආයතන කීපයක් පිළිබඳ අධ්‍යයනය සෑහේ.

- එක් එක් මාධ්‍ය ආයතන කොතෙක් දුරට වාණිජ අරමුණු කරා යොමු වේ ද සොයා බැලීමේ සමීක්ෂණයක සිසුන් නිරත කරවන්න.
  එහිදී,
  ප්‍රවෘත්ති විකාශය තුළ කී වරක් වෙළඳ දැන්වීම් පළ වේද?
  ආදී ලෙස සොයා බැලීමට සිසුන් යොමු කළ හැකි ය.
- රාජ්‍ය අරමුණු ඉටු කරවා ගැනීම සඳහා රජයට මාධ්‍ය භාවිත කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.
  උදා: රජයක් සිය පැවැත්ම තහවුරු කර ගැනීමට
  සංවර්ධන කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට
  මහජන මතය තමන් කෙරෙහි හිතකර ව පවත්වාගෙන යාම.
- මෙලෙස රාජ්‍ය අරමුණු ඉටු කර ගැනීම සිදුවීමේ දී මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් විවිධ මාධ්‍ය ආයතන විවිධ ප්‍රතිපත්තිමය තීරණවල සිට කටයුතු කරන බව පෙන්වා දෙන්න.
  උදා: ඇතැම් මාධ්‍ය රජයට පක්ෂපාතී ව කටයුතු සිදු කෙරේ.
  ඇතැම් මාධ්‍ය විකල්ප අදහස් ඉදිරිපත් කෙරේ.
- මෙලෙස ඉදිරිපත් වන විවිධ අදහස් පිළිබඳ දැනුම්වත් වීමෙන් ග්‍රාහකයා ඒ ඇසුරින් තමන්ගේ මතයක් ගොඩ නගා ගැනීම සිදු විය හැකි බව සාකච්ඡා කරන්න.
- ඇසුරු කරන මාධ්‍ය සීමා වීම ග්‍රහකයින්ගේ ආකල්ප අනුව මෙය වෙනස් විය හැකි බව ද තහවුරු වන සේ සාකච්ඡා හසුරුවන්න.
- මාධ්‍ය ක්‍රියාකාරීත්වය කෙරෙහි රජයෙන් සිදු වන මැදිහත් වීම් පිළිබඳ මූලික අවබෝධය සඳහා සිසුන් මෙහෙයවන්න.
  එහි දී,
  රජයෙන් සිදු වන මැදිහත් වීම් ඍජු හා වක්‍ර ලෙස මැදිහත් වීම් ලෙස වර්ග කරන තොරතුරු සොයා බැලීමට යොමු කරන්න.

## ගුණාත්මක යෙදවුම්

- එක් මාධ්‍ය ආයතනවල අනන්‍යතාවය තහවුරු කෙරෙන ප්‍රකාශන/ තේමාවට අදාළ වූ තොරතුරු ඉදිරිපත් කෙරෙන මාධ්‍ය ආයතන ප්‍රකාශන.

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- ජනමාධ්‍ය ආයතනවලට සුවිශේෂ ආයතනික ප්‍රතිපත්ති කීපයක් හැඳින්වීමේ හැකියාව.
- ජනමාධ්‍ය ආයතනවල ඒවාට ආවේණික විශේෂ වැඩසටහන් හැඳිනීම.
- විවිධ ජනමාධ්‍ය ආයතන වාණිජ අරමුණු ප්‍රකාශයට පත් කරන ආකාරය හැඳිනීම.
- ජනමාධ්‍ය ආයතන රාජ්‍ය අරමුණු ප්‍රකාශයට පත්කරන ආකාරය විග්‍රහ කිරීම.
- රජය ජනමාධ්‍ය ආයතන ක්‍රියාකාරීත්වය කෙරෙහි මැදිහත් වන ආකාරය පිළිබඳ අවබෝධය.

**නිපුණතාව 5.0** ජන මාධ්‍යයේ විවිධ ආකාරයේ නියෝජනයන්හි යථාර්ථය හා සමාජීය බලපෑම අර්ථකථනය කර ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.1** ජන මාධ්‍යයේ විවිධ ආකාරයේ ප්‍රකාශන තුළ සමාජීය ස්වභාව නියෝජනය වන ආකාරය යථාර්ථවාදී ලෙස අර්ථ දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

## ඉගෙනුම් පල

1. ජන මාධ්‍ය මගින් සාමාජීය නියෝජනය සිදු වන ආකාරය විස්තර කරයි.
2. ජන මාධ්‍ය මගින් සමාජීය නියෝජනය බහුල ලෙසට සිදු වන වැඩසටහන් හඳුනා ගනී.
3. යහපත් පවුල් වාතාවරණයක පැවතිය යුතු ගුණාංග හඳුන්වයි.
4. යහපත් පවුල් වාතාවරණයක පැවතිය යුතු ගුණාංග තහවුරු කිරීම සඳහා බහු ජනමාධ්‍ය මගින් ලැබිය යුතු දායකත්වය පෙන්වා දෙයි.
5. තෝරා ගන්නා ලද එක් මාධ්‍යයක එක් වැඩසටහන් ප්‍රභේදයක් ඇසුරින් යහපත් පවුල් වාතාවරණයක් තහවුරු කිරීම සඳහා ලැබෙන දායකත්වය විවේචනාත්මකව අගය කරයි.
6. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යන්න හඳුනා ගනියි.
7. ශ්‍රී ලංකාවට උචිතව ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය නියෝජනය සඳහා රූපවාහිනිය ලබා දෙන දායකත්වය විචාරාත්මක ව අගයයි.
8. වාර්ගික ඒකාබද්ධතාව සුරකෙන ලෙස කටයුතු කිරීමට ජන මාධ්‍ය යොමු වන ආකාරය සොයා බලයි.
9. ජන මාධ්‍ය යහපත් පුරවැසිභාවයෙන් යුතු පරපුරක් නිර්මාණයට උචිත පරිදි සිය ප්‍රකාශන කෙසේ හසුරුවන්නේ ද යන්න අධ්‍යයනය කරයි.
10. ජන මාධ්‍ය මානව හිමිකම් සුරකෙන හා මානව වගකීම් ඉටු කරනු ලබන සමාජයක් ගොඩනැගීමට උචිත වන සේ සිය ප්‍රකාශනයන් හසුරුවන ආකාරය සොයා බලයි.

## පාඩම සැලසුම සඳහා උපදෙස්

1. පුවත්පතක පල වී ඇති සමාජ සිදුවීම් පිළිබඳ විවිධ ලිපි කීපයක්

   උදා: ආගමික උත්සව — සංස්කෘතික උත්සව

   දේශපාලන සිදුවීම් — සමාජ විරෝධී ක්‍රියා
2. ටෙලිනාට්‍ය රූප රාමු, ගීතයක රූපරචනය, දේශපාලන සාකච්ඡා ආදි ලෙස රූපවාහිනියෙන් විකාශනය වන සමාජයේ විවිධ පැතිකඩ නියෝජනය වන වැඩසටහන්වල රූප රාමු කීපයක්.

ඉහත 1, 2 සියල්ල ඇතුළත් වීඩියෝ දර්ශන වුව ද භාවිත කළ හැකිය.

ඉහත ඉගෙනුම් ද්‍රව්‍ය ඉදිරිපත් කිරීමෙන් පසු ඒ ඇසුරින් මාධ්‍ය මගින් නියෝජනය වන්නේ සමාජයේ ම විවිධ පැතිකඩ බව අවබෝධයට යොමු වන පරිදි සාකච්ඡාව මෙහෙයවන්න.

මේ සඳහා විවිධ මාධ්‍යවල ප්‍රකාශනයන් (වැඩසටහන්, ලිපි) ඇසුරෙන් නිදසුන් දීමට යොමු කරන්න.

පහත කරුණු පිළිබඳ සිසු අවධානය යොමු කරන්න.

- සමාජයෙහි යහපත් ක්‍රියා මෙන් ම අයහපත් ක්‍රියා ද පවත්නා බව.
- සමාජය යහමගට ගැනීම මාධ්‍යයක වගකීමක් බව
- මේ නිසා සමාජයේ පවත්නා අයහපත වුවද ඉදිරිපත් කිරීමේ දී ඉන් අයහපතට යොමු වීමට ඇති ඉඩකඩ අහුරාලිය යුතු බව
- මාධ්‍යයෙන් සිදු වන සමාජ නියෝජනය පිළිබඳ අවබෝධයෙන් යුතුව මාධ්‍ය පරිහරණය කිරීමෙන් ඇති වන අයහපත් බලපෑමෙන් ඉවත් ව කටයුතු කළ යුතු බව.
- ජන මාධ්‍ය මගින් පවුල නියෝජනය වන ආකාරය පිළිබඳ අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.

  මෙහි දී,
- සමාජයේ කුඩා ම සමාජ ඒකකය පවුල බව සාකච්ඡා කරන්න.
- විස්තෘත පවුල න්‍යෂ්ටික පවුල සහ සංකල්ප දෙකෙහි වෙනස පෙන්වා දෙමින් විස්තෘත පවුලක් සමාජීය සබඳතා අතින් ඉහළ වටිනාකමක් හිමි කර ගන්නා බව පෙන්වා දෙන්න.
- පවුලකින් ඉටු විය යුතු කාර්යභාරය හඳුනා ගැනීමට යොමු කරන්න. පවුලෙන් මිනිසාගේ මූලික අවශ්‍යතා ඉටුවන බව දක්වන්න.

  උදා: ආරක්ෂාව, පෝෂණය, ආදරය
- පවුල් සංස්ථාව යහපත්ව පවත්වා ගැනීමට පවුල තුළ සිදුවිය යුතු සන්නිවේදන ක්‍රියාදාමයන් පිළිබඳ දැනුවත් වීමට සිසුන්ට අවස්ථා ලබා දෙන්න.

  උදා: ආදරය දයාව කරුණාව විශ්වාසය එකිනෙකාට ගෞරවය ගොඩනැගෙන සේ වාචික, අවාචික සන්නිවේදනය සිදුවිය යුතුයි.

  මේ සඳහා නිදසුන් තවදුරටත් සාකච්ඡා කරන්න.

  - සිරිත් විරිත් සම්මත පිළිබඳ පවුලේ නව සාමාජික පවුලේ නව සාමාජිකයින් දැනුම්වත් කිරීම.
  - පවුලේ අනන්‍යතාව රැකෙන පරිදි සිදුවන වාචික අවාචික සන්නිවේදනය.
  - නිවසේ පෙනුම
  - සාමාජිකයන් අඳින පළඳින විලාශය
  - කථා විලාසය
  - අසල්වැසියන්, මිතුරන් ආගන්තුකයින් හා සබඳතා පවත්වන විලාසය.
- ජන මාධ්‍ය මගින් යහපත් පවුල් සංස්ථාවන් ගොඩනැගීම සඳහා දායක විය යුතු ආකාරය පිළිබඳ අධ්‍යයනයට යොමු කරන්න.

උදා:

- පවුල්වල සමගිය තහවුරු කිරීම.
- නො බිඳුණු පවුල්වල අගය වටිනාකම තහවුරු කිරීම.
- පවුලේ වැඩිහිටියන්ට දක්වන ගෞරවය සැලකිල්ල අගය කර පෙන්වීම.
- වඩවඩාත් සමාජයේ යහපත් ලක්ෂණ ඇගයීමට ලක් කළ යුතු බව
- සාම්ප්‍රදායික සිරිත් විරිත්, සංස්කෘතික සම්ප්‍රදායන් ඉදිරියට පවත්වා ගැනීමට ලබා දෙන දායකත්වය.

- මාධ්‍ය මගින් යහපත් පවුල් සංස්ථාවක් ගොඩනැගීමට දක්වන දායකත්වය කෙබඳු ද යන්න සමීක්ෂණය සඳහා/ අධ්‍යයනය සඳහා සිසුන් යොමු කරන්න.
  මෙහිදී තෝරා ගන්නා මාධ්‍යයක එක් වැඩසටහන් ප්‍රභේදයක් සුවිශේෂ ව අධ්‍යයනයට යොමු කිරීම ද සෑහේ.
  උදා: ටෙලි නාට්‍ය, පුවත් පත් විශේෂාංග ලිපි, රූපවාහිනී සාකච්ඡා, ගුවන්විදුලි ගීත, වෙළඳ දැන්වීම්
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සංකල්පය (ශ්‍රී ලංකාවට උචිත පරිදි) ගොඩනැගීමට මාධ්‍ය දායක වන ආකාරය අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.
  මෙහි දී,
  ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංකල්පය සරල ව පැහැදිලි කර දෙන්න.
  ස්ත්‍රියට සමාජයේ නිසි තැන ලබා දීම සිදුවිය යුතු බවට අදහස් මතු කර ගනිමින් සංවාදයට සිසුන් යොමු කරවා ගන්න.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු වන සේ මාධ්‍ය සිය ප්‍රකාශනයන් සිදු කරන ආකාරය සොයා බැලීමට සිසුන් යොමු කරන්න.
  උදා: කාන්තාවන්ට නිසි ගෞරවය රැකවරණය සැපයේ ද?
  රැකියා අවස්ථාවන් සඳහා කාන්තාවන්ට නිසි තැන සැපයේ ද?
- මාධ්‍ය ඉදිරිපත් කිරීම්වල දී පුරුෂ මෙන් ම කාන්තා නියෝජනය නිසි පරිදි සිදු වේ ද?
- ජනමාධ්‍ය මගින්;
  වාර්ගිකත්වය තහවුරු වන පරිදි සිය ප්‍රකාශයන් ඉදිරිපත් වීම කෙසේ සිදුවේ දැයි අධ්‍යයනය සඳහා සිසුන් යොමු කරන්න.
  මෙහි දී,
  ජන වාර්ගික ඒකාබද්ධතාව යන සංකල්පය අවබෝධය සඳහා උචිත සාකච්ඡාවක් මෙහෙයවන්න.
  වාර්ගිකත්වය පිළිබඳ භේදයෙන් තොරව පොදු හැඟීම ජනතාව තුළ වර්ධනය වීමේ අගය සාකච්ඡා කරන්න.
- ජනමාධ්‍ය ප්‍රකාශයන් සිදු කිරීමේ දී ජන වාර්ගික ඒකාබද්ධතාව තහවුරු වන සේ සිය ප්‍රකාශයන් කෙසේ සිදු වේ දැයි අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.
  නිදසුන්:
  වාර්ගික ඒකාබද්ධතාව තහවුරු වන වැඩසටහන් හඳුනා ගැනීමට යොමු කරන්න.
  භාෂා ත්‍රිත්වයෙන් ම ඒ ඒ ජනවර්ගවල සංස්කෘතික අනන්‍යතාව නියෝජනය ද සැලකිල්ලට ගෙන ඉදිරිපත් වන වැඩසටහන් මොනවා ද?

- ජන මාධ්‍ය ප්‍රකාශනයන් මගින් යහපත් පුරවැසියකු බිහි වීමට උචිත පෝෂණය ලබා දීම කොතෙක් උචිත පරිදි සිදු වේ ද අධ්‍යයනය සඳහා යොමු කරන්න.
  මෙහි දී යහපත් පුරවැසියන් ගොඩනැගීමට වඩාත් දායක වන වැඩසටහන්/ ලිපි මොනවා දැයි ලැයිස්තු ගත කිරීමට යොමු කරන්න. එක් එක් වැඩසටහන්වල දායකත්වය (පන්තිය ඉදිරියේ) අගය කිරීමට සිසුන්ට අවස්ථාව සපයන්න.
  - මානව හිමිකම් හා වගකීම් පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සඳහා මාධ්‍ය දායකත්වය ලබා දෙන ආකාරය අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.
    මෙහි දී,
    - මානව හිමිකම් හා වගකීම් යන්න සරලව හඳුනා ගැනීමට යොමු කරන්න.
    - මානව හිමිකම් හා වගකීම් ඉටු වීමේ අගය පිළිබඳ අවබෝධය සඳහා සිසුන් යොමු කරන්න.
    - මානව හිමිකම් හා වගකීම් තහවුරු වන පරිදි මාධ්‍ය ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය සඳහා සිසුන් යොමු කරන්න.
      මෙහි දී සිසුන් එක් මාධ්‍යයක එක් වැඩසටහන් ප්‍රභේදයක් පිළිබඳ අවධානයට යොමු කිරීම සෑහේ.
  - ඉහත දක්වා ඇති පරිදි සිසුන් මාධ්‍ය භාවිතයෙන් තොරතුරු ගවේෂණයට යොමු කිරීමේ දී
    කේවල පැවරුම් හෝ කණ්ඩායම් පැවරුම් ලබා දීමෙන් සමීක්ෂණ, බුද්ධි කලම්බන සාකච්ඡා, විවාද, සංවාද, කථික තරඟ ආදී විවිධ ඉගෙනුම් ක්‍රම සඳහා යොමු කළ හැකිය.

## මූලික වදන් (Key Words)

- වාර්ගිකත්වය - Ethnisity
- පුරවැසිභාවය - Citizenship
- මානව හිමිකම් - Human Rights

## ගුණාත්මක යෙදවුම්

- තේමාවට අදාළ පුවත්පත් ලිපි/ වීඩියෝ දර්ශන/ රූපරාමු/ මාධ්‍ය ප්‍රකාශන

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

මෙහිදී පහත කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න.

- මාධ්‍ය ආයතන ඉදිරිපත් කරනු ලබන වැඩසටහන් වඩාත් සමාජීය සංවර්ධනයට හිතකර ව ඉදිරිපත් කළ යුතු ආකාරය.
- පවුල් සංස්ථාව වර්ග කර දැක්වීම.
- යහපත් පවුල් සංස්ථාවක් පවත්වා ගැනීමට පවුලෙන් ඉටු විය යුතු කාර්යභාරය.

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංකල්පය හැඳින්වීම.
- ශ්‍රී ලංකාවට උචිත පරිදි ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංකල්ප සංවර්ධනය විය යුත්තේ කෙසේ ද? යන්න.
- ජන මාධ්‍ය මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය නියෝජනය සිදු වන ආකාරය.
- ජන මාධ්‍ය මගින් සිදු කෙරෙන විවිධ ප්‍රකාශන තුළ වාර්ගිකත්වය ඉදිරිපත් වීම සිදු වන ආකාරය.
- ජන මාධ්‍ය ප්‍රකාශන මගින් යහපත් පුරවැසියකු තැනීමට දායකත්වය සපයන ආකාරය.
- ජන මාධ්‍ය මගින් මානව හිමිකම් හා වගකීම් පිළිබඳ ජනතාව දැනුම්වත් කෙරෙන ආකාරය.

**නිපුණතාව 5.0** ජන මාධ්‍යයේ විවිධ ආකාරයේ නියෝජනයන්හි යථාර්ථය හා සමාජීය බලපෑම අර්ථකථනය කර ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.2** ජන මාධ්‍යයේ විවිධ ආකාරයේ ප්‍රකාශනයන් තුළ ආර්ථික ස්වභාව නියෝජනය වන ආකාරය යථාර්ථවාදී ලෙස අර්ථ දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

1. ජන මාධ්‍යවල විවිධ ප්‍රකාශන මගින් වැඩලෝකය හා විවිධ වෘත්තීන් හඳුන්වා දෙන ආකාරය විග්‍රහ කරයි.
2. ජන මාධ්‍යවල විවිධ ප්‍රකාශන මගින් වෙළඳපොල පිළිබඳ හඳුන්වා දෙන ආකාරය පිළිබඳ විචාරාත්මක ව අදහස් දක්වයි.
3. ජන මාධ්‍යවල විවිධ ප්‍රකාශන මගින් සංවර්ධනාත්මක චින්තනය සඳහා ජනතාව යොමු කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග අගය කරයි.

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

- පැරණි ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක මිනිසුන්ගේ ජීවනෝපාය කාර්ය පිළිබඳ සාකච්ඡා කිරීම/ රූප සටහන් වීඩියෝ දර්ශන පෙන්වීම මගින් අතීතයේ සමාජ ක්‍රමයේ පැවති වැඩලෝකය පිළිබඳ හඳුන්වා දීමක් කරන්න.
- මේ සාකච්ඡාව ඇසුරින්,
  - කෘෂිකර්මාන්තය ආශ්‍රිතව බහුල ලෙසට රැකී රක්ෂා කළ බව
  - කාර්මික රැකියා සීමිත වූ අතර කෘෂිකාර්මික ජීවිතයට අවශ්‍ය උපකරණ මෙවලම් තනා දීමට යොමු ව පැවති බව
  - එදා වැඩලෝකය සමාජ ඉල්ලුමට ප්‍රමාණවත් වූ බව
  - අධ්‍යාපනය, වැඩලෝකය එකට ගැලපීම

    සිදු වූ අයුරු සාකච්ඡා කරන්න.
  - දෙවනුව වර්තමාන සමාජයේ වැඩලෝකය වඩා සංකීර්ණ වී ඇති අයුරු සාකච්ඡා කරන්න.

    රැකියා අති විශාල ප්‍රමාණයක් ඇති බව

    වැඩලෝකයේ ඉල්ලුමට සරිලන සේවක සැපයීමක් නො වන බව

    අධ්‍යාපනය වැඩ ලෝකය අතර දුරස් බව පෙන්වා දෙන්න.
- ජන මාධ්‍ය මගින් පොදු ජනයා වෙත කොතෙක් සාර්ථක ව වැඩලෝකය පිළිබඳ තොරතුරු හෙළි කෙරේ දැයි සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

- ජන මාධ්‍ය මගින් පොදුජනයා වෙත කොතෙක් දුරට පහත තොරතුරු ඉදිරිපත් කෙරේ දැයි අධ්‍යයනයට යොමු කරන්න.
  1. වැඩලෝකයේ ස්වභාවය නිරූපණය
  2. නූතන වැඩලෝකයේ පවතින රැකියා අවස්ථා පිළිබඳ දැනුවත් කෙරේ ද?
  3. වැඩලෝකයේ විවිධ අවස්ථා සඳහා පොදු ජනයාට පිවිසීමට අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කෙරේ ද?
- ජන මාධ්‍ය මගින් වර්තමාන වැඩලෝකය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීමේ අවශ්‍යතාව සිසුන් හා සාකච්ඡා කරන්න.

  මෙහි දී,
  - සම්ප්‍රදායික වැඩලෝකයේ පැවති රැකියා අවස්ථා
  - වර්තමානයේ විවිධ රැකියා ක්ෂේත්‍රවල පවතින රැකියා අවස්ථා බහුල බව හා එබඳු අවස්ථා කවරේද යන්න හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න.
  - වර්තමාන වැඩලෝකයේ පවත්නා විවිධ රැකියා අවස්ථා හඳුන්වා දීමට ජන මාධ්‍ය මගින් ඉටු කළ හැකි මෙහෙය කෙබඳු දැයි සොයා බැලීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

    උදා: විවිධ රැකියා අවස්ථා පිළිබඳ දැනුම්වත් කිරීම

    සාම්ප්‍රදායිකව පිළිගත් රැකියා වෙනුවට පවතින නව රැකියා අවස්ථා ප්‍රචලිත කිරීමේ ආකල්පමය වෙනසක් ඇති කිරීම. (වෛද්‍ය, ඉංජිනේරු රැකියා උසස් ලෙස සැලකීම වෙනුවට නූතනයේ පිළිගත් වෙනත් ඉහළ රැකියා අවස්ථා ඇති බව පෙන්වා දීම.)
- වර්තමාන වෙළෙඳපොළ ආර්ථිකය පිළිබඳ මූලික දැනුවත් බව සඳහා සිසුන් යොමු කරන්න.

  එහි දී වෙළෙඳපොළ, කෘෂිකර්මාන්ත, කර්මාන්ත සේවා පදනම් ව ඇති බවත් දේශීය වෙළෙඳපොළ මෙන් ම විදේශීය වෙළෙඳපොළ ලෙස වෙළෙඳපොළ වර්ග කළ හැකි බවත් මූලික ව සඳහන් කරන්න.
- දේශීය වෙළෙඳපොළ හඳුන්වා දීම දේශීය වෙළෙඳපොළ ප්‍රවර්ධනය සඳහා ජනමාධ්‍ය මගින් ඉදිරිපත් වන විවිධ ප්‍රකාශ මගින් සැලසෙන සේවය සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

  මේ සඳහා,

  සමීක්ෂණ, කණ්ඩායම්/කේවල පැවරුම් ලබා දීම, බුද්ධි මණ්ඩල සාකච්ඡා උපයෝගි කර ගත හැකිය.
- ජන මාධ්‍ය මගින් ජනතාව සංවර්ධනාත්මක චින්තනයට යොමු කෙරෙන ආකාරය සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

  මේ සඳහා,

  ජන මාධ්‍යවල විවිධ ප්‍රකාශයන් තෝරාගෙන (උදා: ගීත, ටෙලිනාට්‍ය, පුවත්පත් ලිපි, වෙළඳ දැන්වීම්) ඒවා මගින් කොතෙක් දුරට ජනතාව සංවර්ධනාත්මක චින්තනය සඳහා යොමු කෙරේ දැයි සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

## මූලික වදන් (Key Words)

- වැඩලෝකය - World of work
- වෙළෙඳපොළ - Market
- සංවර්ධනාත්මක චින්තනය - Development Thinking

## ගුණාත්මක යෙදවුම්

- නිපුණතාවට අදාළව තෝරා ගන්නා ලද පුවත්පත් ලිපි, වෙළඳ දැන්වීම්, රූප රචනා සහිත ගීතවල වීඩියෝ දර්ශන ගීත (ශ්‍රව්‍ය)

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

මෙහිදී පහත කරුණු පිළිබඳ සැලකිලිමත් වන්න.

- ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික වැඩලෝකය හැඳින්වීම.
- වර්තමානයේ වැඩලෝකය පුළුල් වී ඇති ආකාරය, වර්තමාන වැඩලෝකයේ පවත්නා විවිධ රැකියා අවස්ථා හැඳින්වීම.
- ජනමාධ්‍ය මගින් වර්තමාන වැඩ ලෝකය පිළිබඳ තොරතුරු ඉදිරිපත් වන වැඩසටහන් පිළිබඳ විචාරාත්මක ව අදහස් දැක්වීම.
- ජනමාධ්‍ය මගින් වර්තමාන වෙළෙඳපොළ ආර්ථිකය පිළිබඳ ජනතාව දැනුවත් කෙරෙන ආකාරය පිළිබඳ විචාරාත්මක ව අදහස් ඉදිරිපත් කිරීම.
- ජනමාධ්‍ය මගින් ජනතාව සංවර්ධනාත්මක චින්තනයට යොමු කෙරෙන ආකාරය පිළිබඳ තොරතුරු ගවේෂණය.

**නිපුණතාව 5.0** ජන මාධ්‍යයේ විවිධ ආකාරයේ නියෝජනයන්හි යථාර්ථය හා සමාජීය බලපෑම අර්ථකථනය කර ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.3** ජන මාධ්‍යයේ විවිධ ආකාරයේ ප්‍රකාශයන් තුළ ආගමික හා සදාචාරාත්මක ස්වභාවය නියෝජනය වන ආකාරය යථාර්ථවාදී ලෙස අර්ථ දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

## ඉගෙනුම් පල

1. ජන මාධ්‍ය ප්‍රකාශනයන්ගෙන් රටේ ආගමික සහජීවනය පවත්වා ගැනීම සඳහා ලැබෙන දායකත්වය අගය කරයි.
2. ජන මාධ්‍ය මගින් රටේ සදාචාර හා සාරධර්ම මානව ධර්මතා සංවර්ධනයට සිදු කෙරෙන මෙහෙය කෙබඳු දැයි අනාවරණය කරයි.
3. රටක යහපැවැත්මට දායක වන පරිදි සමාජ ප්‍රතිරූප ගොඩනැංවීම සඳහා බහුජන මාධ්‍ය යොමු වන ආකාරය විස්තර කරයි.
4. ගැටුම් වළක්වාලීමටත් සාමය ආරක්ෂා කිරීමටත් උචිත පරිදි බහුජන මාධ්‍ය සිය ප්‍රකාශන මෙහෙයවන ආකාරය කෙබඳු දැයි තොරතුරු හෙළි කරයි.

## පාඩම සංවර්ධනය සඳහා උපදෙස්

- ආගමික සහජීවනය තහවුරු කෙරෙන රූප රාමු, වීඩියෝ දර්ශන, භූමිකා රංගන ගීත හෝ වෙනත් උචිත ප්‍රවේශයක් යොදා ගනිමින් ආගමික සහජීවනයේ අගය වටිනාකම පිළිබඳ සිසුන් හා කථාබහක යෙදෙන්න.
- ආගමික සහජීවනය පවත්වා ගැනීම සඳහා ජන මාධ්‍ය ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය සඳහා සිසුන් යොමු කරන්න.
  මෙහි දී,
  ආගමික සහජීවනය තහවුරු වන පරිදි ඉදිරිපත් වන වැඩසටහන් පිළිබඳ අධ්‍යයනයට සිසුන් මෙහෙයවන්න.
  උදා:
  - විවිධ ආගමික උත්සවවල අගය සහ ඒවායේ ආගමික අර්ථ නියෝජනය සිදු වන ආකාරය,
  - විවිධ සංස්කෘතික උත්සව, විවිධ ආගමික ජනතාව සම්බන්ධ වන ආකාරය
  - විවිධ ආගමික නායකයින් එකට හිඳුවා සිදු කෙරෙන සාකච්ඡා සංවාද සහිත වැඩසටහන්.
  - විවිධ ආගමික නියෝජිතයින් එක්ව පෙනී සිටින වැඩසටහන්.

- ටෙලිනාට්‍ය, ගුවන්විදුලි නාට්‍ය මගින් ආගමික සහජීවනය තහවුරු වන අයුරු සොයා බැලීමට යොමු කරන්න.

- ආගමික සහජීවනය සඳහා ජන මාධ්‍ය මගින් ඉටුවිය යුතු මෙහෙය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන් වෙත පවරන්න.
- සදාචාර හා සාරධර්ම, මානව ධර්මතාවන් පැවතීමේ අගය පිළිබඳ තොරතුරු සොයා බැලීමට සිසුන් යොමු කරන්න.
- මානව සමාජය තුළ මෙම ධර්මතා සංවර්ධනය සඳහා ජන මාධ්‍ය මගින් ඉටුවන මෙහෙය විමර්ශනාත්මක ව අගය කිරීමට සිසුන් යොමු කරන්න.

  උදා: ගුවන්විදුලි නාට්‍ය/ ටෙලි නාට්‍ය මගින් මානවීය ගුණධර්ම, සමාජ සාරධර්ම, සදාචාර පුරුදු ඉදිරිපත් වීම සතුටුදායක දැයි සොයා බැලීම.
- ගුවන්විදුලි ගීත/ රූපවාහිනී ගීත රූප රචනා මගින් ඉහත තත්වයන් නියෝජනය කෙබඳු ද?
- ජනමාධ්‍ය මගින් සමාජයට පූර්වාදර්ශ ලබා දිය හැකි සමාජ ප්‍රතිරූප හඳුන්වා දීම, ගොඩනැංවීම සාර්ථක ව සිදු වේ දැයි සොයා බැලීමට සිසුන්ට මග පෙන්වන්න. මෙහි දී,
  - ළමා පරපුරට, නව යෞවනයන්ට ආදර්ශයට ගත හැකි සමාජ ප්‍රතිරූප
    ගොඩනැගීම
    කෙබඳු ද?
  - වැඩිහිටි පිරිසට ආදර්ශයට ගත හැකි උචිත සමාජ ප්‍රතිරූප ගොඩනැගීම
    කොතෙක්
    සාර්ථක ව සිදු වේ ද?

  ඉහත කරුණු සඳහා විවේචනාත්මක ව පිළිතුරු සැපයීමට සිසුන් යොමු කරන්න.
- ගැටුම වළක්වා සාමය ඇති කිරීමට මාධ්‍ය ආයතන ගනු ලබන ක්‍රියාදාමයන් මොනවා ද සොයා බැලීමට සිසුන් යොමු කරන්න.

## මූලික වදන් (Key Words)

- ආගමික සහජීවනය - Religions Co-existance
- සාරධර්ම ඇගයීම - Values

## ගුණාත්මක යෙදවුම්

- ආගමික සහජීවනය තහවුරු කෙරෙන විවිධ මාධ්‍ය ප්‍රකාශන ආදර්ශ
- සදාචාරය, සාරධර්ම, මානව ධර්මතා අගය කෙරෙන අදාළ ඉගෙනුම් ආධාරක/ මාධ්‍ය ප්‍රකාශන, ආදර්ශ

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- ජන මාධ්‍යයන්ගේ විකාශනය වන ආගමික සහජීවනය පවත්වා ගැනීමට දායක වන වැඩසටහන් හඳුනා ගැනීම.
- ජන මාධ්‍යයන්ගෙන් විකාශනය වන ආගමික නිදහස පවත්වා ගැනීමට නිර්මාණය වන වැඩසටහන්වල යෝග්‍ය බව කෙබඳු ද?
- ජන මාධ්‍ය මගින් රටේ සාමය සංවර්ධනය පවත්වා ගැනීමට උදව් දෙන වැඩසටහන් මොනවා ද?

**නිපුණතාව 5.0** ජන මාධ්‍යයේ විවිධ ආකාරයේ නියෝජනයන්හි යථාර්ථය හා සමාජීය බලපෑම අර්ථකථනය කර ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 5.4** ජන මාධ්‍යයේ විවිධ ආකාරයේ ප්‍රකාශයන් තුළ සෞන්දර්යාත්මක ස්වභාව නියෝජනය වන ආකාරය යථාර්ථවාදී ලෙස අර්ථ දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**


1. ජන මාධ්‍ය මගින් විනෝදාස්වාදය සැපයීම සඳහා ඉදිරිපත් වීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
2. ජන මාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන විනෝදාත්මක වැඩසටහන් වර්ගීකරණය කර දක්වයි.
3. ජන මාධ්‍ය මගින් විනෝදාස්වාදය සැපයීම සඳහා සිදු විය යුතු මෙහෙය පිළිබඳ නිර්ණායක පෙළක් ගොඩනගයි.
4. ජන මාධ්‍ය විනෝදාස්වාදය සැපයීම සිදු කරන ආකාරයේ ගුණාත්මක බව විචාරාත්මක ව සිදු කරයි.
5. රසඥතාව යන්න සරල ව අර්ථ දක්වයි.
6. උසස් රසඥතාවක් පැවතීමේ වැදගත්කම අගය කරයි.
7. තෝරා ගත් ජන මාධ්‍යයක උසස් රසඥතාවයකින් යුතු වැඩසටහනක් තෝරා එහි ගුණාත්මක බව අගය කරයි.
8. උසස් රසඥතාවකින් යුතු වැඩසටහන් ඇසුරට යොමු වෙයි.
9. ජන මාධ්‍ය අතරින් තෝරා ගත් වැඩසටහනක් පිළිබඳ එහි නිර්මාණාත්මක චින්තනය ඇගයීමේ යෙදේ.
10. සමාජ විඥානය යන්න අර්ථ දක්වයි.
11. ජන මාධ්‍යවලින් තෝරා ගත් වැඩසටහන් කීපයක් ඇසුරින් ඒවායෙන් නිරූපණය වන සමාජ විඥානය විචාරාත්මක ව විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- රූපවාහිනී නාලිකා කීපයක විකාශය වන විවිධ වැඩසටහන්වල රූප රාමු කීපයක්, වීඩියෝ දර්ශන එකතුවක් (ටෙලිනාට්‍ය, ගීත, හාස්‍යෝත්පාදන වැඩසටහන්) යොදා ගන්න.
  මෙහි දී වඩාත් ඉහළ රසඥතාවක් සඳහා යොමු වූ වැඩසටහන් හා ඉහළ රසඥතාවයක් සඳහා යොමු වූ වැඩසටහන් ද මිශ්‍ර ලෙස භාවිත කළ හැකිය.
- ඉහත රූප රාමු නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව ලබා දී මෙම වැඩසටහන් අතරින් සිසුන් වඩාත් නැරඹීමට කැමති වැඩසටහන්/ ගීත ලියා දැක්වීමට යොමු කරන්න.

- වැඩි දෙනෙකු අතර ජනප්‍රිය වූ ටෙලි නාට්‍ය, ගීත, විනෝදාත්මක වැඩසටහහන් වර්ගය තේරීමට යොමු කරන්න.
- සිසුන් තෝරා ගත් වැඩසටහනට වඩාත් කැමති වීමට හේතු විමසන්න.
- මෙම වැඩසටහන නැරඹීමට යොමු වන්නේ කවුරුන් ද, ඔවුන් එසේ යොමු වීමට හේතු විමසමින් මූලික සාකච්ඡාවකට යොමු වන්න.
- සිසුන් ඉදිරිපත් කරන හේතු අතරින් ජන මාධ්‍ය මගින් ප්‍රකාශනය වන සෞන්දර්යාත්මක වැඩසටහන් නැරඹීමෙන් මිනිසුන්ට;
    1. විනෝදය ලැබීම
    2. වෙහෙස නිවා ගැනීමට හැකි වීම
    3. රසඥතාව වර්ධනය කර ගැනීමට හැකියාව ලැබීම
    4. සෞන්දර්යාත්මක  චින්තනය අවදි වීම
    5. සමාජ විඥානය පහළ වීම

  ආදි පල ලැබෙන බව මතු කර ගන්න.
- ජන මාධ්‍ය විනෝදාත්මක අවස්ථා සම්පාදනයේ දී කොතෙක් සාර්ථක ව කාර්ය ඉටු කිරීමට සමත් වන්නේ දැයි අධ්‍යයනයට සිසුන් යොමු කළ හැකිය.
  මෙහි දී,
- සිසුන් වෙත කණ්ඩායම් පැවරුම්/ කේවල පැවරුම් ලබා දී විවිධ ජන මාධ්‍ය මගින් විනෝදාස්වාදය සැපයීම සඳහා ඉදිරිපත් කෙරෙන ප්‍රකාශන සොයා බැලීමට යොමු කරන්න. සිසුන්ගේ අනාවරණ උචිත සැලසුම් මගින් ප්‍රදර්ශනයට යොමු කරන්න.
- ඒ සඳහා ගැලීම් සටහන් ගොඩ නැගීම/ වර්ගීකරණ සැලසුම් ගොඩනැගීම ලෙස උචිත ක්‍රම ශිල්ප භාවිතයට ගත හැකිය.




- පුවත්පත්, ගුවන්විදුලි නාලිකා පිළිබඳ තොරතුරු ගවේෂණය සඳහා ද මෙලෙස ම යොමු කළ හැකිය.
- මේ වැඩසටහන් අතුරින් වඩාත් ජනප්‍රිය වැඩසටහන් තේරීම සඳහා මූලික සමීක්ෂණයක් සිදු කිරීමට සිසුන් යොමු කරන්න.

- එක් එක් වැඩසටහන් වර්ගයට වඩා රුචියක් දැක්වෙන්නේ කවර පුද්ගලයින් ද කුමන හේතූන් මත ද යන්න පිළිබඳ ව ද සමීක්ෂණයේ යෙදී තොරතුරු අනාවරණය කර ගත හැකි පරිදි දත්ත ලබා ගන්න.
- සිසුන්ගේ සමීක්ෂණ වාර්තා සාකච්ඡාවට බඳුන් කරන්න.
- ජනමාධ්‍ය මගින් පොදු ජනතාව වෙත ද උසස් ලෙස විනෝදාස්වාදය ලබා දීමේ දී සැලකිල්ලට ගත යුතු නිර්ණායක සාකච්ඡා කරන්න.
- ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය උසස් විනෝදාස්වාදයක් සඳහා ජනතාවට අවස්ථා සලසයි/ නැත යන තේමාව ඔස්සේ විවාද කිරීමට සිසුන් යොමු කළ හැකි ය.
- විවිධ වූ නිර්මාණ මගින් ඇති වන රසය විවිධ විය හැකි බවත් එක ම නිර්මාණය තුළ විවිධ රස පැවතිය හැකි බවත් රසය යන්න පුද්ගල බද්ධ වන බවත් පෙන්වා දෙන්න.
- රස පිළිබඳ භරතමුනි පඬිවරයා දක්වා ඇති නව නළු රසයන් මූලික ව හඳුන්වන්න.
- රසඥතාව යන්න අර්ථ දක්වන්න. යම් රසයක් හඳුනා ගැනීමට, විඳීමට ඇති හැකියාව රසඥතාව බව දක්වන්න.
- විවිධ නිර්මාණ සැලකිල්ලට ගත් විට උසස් රසඥතාව සඳහා නිර්මාණ, මෙන් ම පහත් රසඥතාව සඳහා සිදු කෙරෙන නිර්මාණ පවතින බව පෙන්වා දෙමින් සමාජයේ උසස් රසඥතාව සහිත පුද්ගලයින් සිටීමේ අගය සාකච්ඡා කරන්න.
- ජනමාධ්‍ය මගින් ඉදිරිපත් වන නිර්මාණාත්මක වැඩසටහන් කොතෙක් දුරට උසස් රසඥතාව සඳහා යොමු වූ නිර්මාණ ද යන්න විමසා බලන බුද්ධි කලම්බන සාකච්ඡාවක් සඳහා සිසුන් මෙහෙයවන්න.
- නො එසේ නම් විද්වත් පිරිස් සහභාගි කරවා ගත් බුද්ධි මණ්ඩල සාකච්ඡා දේශන මගින් මේ පිළිබඳ සිසු අවබෝධය පුළුල් කරවන්නට කටයුතු සලසන්න.
- උසස් රසඥතාවයකින් යුතු නිර්මාණ ඇසුරු කිරීම සඳහා සිසුන් වෙත මග පෙන්වන්න. මේ සඳහා,

  උසස් මට්ටමේ ගීත, ප්‍රබුද්ධ ගීත ශ්‍රවණයට යොමු කිරීම.

  උසස් රසඥතාවක් සහිත ටෙලි නාට්‍යයක් නරඹා එහි සාර්ථකත්වය වරින් වර ඇගයීමට ලක් කිරීම කළ හැකි ය.
- ජනමාධ්‍ය මගින් පොදු ජනයාගේ උසස් රසඥතාව අවදි වන සේ නිර්මාණ ඉදිරිපත් කිරීම කොතෙක් සාර්ථක ව සිදු කෙරේ ද යන්න පිළිබඳ අධ්‍යයනය සඳහා සිසුන්ට මග පෙන්වන්න.

  මේ සඳහා ද විද්වත් දේශන/ සාකච්ඡා යොදා ගැනීම ද කළ හැකි ය.
- යම් නිර්මාණාත්මක කාර්යයක් සඳහා නිර්මාණාත්මක චින්තනය හසුරුවා ගත යුත්තේ කෙසේ දැයි සිසුන් හා සාකච්ඡා කරන්න.

  මේ සඳහා,

  ජී.බී. සේනානායකයන්ගේ 'සාහිත්‍ය නිර්මාණයේ මුල්පොත' කෘතිය කියවන්න.
- සාර්ථක නිර්මාණයක් සිදු කිරීමේ දී සැලකිය යුතු කරුණු අධ්‍යයනයට සිසුන්ට අවස්ථා සලසන්න.

  උදා: - අත්දැකීම් තෝරා ගැනීම - චරිත/ සිද්ධි/ අවස්ථා නිරූපණය
  - විශ්වාසනීය බව රැකීම - සම්ප්‍රදායන්/ සම්මතයන් අගය කිරීම
  - අන්‍යයන් වෙත පහසුවෙන් ළඟා විය හැකි බව (අන්‍යයන් ග්‍රහණය කර ගත හැකි බව)

- ජනමාධ්‍ය අතරින් තෝරා ගත් වැඩසටහනක නිර්මාණාත්මක චින්තනය ඇගයීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- නිර්මාණයක ඉහළ ගුණාත්මක බව සඳහා නිර්මාණයේ සෞන්දර්යාත්මක බව/ සමාජ විඥානය හේතු වන බව පෙන්වා දෙන්න.
  මෙහි දී,
  සමාජ විඥානය යන්න සරල ව අර්ථ දක්වන්න.
- සමාජයේ බොහෝ කල් ජීවත් වීමෙන් ලද සමාජ පරිඥානය, සමාජ විඥානය වේ.
- සමාජයක පවතින විවිධ බැඳීම් සම්මත ඇදහිලි පුද පූජා විධි, සිරිත් විරිත් ඇතුළත් සංස්කෘතිය, නීතිය, කලාව, දේශපාලනය ආදි සමාජයක විවිධ පැතිකඩ පිළිබඳ ලබන පුළුල් දැනුම අනුව සමාජ විඥානය පහළ වේ.
- ජනමාධ්‍ය මගින් ප්‍රකාශනය වන වැඩසටහන් කොතෙක් දුරට සමාජ විඥානය පුළුල් කෙරේද යන්න පිළිබඳ අධ්‍යයනයට සිසුන්ට මග පෙන්වන්න.
  මෙහි දී,
  සමාජයේ විවිධ පැතිකඩ නියෝජනය වන පරිදි වැඩසටහන් නිෂ්පාදනය කොතෙක් දුරට සිදු වේ ද?

## මූලික වදන්

- රසඥතාව - Appriciation
- නිර්මාණාත්මක චින්තනය - Creative Thinking
- සමාජ විඥානය - Social Consiquancess

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන විනෝදාත්මක වැඩසටහන් වර්ග කර දැක්වීම.
- ජනමාධ්‍ය මගින් විනෝදාස්වාදය සැපයීම සඳහා දායක විය යුතු ආකාරය පිළිබඳ නිර්ණායක ඉදිරිපත් කිරීම.
- තෝරාගත් ජනමාධ්‍ය මගින් විනෝදාස්වාදය සැපයීම සඳහා සිදුවන මෙහෙය විචාරය.
- රසඥතාව යන්න අර්ථ දැක්වීම, උසස් රසඥතාවකින් යුතු වැඩසටහනක පැවතිය යුතු ලක්ෂණ හැඳින්වීම.
- ජනමාධ්‍ය මගින් ප්‍රකාශයට පත් වන වැඩසටහන්වල නිර්මාණාත්මක ගුණය ඇගයීම.
- ජනමාධ්‍ය ආයතනවලින් ඉදිරිපත් කෙරෙන වැඩසටහන් මගින් සමාජ විඥානය ගොඩනැගෙන ආකාරය විවේචනාත්මක ව විග්‍රහ කිරීම.

**නිපුණතාව 6.0** නිශ්චල කැමරාවේ තාක්ෂණය නිවැරදි ව භාවිත කරමින්, නිර්මාණශීලී ව සාර්ථක ව නිශ්චල ඡායාරූප නිර්මාණය කිරීමේ නිපුණතාවක් ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 6.1** විවිධ අරමුණු ඉටු කර ගැනීම සඳහා සන්නිවේදන මාධ්‍ය ක්ෂේත්‍රයේ හා සමාජයේ නිශ්චල ඡායාරූප භාවිත කරන ආකාරය හා ඒ ඒ ඡායාරූපවල විශේෂතා සංසන්දනාත්මක ව විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

## ඉගෙනුම් පල

1. නිශ්චල ඡායාරූප ශිල්පීය දක්ෂතා කවරේ දැයි සරල ව හඳුන්වයි.
2. අවාචික සන්නිවේදන මාධ්‍යයක් ලෙස නිශ්චල ඡායාරූප භාවිතයේ වැදගත්කම අගය කරයි.
3. පෞද්ගලික සිහිවටන වශයෙන් නිශ්චල ඡායාරූප භාවිතයෙහි වැදගත්කම විස්තර කරයි.
4. මුද්‍රිත මාධ්‍ය සඳහා නිශ්චල ඡායාරූප භාවිතයට ගන්නා ආකාරය විස්තර කරයි.
5. සිනමා හා රූපවාහිනී මාධ්‍යයෙහි භාවිතය සඳහා නිශ්චල ඡායාරූප භාවිතයේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
6. නිශ්චල ඡායාරූපවල විශේෂතා හඳුනා ගනී.

## පාඩම සැලසුම සඳහා උපදෙස්

- සිහිවටන ලෙස ලබා ගත් ආකර්ෂණීය නිශ්චල ඡායාරූප කීපයක් සිසු අවධානයට යොමු කරන්න, නැතහොත්
  පුවත්පත්වල පල වූ ආකර්ෂණීය නිශ්චල ඡායාරූප කීපයක් සිසුන් වෙත ඉදිරිපත් කරන්න.
  ඉහත ඡායාරූප ඇසුරෙන් අවාචික සන්නිවේදන මාධ්‍යයක් ලෙස නිශ්චල ඡායාරූප ශිල්පයේ වැදගත්කම සිසුන් හා සාකච්ඡා කරන්න.
- එදිනෙදා ජීවිතයේ දී නිශ්චල ඡායාරූප දක්නට ලැබෙන විවිධ අවස්ථා සිසුන්ගෙන් විමසන්න.
- ඒවා ප්‍රදර්ශන පුවරුවක ලියා දක්වන්න.
- සාර්ථක ඡායාරූප කීපයක් නැවතත් සිසුන් වෙත ඉදිරිපත් කර එහි සාර්ථකත්වයට හේතු සාකච්ඡා කරන්න.
  එහි දී,
  1. කැමරාව භාවිත කර ඇති ආකාරය

2. දර්ශන තලය රාමුගත කර ඇති ආකාරය
3. ආලෝකය මෙහෙයවා ඇති ආකාරය
4. රූපගත කළ නිමේෂය
5. ඡායාරූප ශිල්පියාගේ දක්ෂතාව

- නිශ්චල ඡායාරූප භාවිතයේ අගය සිසුන් හා සාකච්ඡා කරන්න.
  මෙහි දී,
  නිශ්චල ඡායාරූපයක ප්‍රකාශිත අදහස නිශ්චිත බව
  පෞද්ගලික සිහිවටන ලෙස විවිධ අවස්ථා ඡායාරූප ගත කර ගැනීම සිදුවන බව
  පෞද්ගලික සිහිවටන ලෙස යථාර්ථය ප්‍රකාශ කිරීම ප්‍රබල ව සිදු වන බව
  ජාතික වශයෙන් වැදගත් වන අවස්ථා ඡායාරූප ගත කර තබා ගත හැකි බව
  නරඹන්නාට අභිමත කාලයක් පුරා නැරඹීමේ හැකියාව ඇති බව
  ඡායාරූප ඇසුරු කොට ගෙන තවත් චිත්ත රූප මවා ගත හැකි බව
  පෞද්ගලික සිහිවටන වශයෙන් ගනු ලබන ඡායාරූප පවා පසු කලෙක විශාල ආර්ථිකමය වටිනාකමක් අත් කර දිය හැකි බව නිදර්ශන සහිතව විමසන්න.
- මුද්‍රිත මාධ්‍යයෙහි නිශ්චල ඡායාරූප භාවිතය සිදුවන ආකාරය සොයා බැලීමට සිසුන් මෙහෙයවන්න.
  උදා: පුවත්පත්වල ඇති විවිධ ඡායාරූප රැස්කරගෙන ඒමට කල් තබා උපදෙස් දෙන්න.
- එම ඡායාරූප විවිධ ලෙස වර්ග කර දැක්වීමට උපදෙස් ලබා දෙන්න.
  උදා: වර්ණ, කලු සුදු
  සිරස්, තිරස්, සමචතුරස්‍රාකාර
  පුද්ගල මූලික, සිද්ධි මූලික, පරිසර මූලික
  වාර්තාමය, වින්දනාත්මක
  ගෘහස්ථ, එළිමහන්
  දිවා, රාත්‍රී
  සමීප රූප, දුරරූප

- මුද්‍රිත මාධ්‍යයෙහි ඡායාරූප භාවිතය පිළිබඳ පහත අදහස් ද තහවුරු කර පෙන්වන්න.
  - මුද්‍රිත මාධ්‍යයෙහි ඡායාරූප පළ කිරීම, ඡායාරූප පුවත්පත් කලාව ලෙස (Photo-journalism) හැඳින්වෙන ප්‍රබල වෘත්තීය මට්ටමේ භාවිතයක් බව
  - ප්‍රවෘත්ති, විශේෂාංග, දැන්වීම් සඳහා නිශ්චල ඡායාරූප විශාල ප්‍රමාණයක් භාවිත වන බව
  - ප්‍රවෘත්ති ආශ්‍රිත ව ගනු ලබන නිශ්චල ඡායාරූප බොහෝ විට එතරම් නිර්මාණාත්මක ලක්ෂණ නො පෙන්වන බව.
  - එහි ප්‍රකාශනය මිස වින්දනය ප්‍රබල නො වන බව
  - මුද්‍රිත මාධ්‍ය සඳහා නිශ්චල ඡායාරූප අත්‍යවශ්‍ය බව

- සිනමා හා රූපවාහිනී මාධ්‍යයෙහි නිශ්චල ඡායාරූප භාවිතයේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.
  දර්ශනතල තෝරා ගැනීම සඳහා
  උදා: රූගත කිරීම්වල අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා
  ප්‍රචාරක කටයුතු සඳහා
  ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ පෞද්ගලික අවශ්‍යතා සඳහා
  අධ්‍යයන කාර්යයන් සඳහා

- නිශ්චල ඡායාරූපවල විශේෂතා හඳුන්වා දෙන්න.
  මෙහි දී පහත කරුණු කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරවන්න.
  - නිශ්චල ඡායාරූපවල ඇතුළත් වන්නේ යම් මොහොතක් බව
  - නිශ්චල ඡායාරූපය මගින් යම් භෞතික අරමුණක් යථාර්ථවත් ලෙස හෝ නිර්මාණාත්මක ලෙස දැක්විය හැකි බව.
  - ආලෝකය හා අඳුර භාවිත කරන ආකාරය අනුව නිශ්චල ඡායාරූපයක ස්වභාවය වෙනස් වන බව
  - භාවිත කරන කැමරාවේ තාක්ෂණය අනුව ඡායාරූපයේ ගුණාත්මක භාවය වෙනස් වන බව.

## මූලික වදන්

- නිශ්චල ඡායාරූපකරණය Still Photographiy
- ඡායාරූප පුවත්පත් කලාව Photojournalism
- දර්ශනතලය Location
- ආලෝකකරණය Lighting

## ගුණාත්මක යෙදවුම්

- නිශ්චල ඡායාරූප කිහිපයක්
- වර්ණ ඡායාරූප
- පුවත්පත් ඡායාරූප
- කැමරා වර්ග
- කළු සුදු ඡායාරූප
- සිහිවටන ලෙස ලබාගත් ඡායාරූප
- වෙනත් මුද්‍රිත මාධ්‍ය ඡායාරූප
- සේයාපට/ මතකපත්
- කැමරාවේ ක්‍රියාවලිය අධ්‍යයනය සඳහා ඉගෙනුම් ආධාරක

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- නිශ්චල ඡායාරූප හැඳින්වීම.
- සිහිවටන ලෙස නිශ්චල ඡායාරූප ලබා ගැනීමේ ක්‍රියාවලිය.
- මුද්‍රිත මාධ්‍ය සඳහා නිශ්චල ඡායාරූප භාවිත වන ආකාරය.
- සිනමා හා රූපවාහිනී මාධ්‍ය සඳහා නිශ්චල ඡායාරූප භාවිතයේ අවශ්‍යතාව.
- නිශ්චල ඡායාරූපවල විශේෂතා.

**නිපුණතාව 6.0** නිශ්චල කැමරාවේ තාක්ෂණය නිවැරදි ව භාවිත කරමින්, නිර්මාණශීලී ව සාර්ථක ව නිශ්චල ඡායාරූප නිර්මාණය කිරීමේ නිපුණතාවක් ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 6.2** නිශ්චල ඡායාරූප ශිල්පයේ සරල තාක්ෂණික නිපුණතා ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 04

**ඉගෙනුම් පල**

1. නිශ්චල කැමරාවේ තාක්ෂණික ක්‍රියාවලිය විස්තර කරයි.
2. දළ සේයා පටලයක් පරීක්ෂා කර එහි ස්වභාවය හඳුනා ගනියි.
3. ඩිජිටල් දත්ත ගබඩාකරණ මතක පතක් පරීක්ෂා කර එහි ස්වභාවය හඳුනා ගනී.
4. ඩිජිටල් තාක්ෂණයේ විශේෂතා පැහැදිලි කරයි.
5. ඡායාරූපයක් හා විනිවිදකයක වෙනස පහදයි.
6. සරල අංකිත කැමරාවක් මගින් නිවැරදි ලෙස නිශ්චල ඡායාරූප ලබා ගනී.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

- විවිධ ලෙස ලබාගන්නා ලද සාර්ථක, අසාර්ථක නිශ්චල ඡායාරූප කීපයක් දැක ගැනීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.
- ඡායාරූපවල නිමාව නිර්මාණාත්මක බව පිළිබඳ සිසුන් හා සුහද කථාබහක යෙදෙන්න.
- සාර්ථක ඡායාරූපයක් පිළිබඳ අවබෝධය ලබා ගැනීමට හැකි වන පරිදි දැනුම්වත් කිරීමේ කාර්යයට යොමු වන්න.
  ඒ සඳහා,
  ඡායාරූපකරණය පිළිබඳ දිනක වැඩමුළුවක් යොදා ගනිමින් පහත අත්දැකීම් ලැබීමට අවස්ථා සැලසීම වඩා උචිත වේ.
  1. කැමරාකරණය පිළිබඳ මනා න්‍යායාත්මක අවබෝධයක් ඇති ශිල්පියකු/ දේශකයකු ලවා කැමරාවේ ක්‍රියාවලිය පහදා දෙන්න.
  2. දළ සේයා පටල හා ඩිජිටල් දත්තකරණය සිදු කරනු ලබන අයුරු විස්තර කර දෙන්න.
  3. අංකිත ඡායාරූප ශිල්පීය තාක්ෂණයයේ මූලධර්මය පැහැදිලි කර දෙන්න.
  4. පරිගණකය සහ අංකිත කැමරාව අතර ඇති සම්බන්ධතාව සැකෙවින් පහදා දෙන්න.
  5. රූපගත කළ ඡායාරූප පරිගණකයට ඇතුළත් කිරීම සහ පරිගණක තිරය මත නැරඹීමට අවස්ථාව සලස්වා දෙන්න.

- සංක්ෂිප්ත අංකිත කැමරාවක් හෝ සපයා ගත හැකි වෙනත් කුමන හෝ කැමරාවක් භාවිතයෙන් රූපගත කිරීමේ ප්‍රායෝගික අභ්‍යාසයක සිසුන් නිරත කරවන්න.

## මූලික වදන්

- නිශ්චල කැමරාව Still Camera
- සේයාපටය Film Role
- මතක පත Memory Card
- සංක්ෂිප්ත කැමරාව Compact Camera

## ගුණාත්මක යෙදවුම්

- නිපුණතාවට අදාළ රූපසටහන්
- ඡායාරූප
- වීඩියෝ දර්ශන
- කැමරා
- සේයාපට
- මතක පත්

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- නිශ්චල කැමරාවේ සරල ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය
- දළ සේයාපටයක ස්වභාවය හඳුනා ගැනීමේ හැකියාව
- ඩිජිටල් දත්ත ගබඩා කර ඇති ආකාරය පිළිබඳ අවබෝධය
- අංකිත කැමරාවක් මගින් නිවැරදි ලෙස නිශ්චල ඡායාරූප ගැනීමේ හැකියාව.

**නිපුණතාව 6.0** නිශ්චල කැමරාවේ තාක්ෂණය නිවැරදි ව භාවිත කරමින්, නිර්මාණශීලී ව සාර්ථක ව නිශ්චල ඡායාරූප නිර්මාණය කිරීමේ නිපුණතාවක් ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 6.3** තාක්ෂණය නිවැරදි ලෙස භාවිත කරමින්, නිර්මාණශීලී ව හා සාර්ථක ව නිශ්චල ඡායාරූප ගැනීමේ හැකියාව පෙන්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 04

**ඉගෙනුම් පල**

1. කැමරාවේ අංගෝපාංගවල කාර්යභාරය වෙන් වෙන් ව විස්තර කරයි.
2. ඡායාරූපයක් ගැනීම සඳහා කැමරාව යෝග්‍ය දෘෂ්ටිකෝණයක රඳවයි.
3. ඡායාරූපයක් සඳහා සාර්ථක ව ආලෝකය මෙහෙයවයි.
4. නිවැරදි තාක්ෂණික ක්‍රම ශිල්ප අනුගමනය කරමින් රූපගත කිරීමේ නියැලේ.
5. වඩා උසස් ප්‍රකාශනයකින් යුතු ඡායාරූප සම්පාදනය කරයි.

**පාඩම සංවර්ධනය සඳහා උපදෙස්**

- මෙම කොටස ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් සිදු කළ යුතුයි.
- ඉහත ඉගෙනුම් ඵල සපුරා ගත හැකි පරිදි උචිත අයුරින් වැඩමුළුවක් සැලසුම් කර ගැනීම
  උචිත ය. එහි දී, උචිත සම්පත් දායක සේවය ලබා ගනිමින් කේවල/ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් ඉගෙනුම් අත්දැකීම් ලැබීමට සැලසිය හැකිය. මෙහි දී,
  1. ප්‍රකාශනාත්මක වටිනාකම් සහිත ජීවී/ අජීවී අරමුණු හඳුනා ගැනීම.
  2. දර්ශන තලයක සුදුසු පරිදි අරමුණු රැඳවීම.
  3. උචිත කැමරා කෝණ තෝරා ගැනීම.
  4. සුදුසු පරිදි ආලෝකය මෙහෙයවීම.
  5. කැමරාවේ තාක්ෂණික කාර්යයන් නියමිත පරිදි ඉටු කරලීම.
  6. රූපගත කළ ඡායාරූප පරිගණකය වෙත සුරක්ෂිතව යොමු කිරීම.

  යන කාර්යයන් ආවරණය කළ යුතු වේ.
- ප්‍රකාශනාත්මක වශයෙන් සාර්ථක යැයි සැලකෙන ඡායාරූපයක මූලික ලක්ෂණ සිසුන්ට හඳුන්වා දෙන්න.
  මෙහි දී,
  ඡායාරූපයේ තීක්ෂණතාව
  ආලෝකය හා අඳුර අතර පරතරය
  ක්ෂේත්‍ර ගැඹුර
  කැමරා කෝණය යන සාධකවල බලපෑම නිදර්ශන ඇසුරින් පැහැදිලි කරන්න.

## මූලික වදන්

- දර්ශනතලය Location
- මානනය Aiming
- නාභිගත කිරීම Focusing
- අනාවරණය Exposure
- ද්වාරය Shutter
- කාච විවරය Apeture
- රූප රාමුව Frame
- කැමරා කෝණය Camera angle
- ක්ෂේත්‍ර ගැඹුර Depth of field
- ශ්‍රමායික Manual

## ගුණාත්මක යෙදවුම්

- ශ්‍රමායික (Manual) කැමරා
- සංක්ෂිප්ත අංකිත කැමරා
- කැමරාවේ අංගෝපාංගවල රූපසටහන්
- ප්‍රායෝගික ක්‍රියාකාරකම අනුව අවශ්‍ය වන වෙනත් ගුණාත්මක යෙදවුම්

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- කැමරාවේ අංගෝපාංග හැඳිනීම.
- ඡායාරූප ගැනීම සඳහා උචිත පරිදි ආලෝකය මෙහෙයවීමේ හැකියාව.
- ඡායාරූප සඳහා කැමරාව නිවැරදි දෘෂ්ටිකෝණයක රැඳවීමට අවශ්‍ය මූලධර්ම පිළිබඳ දැනීම.
- ඡායාරූපයක් ගැනීමේ දී අනුගමනය කළ යුතු නිවැරදි තාක්ෂණ ක්‍රම ශිල්ප පිළිබඳ අවබෝධය.
- නිවැරදි තාක්ෂණික ක්‍රම ශිල්ප භාවිතයෙන් ඡායාරූප ගැනීමේ කුසලතාව ඇගයීම.

**නිපුණතාව 6.0** නිශ්චල කැමරාවේ තාක්ෂණය නිවැරදි ව භාවිත කරමින්, සාර්ථක ව නිශ්චල ඡායාරූප නිර්මාණය කිරීමේ නිපුණතාවක් ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 6.4** නිශ්චල ඡායාරූපකරණයේ නිර්මාණාත්මක ක්‍රම-විධි අත්හදා බලමින් වාර්තාමය, නිර්මාණාත්මක යන අංශ ද්වයෙහි කුසලතා ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

## ඉගෙනුම් පල

1. වාර්තාමය ඡායාරූපයක ලක්ෂණ පෙන්වා දෙයි.
2. නිර්මාණාත්මක ඡායාරූපයක් හා වාර්තාමය ඡායාරූපයක වෙනස සසඳයි.
3. වාර්තාමය, නිර්මාණාත්මක ඡායාරූපවල ව්‍යවහාරික අගය පැහැදිලි කරයි.
4. විවිධ නිර්මාණාත්මක ඡායාරූප එක්රැස් කරයි.
6. වාර්තාමය, නිර්මාණාත්මක ඡායාරූපකරණයේ නියැලේ.
7. වාර්තාමය, නිර්මාණාත්මක ඡායාරූප ඒකරාශී කර ප්‍රදර්ශනය කරයි.

## පාඩම සංවර්ධනය සඳහා උපදෙස්

- නිර්මාණාත්මක හා වාර්තා ඡායාරූප එකතුවක් සිසුන් වෙත ඉදිරිපත් කොට/ වීඩියෝ දර්ශන මගින් නිරීක්ෂණයට අවස්ථාව සලසා පාඩමට පිවිසෙන්න.
- ඉහත අංශ දෙක යටතේ ම වන ඡායාරූපවල අවශ්‍යතාව සාකච්ඡා කරන්න.

  උදා: සිහිවටනයක් ලෙස තබා ගැනීම  
  තොරතුරු වාර්තාකරණය  
  සාක්ෂි ඉදිරිපත් කිරීම  
  වින්දනීය බව  
  නිර්මාණාත්මක හැකියා ප්‍රදර්ශනය
- නිර්මාණාත්මක ඡායාරූප මෙන් ම වාර්තාමය ඡායාරූප ද පවතින බව පෙන්වා දෙමින් මෙම ඡායාරූප වර්ග දෙක අතර වෙනස සංසන්දනය සඳහා යොමු කරන්න.
- වාර්තාමය ඡායාරූපයක් හා නිර්මාණාත්මක ඡායාරූපයක පිළිබඳ සංසන්දනාත්මක ව තොරතුරු ඇතුළත් වගුවක් පිළියෙල කිරීමට සිසුන් යොමු කරන්න.
- සිසුන් කණ්ඩායම් ඉගෙනුමට යොමු කර පහත ඉගෙනුම් කාර්යය සඳහා නිරත කරවන්න.
  - නිර්මාණාත්මක ඡායාරූපයක අගය පිළිබඳ කෙටි විස්තරයක් සැපයීමට සිසුන් යොමු කරන්න.

- නිර්මාණාත්මක ඡායාරූපකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු ගවේෂණයට යොමු කරන්න.
- සිසුන් කණ්ඩායම එක්ව වාර්තාමය ඡායාරූප, නිර්මාණාත්මක ඡායාරූප එකතුවක් සැකසීමට යොමු කරන්න.
- ඉහත කාණ්ඩ දෙකට අයත් ඡායාරූප ගැනීමේ කාර්යයට සිසුන් යොමු කරන්න.
  මෙහි දී,
  ඉහත වර්ග දෙකට අයත් ඡායාරූප කිහිපයක
  රූගත කිරීමේ අරමුණ/ අරමුණු
- අවසානයේ ඡායාරූප එකතුව ප්‍රදර්ශනයකින් අන් අය වෙත පිළිගන්වන්න.

## මූලික වදන්

- ඡායාරූප ප්‍රදර්ශනය Photographic exibition
- වාර්තා ඡායාරූප Documentary photos
- නිර්මාණාත්මක ඡායාරූප Creative photos

## ගුණාත්මක යෙදවුම්

- වාර්තාමය ඡායාරූප
- නිර්මාණාත්මක ඡායාරූප
- බිත්ති පුවත්පත්

## ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

- වාර්තාමය ඡායාරූපයක හා නිර්මාණාත්මක ඡායාරූපයක වෙනස සන්සන්දනය
- වාර්තාමය, නිර්මාණාත්මක ඡායාරූපකරණයේ අගය පෙන්වා දීම.
- නිර්මාණාත්මක ඡායාරූපකරණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු.
- නිර්මාණාත්මක හා වර්තාමය ඡායාරූප ප්‍රදර්ශනය ඇගයීම.

## ගුරු මාර්ගෝපදේශය සම්පාදනය සඳහා විවිධ සහය

**පරිගණක වදන් සැකසුම :**

ප්‍රියංවදා සමරසිංහ මෙනවිය, ජාතික අධ්‍යාපන ආයතනය

**පිටකවරය නිර්මාණය :**

සංජය මොහොට්ටි මයා, ජාතික අධ්‍යාපන ආයතනය

**විවිධ සහය :**

එස්. අලහකෝන් මයා, ජාතික අධ්‍යාපන ආයතනය
ආරියතිලක ප්‍රනාන්දු මයා, ජාතික අධ්‍යාපන ආයතනය